# ස ඟ ස ර ණ

අන්‍යතර ග්‍රන්ථකර්තෘවරයෙකු

විසින්

සම්පාදිත යි.

---

වලිවිටියේ පණ්ඩිත සෝරත

නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ

උපදේශ අනුව

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේ උපාචාර්ය

ගලගම පණ්ඩිත ශරණඞ්කර

ස්ථවිර පාදයන් වහන්සේ

විසින්

ශුද්ධ කර ලියූ

## ග්‍රන්ථිපදවිවරණයෙන් යුක්ත යි.

---

රත්නාකර පොත් වෙළෙඳ ශාලාව

මගින්

සීමාසහිත රත්නාකරයන්ත්‍රාලයයෙහි

මුද්‍රාපිත යි.

---

බු: ව: 2498

ක්‍රි: ව: 1954

# සංඥාපනය

බුද්ධගුණවර්ණනාමුඛයෙන් කරණ ලද, "බුත්සරණ යා යුතු" යනුවෙණ් එක් එක් අංශයක් අවසන් කරන්නා වූ විද්‍යාචක්‍රවර්ත්තීන්ගේ අමෘතාවහය "බුත්සරණ" ය යි ප්‍රසිද්ධ වූවාක් මෙන් සඟගුණ වැණුම නිමිති කොට කරණ ලද මේ ග්‍රන්ථය 'සඟසරණ'' යන නාමයෙන් ම ප්‍රසිද්ධ ය.

මෙහි කතෘ වනාහි උපමාකථනයෙහි මහාකවි කාලිදාසයන්ගේ කීර්තිය ද පසු බැස්වූ විද්‍යාචක්‍රවර්තීමහාකවිවරයා ම ය යි සමහරු සලකති.

සඟසරණ පොත පරීක්ෂාවෙන් කියවන්නෙකුට එහි ශක්ති වයයක් පිළිබිඹු ව පවත්නා බව පෙණී ය යි. සඟසරණෙහි මූල පටන් සැරියුත් තෙරුන්ගේ කථාව තෙක් වූ භාගය එක් ශක්තියක පිළිබිඹුවකි. එතැන පටන් අවසන තෙක් ඇති භාගයෙන් පෙණෙන්නේ එයින් අන්‍ය වූ ශක්තියකි. ඒ මූල භාගයෙන් ප්‍රකට වන්නේ බෙහෙවින් දියුණු වූ ප්‍රතිභානශක්තියකි. දෙවැන්නෙන් කතෘහුගේ ස්වල්ප වූ ද ප්‍රතිභානයක් නො පෙණේ.

ඒ දෙවැනි භාගයෙහි ඇතුළත් වන්නේ අටුවා පොත්වල පෙළ බසින් ලියූ ඇතැම් කථාවන්ගේ සිංහලපරිවර්තන ය ඒ පරිවර්තන ද මුළුමනින් නිවරද ය යි කීමට ඉඩක් නො මැති යි.

මේ කරුණ නිසා මේ සඟසරණ පොත එක ම කතෘවරයෙකු ගේ නො ව කතෘවරයන් දෙදෙනෙකුන්ගේ කෘතියකැ යි කිය යුතු වේ. සඟසරණ විද්‍යාචක්‍රවර්තී මහාකවිවරයාගේ කර්තෘත්වයට පවරා දීම එතුමාට කරණු ලබන නිඳාවකි.

වැලිවිටියේ සෝරත නායක හාමුදුරුවන් වහන්සේ විසින් බුත්සරණට මැත දී ලියූ සංඥාපනයෙන් කොටසක් අපේ මේ කථාවට සාක්ෂියක් වශයෙන් මෙහි දක්වමු: ඒ මෙසේ යි:–

> "දහම්සරණ හා සඟසරණ ද විද්‍යාචක්‍රවර්තීන්ගේ ම කෘති ය යි සමහරු කියති. හේතුව ලෙස දක්වන්නේ දහම්සරණෙහි එන 'සත්රුවන් පුරා ගිය බව ම: රත්නත්‍රය සරණ ගියවුන්ට සියලු දුක් දුරු වෙයි කියා මා කියන්නා වූ තෙසරණගුණයට ම දෙසැ' යන පාඨ ය යි. මෙ

පාඨයෙන් බුත්සරණ ආදි පොත් ද දහම්සරණ කතුවරයා විසින් ම කළබවක් නො හැඟේ. දහම්සරණ ගුණ කියන විට බුත්සරණ – සඟසරණ ගුණ ද ඉබේ ම කියවේ. එහෙයින් දහම්සරණ කතුවරයා 'මා කියන්නා වූ තෙසරණ ගුණ' යි යෙදීම යුතු ම ය. එයින් ඔහු විසින් බුත්සරණ සඟසරණ යන පොත් ද ලියූ යේ නිශ්චය කිරීම යුතු නො වේ.

“අප කියන්නේ මේ පොත් තුණ කාල තුණකට අයත් තුන් දෙනෙකුන්ගේ කෘතිය යන බව යි. මේ පොත් තුණෙන් ප්‍රකාශ වන ප්‍රතිභානය හා වර්ණනා විලාස යත් වාක්‍යරචනා රීතිය හා ශබ්දප්‍රයොගයත් හාත්පසින් ම එකිනෙකට වෙනස් ය.

“බුත්සරණින් ප්‍රකාශ වන අත්දමේ ශ්‍රෙෂ්ඨ ප්‍රතිභාන යක් දහම්සරණින් ප්‍රකාශ නො වේ. සඟසරණින් ප්‍රකාශ වන විශෙෂ ප්‍රතිභානයක් නැත්තේ ය. බුත්සරණෙහි පෙණෙන වර්ණනාවන් තරම් දහම්සරණෙහි වර්ණනා ස්වාභාවික ද නිරුත්සාහකෘත ද චමත්කාරජනක ද නො වේ. දහම්සරණකාරයන් නොයෙක් විට බුත්සරණ අනුගමනය කරන්ට උත්සාහ කළ බව පෙණෙන නමුත් ඒ උත්සාහ එතරම් සාර්ථක වූ බවක් නො පෙණේ. දහම් සරණෙහි මූල කොටස කාදම්බරී ආදි සංස්කෘතගද්‍ය කාව්‍යයන්හි පෙණෙන දීර්ඝසමාසපදයන් වැනි සංස්කෘත සමාසපදබහුලභාෂාවෙන් රචිත ය. විද්‍යාචක්‍රවර්තීහු එබඳු භාෂාවට රුචි නො කළහ. දහම්සරණෙහි අග කොටස සාමාන්‍ය සිංහල භාෂාවෙන් රචිත නමුත් ඒ භාෂාව බුත්සරණෙහි භාෂාව මෙන් ලලිත ද මනොහර ද නො වේ. සඟසරණ මේ හැම කරුණකින් ම දිළිඳු ය.

“බුත්සරණ කරණ ලද්දේ පොළොන්නරු කාලයේ දී නොහොත් ඊට පෙර ය යි මුල දී කීමු. දහම්සරණ කරණ ලද්දේ දඹදෙණි කාලයෙන් පසු ව ය යි කීමට කරුණු තිබේ.

“සද්ධර්මරත්නාවලිය දඹදෙණි කාලයේ කරණ ලද ග්‍රන්ථයකි පුරාණ ග්‍රන්ථකර්තෘවරයන්ගේ නම් දක්වන නිකායසංග්‍රහය සද්ධර්මරත්නාවලිකර්තෘනාමය දක්වන්නේ පූජාවලිකර්තෘනාමයටත් පසු ව ය. සද්ධර්

රත්නාවලිය ධම්මපදට්ඨකථාවේ විස්තෘතපරිවර්තන යෙකි. ධම්මපදට්ඨකථාවේ එන කථාවස්තු සිංහලයට පෙරළන්නෙකු එය බලනු නිසැක ය. දහම්සරණ කර්තෘ ද ධම්මපදට්ඨකථාවෙහි එන කථාවස්තු ලියද්දී සද්ධර්ම රත්නාවලිය බැලූ බව ඔප්පු වන තැන් කීපයක් තිබේ. ඒ දෙ පොතෙහි ම පෙණෙන ඝෝෂකකථාවෙහි භාෂාව සමාන ය.

**“එසේ හෙයින් සත්පුරුෂයන් විසින් අතික් කරණ කුශලයක් නැත ද තුණුරුවන් කෙරෙහි ස්නෙහමාත්‍රයක් උපදවා අසාධාරණ වූ අනුපම වූ දිව්‍යසම්පත් අනුභව කරන්ට උත්සාහ කට යුත්තේ ය’**

යන වාක්‍යය සද්ධර්මරත්නාවලිකාරයන්ට නොයෙක් තැන පුරුදු ලෙසින් ම ඝෝෂක කථාවෙහි ද ලියූවකි. ඊට සමාන පාළිපාඨයක් ධම්මපදට්ඨ කථාවෙහි නො මැති සි. දහම්සරණෙහි 229 වන පිටුවෙහි මේ වාක්‍යය –

> **‘එහෙයින් සත්පුරුෂයන් විසින් ඉතිරි කරණ ලද කුසල් නැත් ද තුණුරුවන්හි ස්නෙහමාත්‍රයක් කොට ද අසාධාරණ වූ අනුපම වූ දිව්‍ය සම්පත් අනුභව කරන්නට උත්සාහ කට යුතු.’**

යන ලෙසින් පෙණේ. දෙකෙහි වෙනස ඉතා ස්වල්පයකි. මෙබඳු තවත් තැන් එහි තිබේ. සද්ධර්මරත්නාවලි කර්තෘපාදයන් තමන්ගේ ප්‍රතිභානයෙන් උපදවා අමුතු දෙය එකතු කරමින් ධම්මපදට්ඨකථාව පරිවර්තනය කරද්දී ඝෝෂකකථාව ලිවීමට දහම්සරණ පෙරළා බැලුව යි සිතීම යුතු නො වේ. ඝෝෂකකථාව අතික් පොතකට ඇතුළත් කරන්නා එය තිබෙන මුල් පොත නොහොත් එහි පරිවර්තනය බැලීම ස්වාභාවික ය. එහෙයින් දහම්සරණ කාරයන් සද්ධර්මරත්නාවලිය බලමින් ම ඝෝෂකකථාව ලියුව යි සිතීම යුතුය.

“මේ කරුණුවලින් තීරණය කට හැක්කේ දහම්සරණ විද්‍යාචක්‍රවර්තීන්ගේ කෘතියක් නො ව සද්ධර්ම රත්නාවලියට ද පසු ව ලියූ පොතක් බව ය.

# පටුන


| විෂය | | | පිටු |
|---|---|---|---|
| සඟගුණ වැණුම | ... | ... | 1-9 |
| සැරියුත් වත | ... | .. | 9-10 |
| බෑණසඞ්ඝරක්ඛිත වත | ... | ... | 10-11 |
| අම්බඛාදකතිස්සතෙර වත | ... | ... | 11 |
| මහාසඞ්ඝරක්ඛිත තෙර වත | ... | ... | 12 |
| අඤ්ඤතර සප්වීර වත | ... | ... | 12-14 |
| මලියදේව වත | ... | ... | 14-15 |
| තිස්සභූති වත | .. | ... | 15-16 |
| මහාසීව තෙර වත | ... | ... | 17-18 |
| මහාතිස්ස තෙර වත | ... | ... | 18-19 |
| දෙමළ දෙරටුපල් වත | ... | ... | 19-20 |
| වාතකාල වත | ... | ... | 21-22 |
| මැදිබෑ තෙරුන් වත | ... | ... | 22 |
| ධොභාතික වත | ... | ... | 22-23 |
| අනුරුත් තෙර වත | ... | ... | 23 |
| සෝණ තෙර වත | ... | ... | 23 |
| දබ්බතෙර වත | ... | ... | 24-25 |
| ගඞ්ගාතීරිය තෙර වත | ... | ... | 25-26 |
| ධම්මදින්න වත | ... | ... | 26-28 |
| ඵුස්සදෙව වත | ... | ... | 28 29 |
| අඤ්ඤතර සප්විර වත | ... | ... | 29-30 |
| බඹුණුවත | .. | .. | 30-31 |
| කුදුතිස් තෙර වත | .. | ... | 31-33 |
| ලදරුභික්ෂු වත | . | ... | 33 |
| සභිය තෙර වත | ... | ... | 34-35 |
| මහාතිස්ස තෙර වත | ... | ... | 35-36 |
| සක්පල් තෙර වත | .. | ... | 36-38 |
| මලියදෙව තෙර වත | ... | ... | 38-39 |
| මහාතිස්සභූති තෙර වත | ... | ... | 39-40 |
| දීඝභාණකඅභය තෙර වත | ... | ... | 40-41 |
| පධානිය තෙර වත | ... | ... | 41 |
| සුවිසිදහස් තෙරුන් වත | ... | ... | 41-42 |
| තිස් දෙනෙකුන්ගේ වත | ... | ... | 42 43 |
| එක්තරා තෙර වත | ... | ... | 44 |
| මහාඵුස්ස තෙර වත | ... | ... | 44 |
| අඤ්ඤතර සප්විර වත | ... | ... | 44-45 |
| මහානාග වත | ... | ... | 45 |
| පංසුකූලික තෙර වත | ... | ... | 45-46 |
| මහානාග තෙර වත | ... | ... | 46-47 |
| රාධ තෙර වත | ... | ... | 47 |

# සඟ සරණ.

## නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

**"සඞ්ඝං සරණං ගච්ඡාමි = සඟ සරණ යෙමි"**

## සඟගුණ වැණුම

1. සිංහතෙල් ඔත් කනකපාත්‍ර සෙයින් ඒ සම්බුදුසිංහරාජයා ගේ සද්ධර්ම නැමැති සිංහතෛලය නො නසා ධරණ සගුරුවන් සරණ යෙමි යි **සඟසරණ** යා යුතු.

2. නිධාන රක්නා ධනසිටියන් සෙයින් ඒ සම්බුදුයන් වහන්සේ වදාළ සද්ධර්මය රක්නට ම නියැලී වසන්නා වූ සගුරුවන් සරණ යෙමි යි **සඟසරණ** යා යුතු.

3. රක්නට බැරි ඇතු පිරිමසා රැකෙන ඇත්ගොව්වන් සෙයින් පුරන්නට නො පිළිවන් වූ පිළිවෙත් ම පුරා වැටෙන්නා වූ සගුරුවන් සරණ යෙමි යි **සඟසරණ** යා යුතු.

4. ගුරුළුබියෙන් ගල් ගැලැ පියා හොත් නාගරාජයන් සෙයින් සසරබියෙන් ඒ මහත්දහම්පිළිවෙත් සිලූ සගුරුවන් සරණ යෙමි යි **සඟසරණ** යා යුතු.

5. තව ද සියලු මනුෂ්‍යයෝ තමන් විසූ ගමින් බැහැර යෙත් නම්, එ ගම්හි රසතෘෂ්ණාව තුබූ සේ නබා ශරීරය මතු ගෙණැ යන්නාහ. මාගේ සවාමිදරුවන්ගේ පුත්‍ර වූ සගුරුවන් වූ නලී එක් තැනෙක්හි වැසැ අනික් තැනකට වඩනා කල්හි පසුපස්සෙහි හඬා එන දූපුතුන් නැති හෙයින්. විරහ ඉවසා ගත නො හී හඬා එන හඹුවන් නැති හෙයින්, හුන් තැනැ කොටු පුරා රැස් කළ විසාල් නැති හෙයින්, ගේ පුරා තුබූ රන්රන් අබරන් නැති හෙයින්, ඇති දෙයක් ඇත, තුන් සිවුරු ය  යනාදීන් තමන් එක ශරීරයෙහි ම රැඳුනු හෙයින් කිසි තැනෙක්හි අපෙක්ෂාවක් නැත්තාහ.

තව ද, ගොදුරුබිමින් ගොදුරු කා යන පක්ෂීහු පොබා 'නැවත මෙතැනට එම්හයි, එ තැනට නැඟී යම්හ'යි තෘෂ්ණාවක් තබා යෙත් ම යැ. මේ සවාමිදරුවානන් වහන්සේගේ පුත් වූ සඟුරුවන් වූ කලී හුත් තැන්හි දූ සිඟා ම ලබන අහරක් බැවින් යන තැන්හි දූ සිඟා ම ලබන අහරක් බැවින්, පාත්‍රයෙහි ලාලූ අහරක් ම සඳුනන බැවින්, ලත් දෙයක් ම මිහිරි වන බැවින්, නො ලත් දෙයෙහි සිතිවිල්ලක් නැති හෙයින්, මල්කුසුම්වනමස්තකයෙහි ගමා යන පවන 'මේ වල හැර කොයට යෙම් ද?' යන ශොකයක් නො කොට යන්නා සේ කිසි තැනෙක්හි ශොකයක් නැත්නාහ.

ප්‍රාප්ත වූ ගොචරයක් ම ගන්නා ඉන්ද්‍රියන් සේ 'දෙව' යන බස් නැති වැ සැදැහැ ඇත්තවුන් දුන්නක් ම පිළිගන්නාහ. දිව්‍යරූපයෙහි උපන්නා වූ චක්ෂුර්විඥානය තමන්ගේ ආයුපමණක් ම සිටැ නිරුද්ධ වන්නා සේ, දෙව්ලෝ වැනි තැනට සිඟා වත් ද, තමන් සිටිනා තෙක් කල් ම සිටැ සිඟන බව මුත්, බුදුන් විසින් නියම කළ කාලය නො ඉක්මවන්නාහ. වත් තැන්හි විහාරයක් ඇත, එහි වසන්නාහ. එ නැත, රුක්මුලෙක්හි වසන්නාහ. හෙ ද නැත. හිස්බිම්හි හිඳිනාහ. තැන්හි තැන්හි මුතුදැල් එල්වූ රන්කම් කළ වියන් බඳ සිරියාන්ගබඩායෙහි වසන රජකුමරුවන් සෙයින් විශුද්ධ වූ සඳරැස් නැමැති මුතුදැල් එල්වූ විසිතුරු වූ තරුවැලයෙන් ම රන්කම් කළ අහස්වියන් බඳ අභ්‍යවකාශයෙහි ම සෙහෙන් වසන්නාහ.

එබැවින් අප වන්නේ ගමකට ය යි සතුටක් නැත්නාහ අප වන්නේ වලකට ය යි රුකැණියක් නැත්නාහ. කාන්තාරයෙහි මිනිසුන් පොලොඹා කනුව යකුන් මැවූ පුරය යක්ෂපුර යකැ යි දන්නාවූ නුවණැ 'තියා' පුරයකට වනිම් යි සතුටු නො වන්නා සේ සත්ත්වයන් බඳනා පිණිස යක්රූ හැර මිනිස්රූ ගන්නා වූ ගැණුන් විසින් ගැවසී ගත් ගම් වැද 'ගමකට වනුම්හ'යි සතුටු බවක් නැත්නාහ. සක්විති වන පිණැති ව මුළු සක්වළ හැර පැවිජ් වැ 'අප හළුයේ මුළු සක්වළෙහි සැපතැ' යි පෙරළා සිහි නො කරණුවාහ. එබැවින් ගමක් හැර ගම කට යන කල්හි 'අප හළ ගම යාපතැ'යි අපෙක්ෂාවක් නො කරන්නාහ. ආඥාසම්පන්නරජහුගේ මෙහෙවර ගොස් 'මේ දවසට එම්' යි අවධි ලියූහු ඒ අවධි නො වරදනා පිණිස දිවනා ගමන්හි අතරමංහි සමෘද්ධ වූ ගම් දුටු ද, එහි 'සැතපෙමි' යන අදහස් නැති වැ මෙහෙවරට ම දිවන්නා සේ, බුදුරජානන් වහන්සේ දුන් <u>කමටහන්</u> ගෙණැ ඒ පිළිවෙත් පුරණුවට විහාරයට ම කල් නො වරදවා ම වඩනා සඟුරුවන්'වත් ගම යහපතැ'යි එහි අපෙක්ෂාවක් නො කරන්නාහ.

කිඹුල්වත්හි නිරපේක්ෂ වැ ගිය පියාණන් වැනි දරුවන් බැවින් බිජුවටක් ඉපිද වැඩී ඒ බිජුවට පැළුනු කල්හි එහි අපේක්ෂා වක් නැති වැ ම පත්සෙහි යන්නා වූ පක්ෂිපෝතකයන් සෙයින් ගම්හි ඉපිද වැඩී එගම්හි අපේක්ෂාවක් නැති වැ යන මහණහු බුදුන් වදාළ පිළිවෙත් පසුපස්සෙහි යන බව මුත් හැරැ යන ගම්හි අපේක්ෂා වක් නැත්තාහ. "මෙ මම රුස්සම්. මෙ මම නුරුස්සම්"යි කියා ගත නො හෙන්නා වූ කුමාරයා මව අතින් මූවෙහි තුබූ අහරක් ම කා යැපෙන්නා සේ සැදැහැතියන් දුන් දනයකින් ම යැපෙනබව මුත් 'මේ යහපත මේ නපුර' යන බසෙක්හි රස නො දන්නාහ.

බුඩශාසන නැමැති කාඤ්චනගුහායෙහි සිංහපෝතකයන් බඳු වූ මෙබඳු නිරපේක්ෂා ගුණ ඇති බුඩශාසන නැමැති සදුත්විල්තෙරැ සැදුත්පොව්වන් බඳු වූ, බුඩශාසන නැමැති චිත්‍රකූටපර්වතයෙහි සවර්ණහංසපෝතකයන් බඳු වූ, බුඩශාසන නැමැති මහසිඹුල්රුක්හි ගරුඩපෝතකයන් බඳු වූ, බුඩශාසන නැමැති රත්නාකරයෙහි මා හැඟි රුවන් බඳු වූ, බුඩශාසන නැමැති සාගරකුක්ෂියෙහි මුතුරුවන් බඳු වූ, බුඩශාසන නැමැති පරසතුරුක්හි ගත් මහමල්කැන් බඳු වූ, බුඩශාසන නැමැති බ්‍රහ්මවිමානයන්හි බ්‍රහ්මකුමාරයන් බඳු වූ, බුදුන් පාද නැමැති වසන්තකාලයට පිපි මහසපුමල් බඳු වූ, කොටුඹුවෙහි වී නුපුරා ගෙහි රත්රන් අඹුරන් නුපුරා හැම ලෙසින් සිත්හි ගුණ ම පිරූ, සිඟසිඟා සිටිගෙහි ඇත්තවුන් දුන් දුන් සේ පිළිගන්නා බව මුත් යවත් වැ යාචකකමින් ඉල්වන සේ නො දන්නා බලාත්කාර යෙන් බැණපියා හැරැ ගන්නා සේ නො දන්නා, වඤ්චායෙන් හැරැ ගන්නා සේ නො දන්නා, අනුන් මිඩිය දුන් කුඩුකනදු සතරවර මුන් දුන් පාත්‍රයෙන් පිළිගන්නා වූ, පියාණන් වහන්සේ කළ දයක් ම කරන්නා වූ, 'බණම්හ යි සිතූ කල්හි තමන්ට සවාමී වූ ලොකසවාමී වූ සඩර්මසවාමී වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ නො බිණුව මැනවැ යි වැළකූ දෙතිස්කථාවට තුඩු නො ලා බණන්නා වූ, තමන්ට ද තමන් වන් සත්නට ද නුසුදුස්සක් නො බැණෑ අසා හුන්නන්ට සවර්ගසම්පත්තියක් නිර්වාණසම්පත්තියක් සාධා නො දෙන දයක් නො බැණෑ, බුදුන් ඈසුව ද 'බිණූ සේ යහපතැ' යි වදාරණ පරිද්දෙන් බස් බණන්නා වූ, සනුන් පිළිවෙත් පුරණ ධෛර්‍ය්‍යී ඇති 'බණක් ධර්මිෂ්ඨ කථාවක් නොවන ව්‍යර්ථකථාවකට තුඩු නො පොපියව!' යි වදාළ අව වාද දිවි පියාත් නො ඉක්මවන්නා වූ (බෙලිකුස්හි වන් දිය මුතු වෙණ. නැත. නිස් වැ තිබෙයි. නයිදල මුල්හි තිබෙන්නා වූ විෂදිය එයට දුරින් දුරැ ය. එසෙයින් ම) * මේ සගුරුවන් බණක් දහමක් ම බණන සෙයෙක. එ නැත, මුවෙන් නො බණන සෙයෙක. අධර්මකථා යෙක් වූ කලි, එ තුඩට දුරින් දුරැ ය.

* වරහන් තුළ තිබෙන පාඨය අවශ්‍ය නමුත් ගැලපුණු පරිදි නුසුදුසු ය.

මුළුලෝ තුඩැ තුඩැ වැකූ ගුණ ඇති, කිසි කෙනකුන් හා විරොධයක් නැති, කිසි සත්ත්වකෙනකුන්ට දණ්ඩනයක් නො කරණ, මේ ගිනි ගත් සසරෙහි තිවී වසන, මෙ සසරැ බද මල හෙළන, නිවන්පුර වදනට බුදුසස්නෙහි දිවගැති වූ, බලත් මිහිරිවෙස් ඇති, සිතත් මිහිරිගුණ ඇති, මරහු ඇස ගැසූ ගිනි ගෙණැ දිලි යෙන යකටු ඇති, සත්පුරුෂයන් ඇසට අමෘතපරිෂෙකයක් මැනි, ග්‍රන්ථධුර විදර්ශනාධුර දෙක ම මුත් තුන්වන ධුරයෙක්හි නො බැඳ, "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා' එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස" යි නාලොමෙහි පටන් බඹලොව දක්වා තමන්ගේ ගුණයෙන් එක කොලාහල කරවූ සැරියුත් මහමුගලන් දෙ අගසව්වන් පරම්පරයෙන් ආවා වූ, ගුණවත් සිල්වත් සඟුරුවන් සරණ යෙමියි සඟසරණ යා යුතු.

6. තව ද, මහාපිළිවෙත්හි පිළිපන්නා වූ, මුහුදට වන් මහගඟ පැන් පෙරළා ගඟට නො වදනා සේ නිවන් වන් සැදැ පෙරළා සසරට නො වදනා පිළිවෙත්හි පිළිපන්නා වූ, සෙලින් හෙන දිය සෙල අනු ව යන බව මුත් පිළිලොම් වැ නො යන්නා සේ නිවණට අනුපිළිවෙත් පුරණ බව මුත් නිර්‍වාණයට ප්‍රතිපක්ෂ වූ ප්‍රතිපත්තියක් නො පුරන්නා වූ, උදයයෙහි සිටැ අස්තයට අවක්‍රවූ මඟින් යන හිරු සඳු දෙදෙනා සේ අවක්‍ර වූ පිළිවෙතින් නිවණට වදනා වූ බුදු පසේ බුදු මහරහතන්ගේ උත්තම වූ ප්‍රතිපත්තියෙහි පිළිපන්නා වූ, තිලෝගුරු බුදුන්ගේ දරුවන යන බසට සුදුසු වූ පිළිවෙත්හි පිළිපන්නා වූ, ස්වාඛ්‍යාත ධර්මවිනය දෙක්හි වදළ පරිද්දෙන් පිළිපන්නා වූ, කාමසුඛානුයොගය ආත්මක්ලමථු ය යන දෙක හැරැ මධ්‍යමවූ ප්‍රතිපත්තියෙන් හුදු නිවන් සාධන පිණිස පිළිපන්නා වූ, කයින් වත් බසින් වත් සිතින් වත් කිසි වක්‍රකමක් නැති පිළිවෙත්හි පිළිපන්නා වූ, සියක් යොදුනෙහුදු දහසක් යොදුනෙහුදු තමා හුන් තැනට විඩා වැ ද අවුත් සත්කාර කට යුතු වූ, දෙව්ලෝ හැරැ පියා ද බඹ ලෝ හැරැ පියා ද තමන් හුන් තැනට අවුත් පූජා කට යුතු වූ, දුරින් ආවවුන්ට කළමනා සත්කාර තමන්ට ම කට යුතු වැ සිටියා වූ, තමන්ට දුන් දෙය මහත්ඵල මහානිසංස කරණ හෙයින් ඉහලොව පරලොව හදනා දෙන දන් පිළිගන්නට සුදුසු වූ, මිනිසුන් කෙරෙහි පටන් ගෙණැ සහම්පති මහාබ්‍රහ්මයා දක්වා සනත් කුමාරමහාබ්‍රහ්ම යා දක්වා

නිසාමහාබ්‍රහ්මයා දක්වා භාගිනමහාබ්‍රහ්මයා දක්වා එක හෙළා මුදුනෙහි දෙහොත් තබා ගෙණැ වඳනට සුදුසු වූ, හැල් වපුරණ හැල් කෙතක් සෙයින් සියලු සත්ත්වයා වපුරන්නා වූ කුසල් නමැති බිජුවට මහාඵල මහානිසංස කරන්නා වූ සාර වූ මහකෙත් බඳු වූ, සෝවාන්මාර්ගයෙහි පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක, සෝවාන් ඵලයෙහි පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක; සකෘදගාමිමාර්ගයෙහි පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක; සකෘදගාමි ඵලයෙහි පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක. අනාගාමි මාර්ගයෙහි පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක; අනාගාමිඵලයෙහි පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක; රහත්මග පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක, රහත්ඵලයෙහි පිහිටි සවාමිදරුවානෝ එක් කෙනෙක, යන මේ අට දෙනා වහන්සේ මුත් මට අනික් සරණෙක් නැත. මට අනික් පිහිටෙක් නැත. මට අනික් සමවායයෙක් නැත, මට අනික් දිව්‍යඖෂධයෙක් නැත. මට අනික් මවු කෙනෙක් නැත. මට අනික් පිය කෙනෙක් නැත. දෙව්මිනිස්ලෝසුව පතම් නමුදු මොවුන් ම සරණ යෙමි. බඹලොව නිරාමිස සුව පතම් නමුදු මොවුන් ම සරණ යෙමි. රාග ද්වෙෂ මොහ නමැති පාපධර්මයන් නො වන්නා වූ අමාමහනිවන් සුව පතම් නමුදු මොවුන් ම සරණ යෙමි. මාගේ අකුසලින් බුදුරුව දක ගත නො හිතිම් නමුදු ඔවුන් වෙස ගත්තා වූ මේ සගුරුවන් මා ඇස පැණෙත්තේ මාගේ භාග්‍යයෙක. බුදුන් උපදනට පලමු උපන්නාන්ට නො ලැබෙන්නාහ. පස්ව දහයින් ඔබ්බෙහි නො ලැබෙන්නාහ තුමූ දුශ්ශීල වැ නරකයට යෙත් නමුදු "මොහු බුදුන් දරුවෝ ය" යි යන සිතින් වැන්දවුන්ටා වූ කලි අමමහනිවන් නො වරදවා දෙන්නාහ.

පැවිදි වන්ට පලමු කුලභෙදයක් ඇත ද බුදුන්සස්නෙහි මහණ වූ තැන් සිටැ සියලු ජාතිභෙදය හැර මහාමායාදෙවීන් වහන්සේට මුනුබුරු වැ සුද්දොවුන්මහරජානන් වහන්සේ මුනුන් නැන්හි තබා යශෝධරා දේවීන් වහන්සේ මවුතැන්හි තබා ශාක්‍ය කුලයෙහි උපන් සර්වඥයන්වහන්සේ පිය තැන්හි තබා සර්වඥපුත්‍ර වූ රාහුලකුමාරයන් වහන්සේ මල්බෑනනතුරෙහි තබා එක සර්වඥයන් වහන්සේගේ කුලයෙහි මාඇගි කුල ලදින් සිටියහ.

හිරිඔතප් වැනි දෙදහවුන් දෙකෙලවර ලා තුමූ මධ්‍යයෙහි සිටියහ. සිහි වැනි පසිඳුරන් රක්නා දෙරටුගොව්වන් ලදහ. සිල් වැනි පිහිටක් ලදහ, සමාධි වැනි නිධානයක් ලදහ. ප්‍රඥාව වැනි ඖෂධයක් ලදහ. පඤ්චකාම වැනි ගර්හිත වූ කුණු නො වලඳ

හළහ. නිවන් වැනි මහඇගි මිහිරක් වළඳන්නට සිටියහ: සිතක් වැනි වකුටුවලයක් වසඟ කරන්නට සිටියහ. තෘෂ්ණා නමැති යකින්නක මෙන් බිඳින්නට සිටියහ: සසර වැනි සිරගෙයකින් නික්මෙන්නට සිටියහ. ලාභ පිණිස ලද ගුණ ප්‍රකාශ නො කරන්නාහ: තමන් නැතිදු ම බුද්ධෝත්පාදය නැතැයි කියන පරිද්දෙන් සමීඥයන්ට ආවශ්‍යකව සිටියහ: බඹලොව ගිය බඹම්මන්හි වැසෑ භාවනා කරත්: මහමුහුදු වැද දිය පිහිරා ඉන්ද්‍රනීලමිණි ගුහායෙහි හිඳිනා සේ ජලගර්භයෙහි හිඳ භාවනා කරත්: ඇල්ද හිරමඬුලු ගෙන්වා පා මුල්හි වත්තිකබල් කරත්: ගිම්දු සඳමඬුලු ගෙන්වා පිටට සිහිල් පිටාවූ කරත්: ඔවුන් ම සිතූසේ කරණ පරිද්දෙන් මහානුභාව ඇති සඟුරුවන් පරපුරෙන් ආහ. අහසට ගැසූ අත්හි වැදූ ගන්නා දෙයක් නැත්තා සේ කිසි වස්තුයෙක්හි සඞ්ගයක් නැත්තාහ සසරට වක්‍රයහ මරහට සතුරහ, සජ්ජනයන්ට හසනාකාරයහ, මෙසේ වූ සඞ්ඝ රත්නය නම් මට අතික් රත්නයෙක් නො වෙයි; හුදෙක් අභිමතාර්ථ සාධා දෙන්නා වූ චින්තාමාණික්‍යරත්නයෙක.

බුදුනු තමන් වහන්සේගේ ශ්‍රීමුඛයෙන් ම වදාරණ සේයෙක්

“යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච - සඞ්ඝඤ්ච සරණං ගතො,
චත්තාරි අරියසච්චානි - සම්මප්පඤ්ඤාය පස්සති”

යනාදි ගාථායෙන් ‘තමන් වහන්සේ ද තමන් වහන්සේ විසින් දෙශිත වූ ධර්මරත්නය ද තමන් වහන්සේගේ පුත් වූ සඟුරුවන් ද සරණ ගිය තැනැත්තහුට නිර්වාණප්‍රතිවෙධය සිඩ වේ”යි වදාරණ සේයෙක් ලොකරක්‍ෂාවට මේ සඟුරුවන් තමන් වහන්සේ හා සම කොට තබා වදාළ සේයෙක

“තව ද කෙළලක්‍ෂයක් සක්වළ ආඥා පවත්නා වූ ධජග්ග පරිත්තය වදාරන්නා වූ ස්වාමිදරුවෝ ‘නොපට දුකක් වුව, මා හෝ සිහි කරවු. නැත දහම් සිහිකරවු නැත, සඟුරුවන් හෝ සිහි කරවු, මේ තුණින් එකක් සිහි කළ කෙණෙහි වැහි විනාශයක් තබා භයෙක් වත් ලොමුදහ ගැන්මෙක් වත් හැති ගැන්මෙක් වත් නො වේ”යි වදාරණ සේයෙක් -

“අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා - සුඤ්ඤාගාරෙ ච භික්ඛවෙ,
අනුස්සරෙථ සම්බුද්ධං - භයං තුම්හාක නො සියා.

නො චෙ බුද්ධං සරෙය්‍යාථ - ලොකජෙට්ඨං නරාසභං
අථ ධම්මං සරෙය්‍යාථ - නිය්‍යානිකං සුදෙසිතං.

නො චෙ ධම්මං සරෙය්‍යාථ - නිය්‍යානිකං සුදෙසිතං,
අථ සඞ්ඝං සරෙය්‍යාථ - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

එවං බුද්ධං සරන්තානං - ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවො,
භයං වා ඡම්භිතත්තං වා - ලොමහංසො න හෙස්සති" යි

වදාළසේක.

තව ද, විශාලා මහනුවර ජනපදරොගය ප්‍රලය කරන්නා වූ සර්වඥයන්වහන්සේ යක්ෂභය, දුර්භික්ෂභය, රොගභය යන තුන සංසිඳුවන්නට තමන්වහන්සේගේ ආනුභාව හා තමන්වහන්සේගේ ධර්මයෙහි ආනුභාව හා තමන්වහන්සේගේ සඟුරුවන්හි ම ආනුභාව හා තකා වදාරණසේක් තුන් ගයට තුණුරුවන් බෙද සිටුවාලූවාක් සේ තුණුරුවන් ගුණෙහි සත්‍යයෙන් උපද්‍රව තුණ දුරු කොටැ වදාළසෙයෙක. මෙසේ මා ඇගි වූ සඟුරුවන් සරණ ගියා වූ මට සියලු දුක් නො වනබවට සර්වඥයන්වහන්සේ ඇප සේක. එහෙයින් මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා මට සියලු දුක් නො වන පිණිස සියලු උපද්‍රවයන් නො වන පිණිස සියලු සැපත් සිඬ වන පිණිස ඒ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

7. තව ද, සසුන් නැමැති මහවිල්හි රාජහංසයන් වැනි වූ, බුදුසසුන් නැමැති මහපියුම්හි කෙශරපංක්ති වැනි වූ, බුදුසසුන් නැමැති අහස්හි තරුකැල වැනි වූ, බුදුසසුන් නැමැති කප්රුක්හි මල්කැන් වැනි වූ, බුදුසසුන් නැමැති බෙලිකුස්හි මුතුරුවන් වැනි වූ, බුදුසසුන් නැමැති මුහුදුකුස්හි හටගත් පබළුදලු වැනි වූ, බුදුසසුන් නැමැති රුවන්ආකරයෙහි මිණිරුවන් වැනි වූ, බුදුසසුන් නැමැති මාර්ගචිත්තයෙහි රැස් වූ චෛතසිකධර්මයන් වැනි වූ, බුදුසසුන් නැමැති මලය පර්වතයෙහි හටගත් සඳුන්රුකක් වැනි වූ, බුදුසසුන් නැමැති වෛඩූර්‍ය්‍ය භූමියෙහි පහළ වූ රත්නාංකුරයන් වැනි වූ, බුදුසසුන් නැමැති මහාජම්බු පෙසියෙහි නැගි කනකාංකුර වැනි වූ, බුදුසසුන් නැමැති ගන්ධමාදන පර්වතයෙහි හටගත් මහාඖෂධ වැනි වූ, බුදුසසුන් නැමැති ඡද්දන්ත වනයෙහි උපන් සදත්පොව්වන් වැනි වූ, බුදුසසුන් නැමැති කෙලෙශ යුද්ධභූමියෙහි සිල නැමැති ආයුධ ගත් මහායොධයන් වැනි වූ, බුදු සසුන් නැමැති විද්‍යාශාලායෙහි ශික්ෂා කරණ අතැවැස්සන් වැනි වූ, බුදුසසුන් නැමැති කෙත්හි පැල පැහැර හිඳිවූ ශස්‍යාංකුර වැනි වූ, සිල නැමැති ආභරණ පැළඳැ සැරහුනා වූ සීල නැමැති විලෙපනයක් ගත් සුගන්ධප්‍රිය වූ, සසුන් පිළිවෙත් වැනි දුෂ්කරක්‍රියා කරණ වැරසර ඇත්තා වූ, බුදුසසුන් වන්නවුන් සිත් ගෙණැ වසන ඉඟි දන්නා වූ, ඒ සස්නෙහි වැසැ පොවා කළ සේ නපුරු, බිණූසේ නපුරු'යි

කීයවා නො ගන්නා සකස් කටයුතු ඇත්තා වූ, නිවන් වැනි ශාන්ති පුරයට මඟුවත්හි සිටියා වූ, තෙලෙස් ධුතාඞ්ග වැනි බැරි පිළිවෙතක් පුරන්නා වූ, සිඟා වළඳන බතක් වැනි නිරවද්‍යබතක් වළඳන්නා වූ, පංසුකුලචීවරයක් වැනි නිරවද්‍යචීවරයක් පොරෝණා වූ, බුදුන් වැනි පියන් ලද්දා වූ, දහම් වැනි ඇසිය යුත්තක් අසන්නා වූ, විදර්ශනා වැනි භාවනා කට යුත්තක් භාවනා කරන්නා වූ, තිලකුණු වැනි මෙනෙහි කට යුත්තක් මෙනෙහි කරන්නා වූ, මෛත්‍රී වැනි අමායෙක්හි සිත් ගලන්නා වූ, කායගතාසති නැමැති සිහි ලද්දා වූ, අහරපිළිකුල්සංඥා වැනි සංඥාවක් ලද්දා වූ, සප්පදානචාරිකාවක් වැනි මනහර චාරිකාවක් ලද්දා වූ, කුසල්වැනි රෝපණය කටයුත්තක් රෝපණය කරන්නා වූ, පණිවා නැමැති නො කටයුත්තක් නො කරන්නා වූ, මුසවා නැමැති නො බිණිය යුත්තක් නොබණන්නා වූ, රාමෙ වැනි නො බිය යුත්තක් නො බොන්නා වූ, පඤ්චකාම නැමැති ගරවිල්කුණක් කරින් උනා හළ වා වූ, නැටුම් විප්‍රකාර වැනි කායවිප්‍රකාරයක් නො බලන්නා වූ, ගී වැනි සංසාරවිලාපයක් නො අසන්නා වූ, අත්තකිලමථානුයොග නැමැති වධ්‍යභූමියෙහි දම්ගෙඩියකින් මිදී සිටියා වූ, මල්ගඳවිලවුන් වැනි සර්පශීර්ෂයක් ඇඟ නො පහරවා දුරු කළා වූ, උච්චාසයන මහාසයන වැනි අනර්ථයෙහි නො හිඳිනා වූ, රන්රිදීමසු කහවණු නැමැති තෘෂ්ණා වඩනා අපථ්‍යදෙයක් වෙහෙරින් ම පිටත් කළා වූ, විකාලභොජන නැමැති ගිනි ගෙණ දිලියෙන යවට මුවෙහි නො තබා දුරු කළා වූ දහම් නැමැති බුබදුසාද්‍යයක් බෙදා වළඳන් නා වූ, චීතය විනිශ්චයෙන් කරණ දෙෂනිශ්චය ඇති, බුදුසසුන් වැනි ධර්මාධිකරණ ලද්දා වූ, සැරියුත්මහමුගලන් දෙඅගසව්වන් වැනි කුසෙහි ගොත්තන් ලද්දා වූ, මරණ නො බානා වික්‍රම ලද්දා වූ, බුදුන් වැනි සිහි කට යුතු කෙනකුන් සිහි කරන්නා වූ, සසර වැනි එතෙර නො විය හැකි තැනෙකින් එතෙර කරන්නට සිටියා වූ, සතර බඹ නැමැති මහවතුරු පිහිනන්ට සුදුසු වීර්‍ය්‍ය ඇත්තා වූ, රාජ්‍යය වැනි මහමෙයකින් එතෙර වැ සිටියා වූ, දෙසැටදෘෂ්ටි නැමැති ගිනිවළක් පැනැ එතෙර වැසිටියා වූ, සසරපමණින් ව්‍යසනසාගරයෙහි ඇවිද සපුන් වැනි මනා වූ පටුන්ගමකට වන්නා වූ, තෘෂ්ණා වැනි කුලගිම්යක අතින් මිදී සැපත් ගන්නා වූ, සාරාසංඛ්‍යකල්පලක්ෂයක් බුදුන් පතා ලද දරු වූ, පාපයෙන් හය පත් වැ වසන්නා වූ බුදුන්ට දිවි පුදා වසන්නා වූ, සක්විති රජ වූ සමයෙහි උපදනා සක්රුවන් සේ

බුද්ධොත්පාදයෙහිම උපන්නා වූ, "මම නිමන්ත්‍රණය කළ ගෙයි වළඳමි. මාගේ සඟහු පැවරුම් තෙළ ඉවසා සිහා සති. මම ගහපතිචීවරය ඉවසමි. මාගේ සඟහු පංසුකූලිකයහ. මම මහහර වෙහෙර වෙසෙමි. මාගේ සඟහු ගස්මුල්හි අභ්‍යවකාශයෙහි වෙසෙති" යනාදි බුදුන් තමන්ට වර්ණනා කරත්, සුදුසු වැ සිටියා වූ, සත්බුමුමහල් ධරා සිටි බිම් තලාන් මහවැම් සෙයින් පිළිවෙත් නමැති මහපා ධරා සිටියා වූ මහඇඟි වූ මහවැම් වැනිවූ වදුත් නිසිවූ මෙනෙහි කරත් හිසි වූ, ධර්මනිධානවූ, "මහණෙනි මේ කියනු අසවයි තැදමා කියන බණ අසන්නට සුදුසු වූ, ශ්‍රොත්‍රාය ගණදුරන් වැනි, නිග්‍රාහ්‍යයන්ට නිග්‍රහ කරන්නා වූ, සිතක් වැනි සුල ගක් බදු ජව නැති කොට එක අරමුණෙහි බඳනා, තෘෂ්ණාව ද විජිගීෂුවූ දුෂ්කාන්දුහීශිතමාත්‍රයක් බාන විරූ වූ, අටපිරිකර පමණත් බොහෝ කොට සිතන අපිස් සතොස් වූ, ආශ්‍රවයන් වැනි උසක් පිනූ විජම්භයගැඹුරුසයුරු කැලඹූ, අනන්තාපරියනත ගුණ ඇත්තා වූ සගුරුමත් සරණ යෙමියි සඟසරණ යා යුතු.

---

## 8. සැරියුත්වත

එක්සමයෙක්හි සැරියුත්මහතෙරුන් වහන්සේ විවේකයට වඩනා සෙයෙක්, මුගලන්මහතෙරුන් වහන්සේ හා එක් වෙලෙක්හි වසනසේක. එක් දවසක් සැරියුත්මහතෙරුන් වහන්සේට බඩේ රුජාවෙක් ඇති වැ බලවත් දුකබවෙදනා ඉපැදුනිය. මුගලන්මහ තෙරුන් වහන්සේ සවස්වේලෙහි ආයුෂ්මත් වූ සැරියුත්මහ තෙරුන් වහන්සේට උපස්ථානයට ගොසින් තෙරුන් වහන්සේ වැඩැ හොත්තවුන් දැකැ එපවත් විචාරා දැනැ "ස්වාමීනි, නුඹවහන් සේට පෙරත් මේ රුජාව ඇති වූ කල්හි කුමකින් සංසිඳේ දැ?"යි විචාළදැ ය. තෙරුන් වහන්සේ "ඇවැත්නි, ගිහිකලැ අපගේ මෑණියෝ ගෙළගිතෙල් මී සකුරු එක් කොට යොදා දිය නුමුසු කොට හුදෙක් කිරෙන් ම පිසූ බත් දෙති. එයින් ම සංසිඳේ ය"යි වදළසේක. මහමුගලන්තෙරුන් වහන්සේ ද නුඹවහන්සේගේ වත් මාගේ වත් පිණෙක් ඇත් නම්, ලබන්නමෝ වේ දැයි සිතූ ය. ඔවුන් දෙදෙනා වහන්සේ කී බස් සක්මන් කෙළවර වෘක්ෂයෙක්හි දේවතාවා අසා "සෙට ආර්‍යයන්ට කිරිබතක් උපදවමි"යි එවට තෙරුන්වහන්සේට උපස්ථාන කරණ කුලයට එළඹැ එකුලෙහි වැඩිමහලුපුතු ශරීරයෙහි පිහිටා ගෙණැ ගැහැට කළහ.

ඉක්බිති ඔහට පිළියම් කරන්නට ය යි රැස් වූ නෑයන්ට “සෙට සැරියුත් මහතෙරුන් වහන්සේට ගිතෙල්මීසකුරු එක් කොට කිරිබතක් යැවුව හොත් හරිමි යි” කීය. එ අසා කුලෙහි ඇත්තෝ “තොප නො කීව ද අපි තෙරුන් වහන්සේට නිරන්තරයෙන් බත් දෙමහ” යි කියා දෙවන දවස් එබඳු වූ කිරිබතක් සැපයූහ.

මුගලන්මහතෙරුන් වහන්සේ උදෑසන ම අවුත් “ස්වාමීනි, මම ගම් තාක් පිඬු සිඟා එම් ද ඒ තාක් මෙහි ම වැඩහුන මැනැවැ” යි කියා ගමට වන්නූ ය. ඒ මිනිස්සු නැඟී සිටැ තෙරුන් වහන්සේගේ පාත්‍රය ඇරැ ගෙණ කිරිපිඬු පුරා දුන්හ. තෙරුන් වහන්සේ ගමනාකාර දක්වූසේක. ඒ මිනිස්සු “ස්වාමීනි, නුඹ වහන්සේ වළඳා වදාළ මැනැව. අනික් කිරිබත්පාත්‍රයකුත් දෙමහයි කියා තෙරුන් වහන්සේ කිරිබත් වළඳවා නැවත පාත්‍රය පුරා දුන්හ. තෙරුන් වහන්සේ ගොස් “ස්වාමීනි, වැළඳුව, මැනවැ” යි කිරිබත් එළවූහ ය. සැරියුත් මහතෙරුන් වහන්සේ ද ඒ බලා “කිරිබත ඉතා යහපත. කොයේ උපන් දෑ හො” යි සලකනසේක්, දෙවතාවා උපාසකකුලයට එළඹැ දුක් දී ඉපදවූ බව දැන, “ඇවැත්නි, මේ ආහාරය අනුභවයට සුදුසු නො වෙයි, පහ කරව” යි වදාළසේක

මුගලන්මහතෙරුන් වහන්සේ ද “ම බඳක්හු පොවා ගෙණා ආහාරය නො වළඳනා සේකැ” යි සිතක් නූපදවා එක වචනයෙන් ම පාත්‍ර මුවවිට අල්ලා ගෙණැ එක් පසෙක්හි මූණින් නැමූ සෙයෙක කිරිබත් බිම් හුනු කෙණෙහි ම තෙරුන් වහන්සේට පහරිණ රුජ ව සන්හිඳ, එතැන් පටන් පන්සාළිස්හවුරුද්දක් නැවත රුජාව නො පහළ මෙසේ කාය ජීවිතයෙහි ඇලුම් නැති වැ බුදුන් වහන්සේ වදාළ ප්‍රතිඥාත වූ පරිද්දෙන් ප්‍රතිපත්ති පුරණ සැරියුත් මහතෙරුන් වහන්සේගේ පරම්පරායෙන් ආවා වූ සුපිළිපන් වූ, නම් කීවවුන්ට සිහි කළවුන්ට සතුති කළවුන්ට අමාමහනිවන් දෙන සඟුරුවන් සරණයෙමි යි සඟසරණ යා යුතු.

---

## 9. බෑන සඞ්ඝරක්ඛිත වත.

තව ද, බෑන සඞ්ඝරක්ඛිත නම් සාමණේර කෙනකුන් වහන්සේ උදෑසන සීසිල් බත් වළඳා හුන්සේක. වළඳන්නා බලා වැඩහුන් උපාධ්‍යායයන් වහන්සේ විසින් “සාමණේරයෙනි, තො පත්විකා වැළඳීමෙන් තො පගේ දිව නො දවා අනුභව කරව” යි කියනලද බත්

අසා සංවේගයට පැමිණ, සුපරිශුද්ධ වූ තමන් වහන්සේගේ ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය මුල් කොට ගෙණ, හුන් තැන ම හිඳැ භාවනා කොට රහත් වූසේක.

මෙසේ ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය රක්‍ෂා කළ උන්වහන්සේ ආදි කොට සුපිළිපන් වූ මහාසඞ්ඝයා සරණ යෙමියි සඟසරණ යා යුතු.

---

## 10. අම්බඛාදක තිස්ස තෙර වත

තව ද, අම්බඛාදකතිස්ස නම් එක් තෙරකෙනකුන් වහන්සේ බත් නැති වැ මහාභයෙකැ මඟැ වඩනාසෙයෙක්, බත් නැති වැ විඩා වූසේය. නොවේලෙහි පල ගත් අඹ ගසක් මුලැ තමා ම හුනු අඹපල බලබලා සරුප් පරිද්දෙන් ම අඹ පිළිගන්වා ලන කෙනකුන් නැති හෙයින් සාදුකින් පීඩිත වැ ද ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලයට හානියක් නො කොට "පිළිගන්වන කෙනකුන් නැති වැ මේ අඹ මම හැරැ ගෙණ අනුභව කෙළෙම් වී නම්, මාගේ සර්වඥයන් වහන්සේ වදාළ ප්‍රතිපත්තියට පටහැණියක් කළා නම් වේ ද? එහෙයින් දිවි ගැල වෙතුදු බුද්ධවචනයට විරොධයක් නො කෙරෙම්"යි වැඩැහොත්සේක.

එසමයෙහි වැඩිමහලු උපාසකයෙක් එසේ දුබල වැ වැඩැ හොත් තෙරුන්වහන්සේ සමීපයට ගොස් "වහන්ස, ඉතා විඩා දැය. අඹපැන් වළඳුව හොත් ඉතා යහපතැ"යි හුනු විලිකුත් අඹ අවුළා ඔවුන් වහන්සේට අඹපැන වළඳවා පයින් වැඩිය නොහෙන හෙයින් තමා පිටැ හිඳුවා තමා වසන තැනට ගියේය. එවේලෙහි ඔවුන් වහන්සේ ද 'මේ මා උසුලා ගෙණ යන්නා වූ උපාසකතෙම මාගේ පියපක්‍ෂයෙහි එකෙකුත් නො වෙයි. මවුපක්‍ෂයෙහි එකෙකුත් නො වෙයි. සෙසු නෑ එකෙකුදු නො වන්නේ ය. ගැතිපක්‍ෂයෙහි එකෙකුදු නො වෙයි. බැලපක්‍ෂයෙහි එකෙකුදු නො වෙයි. එතෙකුදු වූවත් 'මා සිල්වතැ'යි සිතා මට මේ සා උපකාරයක් කරන්නේ ය"යි තමන්වහන්සේට අවවාද කරණ සෙයෙක් විදර්ශනා වඩා ඔහු පිටැ හිඳ ම භාවනා කොට රහත් බවට පැමිණි සේයෙක.

මෙසේ "දිවි ගැලවෙතුදු ප්‍රතිපත්තියට විරොධ නො කෙරෙම්"යි ඉදිරියෙහි තුබූ අඹ අතින් ඇරැ ගෙණ නො වළඳා ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය රක්‍ෂා කළ අම්බඛාදකතිස්ස නම් තෙරුන්වහන්සේ ආදි කොටැ ඇති සුපිළිපන් මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමියි සඟසරණ යා යුතු.

## 11. මහාසඞ්ඝරක්ඛිතථෙර වත

තව ද, මහාසඞ්ඝරක්ඛිත නම් එක් තෙරකෙනකුන් වහන්සේ සැටඅවුරුද්දක් ආයු වළඳා මරණමඤ්චකයෙහි වැඩැ හොත් සේක. උන්වහන්සේ මියන්නට වැඩැ හොත් බව අසා "අපගේ ස්වාමි වූ මහාසංඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේ රහත් වැ අප හැමදෙනා අත කුසල් පුරා දුන් ආයුකෙළවර මියන්නට වැඩැ හොත් සේක් ල. ඔවුන් වහන්සේට පූජා කරම්හයි සිතා නොයෙක් දිගින් දෙලොස් යොදනක් පමණ තැන බොහෝ දෙන පූජා ගෙණැ රැස් වූහ.

"නුඹවහන්සේ පෘථග්ජන වැ කාලක්‍රියා කරණ කල්හි නුඹ වහන්සේට පූජාභාණ්ඩ ගෙණැ රැස් වූ මහාජනයාට බොහෝ පශ්චාත්තාප වන්නේ ය"යි උපස්ථාන කරණ ලදරුභික්ෂූන් වහන්සේ දැන්වූ කල්හි එබවත් අසා තෙරුන් වහන්සේ "ඇවැත්නි, මම මෛත්‍රීසම්මාසම්බුදුරජාණන් වහන්සේ දකිම්යි විදර්ශනා නො වැඩීමි. එබැවින් මං ඔප්බවා හිඳුවාලා අවකාශ දෙව"යි වදාළසේක.

උපස්ථාන කරණ වහන්සේ තෙරුන් වහන්සේ වඩා හිඳුවා පිටනට වැඩි සේක, ගිය ක්ෂණයෙහි විදර්ශනා වඩා රහත් වූ සේක, රහත් වැ අසුර ගසා වදාළසේක, ස්වාමීනි, මරණමඤ්චකයෙහි හෙවැ පොවා ගුණවිශෙෂය ලැබීම ඉතා ආශ්චර්‍ය්‍යය"යි වදාළසෙසෙක මෙසේ පැවිදි වූ වේලෙහි පටන් මරණාන්තය දක්වා සුපරිශුද්ධශීලය රක්‍ෂා කළ උන්වහන්සේ ආදී සුපිළිපන්සඞ්ඝයා වහන්සේ සරණ යෙමියි සඞ්ඝසරණ යා යුතු.

---

## 12. අන්‍යතරස්ථවිර වත

තව ද, එක් තෙනකුන් වහන්සේ "සමිඳෙයන් වහන්සේ වදාළ පාළි උගන්නට ය"යි රුහුණු වඩනා සේක. තෙරුන්වහන්සේ හා එක් කුසෙහි හොත් උපාසිකාවෝ ද නමන් පුතනුවන් වහන්සේගේ පවත් තෙරුන් ’හන්සේ විචාරන්නාහ.

තෙරුන්වහන්සේ එක් දවසක් "නමින් වහන්සේගේ බෑනනු වන් ගෙණෙම්"යි සිතා රුහුණට වැඩිසෙසෙක. උපාසිකාවන්ගේ පුතනුවන් වහන්සේ ද බොහෝ කලක් මා විසින් මෙහි වසන ලද. උපාධ්‍යායන් වහන්සේ බලාපියා උපාසිකාවන්ගේ පවත් දැනැ එමි" සිතා රුහුණින් නික්මුනු සෙසෙක දෙදෙනා වහන්සේ ඔවුනොවුන් දැකැ තෙරුන් වහන්සේ විසින් කොයි යවු දැ"යි විචාරණ

ලද සේක් එපවත් සැලකළසේක. තෙරුන් වහන්සේ ද "ඉතා යහපත. තොප විසින් කරණ ලද. උපාසිකාවෝ ද තොප නිරන්තරයෙන් විචාරන්නාහ. මම ද තොප කැඳවා ම ආමි. තෙපි යව. මම මෙහි ම වස් වෙසෙමි"යි කියා උන්වහන්සේ නගා යැවූ සේක. ඔවුන් වහන්සේ ද වස් වසන දවස් මෑ පියාණන් කරවූ සෙනසුනට වැඩිසේක.

ඉක්බිති, ඔවුන් වහන්සේගේ පියාණෝ දෙවන දවස් අවුත් "ස්වාමීනි, අපගේ සෙනස්න කවුරුන් වහන්සේ පිළිගත් සේක් දැ?යි විචාරා" ආගන්තුකලද්‍රු භික්ෂු කෙනකුන් දැ ය" යි අසා උන් වහන්සේ කරා එළඹැ පසඟ පිහිටුවා වැඳැ "ස්වාමීනි, අපගේ සෙනස්නේ වස් විසීමට පැමිණියවුන් කළ මනා වතෙක් ඇතැ"යි කීහ. ඔවුන් වහන්සේ "කිමෙක් දැ? උපාසකයෙනි" යි වදාළ සේක. උපාසකයෝ ද ' ස්වාමීනි, තුන්මසක් මුළුල්ලෙහි අපගේ ගෙයි දී ම වළඳා වඩනා කල අපට කියා වැඩිය මැනවැ"යි සැලකළාහ. ඔවුන් වහන්සේ ද ඔවුන් බස් අසා මුවෙන් නො බැණීමෙන් ඉවසා වදාළ සේක. උපාසකයෝ ද තමන්ගේ ගෙට ගොස් "අපගේ සෙනස්නට එක් ආගන්තුක වහන්සේ කෙනෙක් වැඩිසේක. සකස් කොට උපස්ථාන කට යුතු ය"යි කීහ. උපාසිකාවෝ ද යහපතැයි මුදුනෙන් පිළිගෙණ ඉතා මධුර වූ කනාබොන දෑ සැපයූහ.

භික්ෂූන් වහන්සේ ද බත්වේලෙහි නෑදෑයන්ගේ ගෙදරට වැඩිසේක. කිසි නෑදෑ කෙනෙක් ඔවුන් වහන්සේ නො අඳුනන්නාහ. ඒ ආයසීයන් වහන්සේ ද තුන්මසක් මුළුල්ලෙහි වළඳා "අපි යම්හ"යි වදාළසේක. ඉක්බිති ඔවුන් වහන්සේගේ නෑදෑයෝ "ස්වාමීනි, සෙට වැඩිය මැනවැ"යි කියා දෙවන දවස් තමන්ගේ ගෙයි දී ම වළඳවා තෙල් නැළියක් හා හකුරුපිඩක් හා නවරියන කඩක් හා දන්දී "වැඩිය මැනවැ"යි කීහ.

ඔවුන් වහන්සේ ද අනුමෙවෙනිබණ වදාරා "රුහුණට යම්හ"යි වැඩිසේක. උපාධ්‍යායයන් වහන්සේ ද වස් වැස (පවරා පෙරමඟ වඩනා සේක් පෙර දුටු තැන්හි ම ඔවුන් වහන්සේ දුටුසේක.) ඔවුන් වහන්සේ (උපාධ්‍යායයන් වහන්සේ) දැකැ එක්තරා රුක්මුලෙක්හි වඩා හිඳුවා වතාවත් කළ සේක. ඉක්බිති තෙරුන්වහන්සේ ද "ඇවැත්නි, උපාසිකාවන් දුටුදැ"යි විචාළසේක. "එසේය ස්වාමීනි"යි සියලු පවත් දන්වා තෙලින් තෙරුන් වහන්සේගේ පතුල් මැඩැ සකුරුපැන් වළඳවා ඒ පිළිය තෙරුන් වහන්සේට පිළිගන්වා පසඟ පිහිටුවා වැඳැ "ස්වාමීනි, මට රෝහණය ම සැපයැ"යි කියා වැඩිසෙයෙකැ. තෙරුන් වහන්සේ ද විහාරයට අවුත් දෙවන දවස් කොරණ්ඩක නම් ගමට වැඩි සේක. උපාසිකාවෝ ද "මාගේ බෑයන් වහන්සේ මාගේ පුතනුවන්

කැඳවා ගෙණෑ දුන් වඩනා සේක, දුන් වඩනාසේකැ"යි එනාවතු වැ පෙරමඟ බලබලා හිඳිනාහු හුදකලා වැ වඩනා තෙරුන් වහන්සේ දුටැ මහාශොකයෙන් මඩනා ලද්දාහු උන්වහන්සේගේ පාමුල්හි හී මහාහඬින් හැඬූහ. තෙරුන් වහන්සේ ද "තොපගේ පුතනුවෝ තමන් ඉතා අපිය් බැවින් නො හඳුන්වා ගියාහ"යි උපාසිකාවන් අස්වසා සියලු පවත් හැල කොට පාත්‍රපය්යෙහි තුබූ පිළිය දුන්වූ සේක.

මෙසේ තමන් වහන්සේගේ නෑදෑයන්ගේ ගෙහි පෙවා තුන් මසක් මුළුල්ලෙහි අහර වළඳා තමන් වහන්සේ නො හඳුන්වා ම අපිය් බව ම මස්තකප්‍රාප්ත කළා වූ ඔවුන් වහන්සේ ආදි කොට සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමියි සඟසරණ යා යුතු.

---

## 13 මලියදේවවත

තව ද, මලියදෙව ස්ථවිරයන් වහන්සේ කලලග්‍රාමයෙහි වැඩැ වසනා මණ්ඩලාරාම නම් මහාවිහාරයෙහි බුදුන් වදාළ පාළි උගත්සේ සෙයෙක. ග්‍රන්ථධුර පුරණසේක. එක් දවසක් කලලග්‍රාමයෙහි පිඩු සිඟා වඩනා වූ ඔවුන් වහන්සේට එක් උපාසිකාවක් කැඳ හරළුවක් දී පුත්‍රසෙනහ උපදවා තෙරුන් වහන්සේ ඇතුළුගෙහි වඩා හිඳුවා ප්‍රණීත වූ ආහාර වළඳවා "ස්වාමීනි, තමර ගමක වසත සේක් දැ? යි කියා විචාළහ. ඔවුන් වහන්සේ "උපාසිකාව, මණ්ඩලාරාම මහාවිහාරයෙහි ග්‍රන්ථධුර පුරමි"යි වදාළසේකැ. උපාසිකාවෝ ද "ස්වාමීනි, එබැවින් යම්තාක් ග්‍රන්ථධුර පුරණසේක් ද, ඒතාක් මාගේ ගෙහි දී ම වළඳා වදාළ මැනවැ'යි කීව. ඔවුන් වහන්සේ ද එහි දී නිබඳ වැ ආහාර වළඳා අනතයෙහි අනුමෙවෙනිබණ වදරණ සෙයෙක් "දුකින් මිදී සුවපත් ව"යි යන මේ දෙපදය ම කියා වඩනා සෙයෙක.

මෙසේ ක්‍රමයෙන් ඇතුළුවස් තුන්මස්හි උපාසිකාවන්ට අනුග්‍රහ කරණසේක් තමන් වහන්සේ වැළඳූ අහරට පූජා කොට වස් පවරණ දවස් සිවුපිළිසිඹියාපත් රහත් බවට පැමිණි සේක. ඉක්බිති මහා ස්ථවිර කෙනෙකුන් වහන්සේ ඇමැත්ති, "අද විහාරයෙහි මහා ජනයා රැස් වූහ. ඔවුන්ට ධර්ම දෙශනා කරව"යි වදාළසේක. තෙරුන් වහන්සේ ද ඉවසා වදාළසේක. එකෙණෙහි ලද්රු වූ ශ්‍රාමණේරයන් වහන්සේ කෙනෙකුන්දු ගොසින් උපාසිකාවන්ට

"අද තොපගේ පුතනුවන් වහන්සේ බණ වදරණසේයෙක. විහාරයට ගොස් බණ අසව"යි වදාළසේයෙක. උපාසිකාවෝ ද "ස්වාමීනි, හැම්දෙන බණ දන්නා නු නො වෙති. මාගේ පුතනුවන් වහන්සේ මට මෙතෙක් කල් අනුමෙවෙනි බණ වදරණසේක් 'පුවපත් ව. දුකින් මිදෙව, යන මේ දෙපදය ම වදරණසේක. එහෙයින් හාමික් කෙළිය මැනවැ' යි කීහ, සාමණේරයන් වහන්සේ ද "උපාසිකාවෙනි, දනුතුදු නො දනුතුදු නෙපි විහාරයට ගොස් බලව"යි වදාළසේක. උපාසිකාවෝ ද ගඳමල් ගත් අත් ඇති වැ විහාරයට ගොස් ගන්ධ මාලාදීන් පූජා කොටැ පිරිස් කෙළවර බණ අසඅසා හුන්හ.

දහවල් ධර්මකථික වහන්සේ ද පාඨය කියවන්නාහු ද තමන් පමණක් කියවා හුන්ස්නෙන් නැඟී සිටියාහුය. ඉක්බිති මලිය දෙව ස්ථවිරයන් වහන්සේ ද ධර්මාසනයේ වැඩැ හිඳැ විජිනිපත අල්ලා ගෙණැ "මහාඋපාසිකාවන්ට තුන්මාසක් මුළුල්ලෙහි දෙපදයෙකින් ම අනුමෙවෙනිබණ කීමි. අද සියලු රාත්‍රියෙහි තුන් පිටකය ම සමමගීතය කොට එම දෙපදයෙහි ම අර්ථව්‍යාඛ්‍යාන කෙරෙමි"යි සිතා ධර්මදෙශනාවට පටන් ගෙණැ අසන්නවුන් කන්හි අමාවතුරක් තමන්නා සේ සියලු රෑ බණ වදාළ සේක අරුණෝදයෙහි බණදෙසුම් කෙළවර මහාඋපාසිකාවෝ සෝවාන්ඵලෙහි පිහිටියාහ.

මෙසේ තමන් වහන්සේ ලද තිවන්සුවය තමන් වහන්සේට මවුතනතුරෙහි සිටි මහාඋපාසිකාවන්ට ද බෙදා දී අනුභව කළ සිවුපිළිසිඹියා පත් රහත් වූ ඔවුන් වහන්සේ ආදි කොට සුපිළිපන් මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමි යි සඟසරණ යා යුතු

---

## 14. තිස්සභූති වත

තව ද, මහාවිහාරයෙහි තිස්සභූති නම් එක් තෙරකෙනෙකුන වහන්සේ විනය හදරා පිරිවහනසේක. සිඟා වඩනා වේලෙහි ඇතුළුගමට පිඩු සිඟා වඩනාද්දු ය. ගැණු අරමුණක් දුනැ එහි ලොභ ඉපදවූසේක. ඔවුන් වහන්සේ ඔබා ගත් පියවර නො සොල්වා ම තමන් වහන්සේගේ ප ත්‍රයෙහි කැඳිත්ත උපස්ථාන කරණ ලදරු භික්ෂූන් වහන්සේගේ පාත්‍රයෙහි ඇවිදැ "මේ විතර්කය වඩනේ මා සතරඅපායෙහි හෙළා මහදුක් දෙන්නේ ය"යි සිතා එසින් නැවත ආචාර්යයන් වහන්සේ සමීපයට ගොස් ඔවුන් වහන්සේ වැඳ එකත් පස්හි සිටියේක් "ස්වාමීනි, මට ව්‍යාධියෙක් උපන. මම එයට පිළියම් කරන්නට නො පොහොසත්මි"යි ආම්. ඔබ වහන්සේ ද දවල්

කියවන පාළිවචනය ද සවස් වේලෙහි කියවන පාළිවචනයද මා බලා තබා වදාළ මැනවැ"යි කීහ. මෙසේ ඔවුන් වහන්සේ තමන්ගේ ආචාර්යයන් වහන්සේට එපවත් සැලකොට ගල්වල වසන සංඝරක්ඛිත තෙරුන් වහන්සේ සමීපයට වැඩියේය. ඔවුන් වහන්සේ තමන් වහන්සේගේ පන්සල පිරිබඩ ගන්නා සේක් වැඩි වහන්සේ නො බලා ම "ඇවැත්නි, තොපගේ පාසිවුරු නගා තබවයි වදාළසේක. ඔවුන් වහන්සේ ද "ස්වාමීනි, මාගේ එක් ව්‍යාධියෙක් ඇත, ඉදින් නුඹවහන්සේ පිළියම් කරන්නට පොහොසත් සේක් නම්, නගා තබමි' යි වදාළසේක. ඔවුන් වහන්සේ ද "ඇවැත්නි, උපන්නා වූ රෝගයට පිළියම් කරන්නට පොහොසතුන් සමීපයට ම ආව. පාසිවුරු නගා තබව"යි වදාළසේක. (ආගන්තුක වහන්සේද) "අපගේ ආචාර්යයන් වහන්සේ නො දැනැ මෙසේ නොවදාරණ සේකැයි පා සිවුරු නගා තබා තෙරුන් වහන්සේට වතාවත් දක්වා වැඳැ එකත්පස් ව හුන්සේක.

තෙරුන් වහන්සේ "මොහු රාගචරිතයෝ ය"යි දැනැ ඔවුන් වහන්සේට සුදුසු කොට කමටහන් දුන්සේක. ඔවුන් වහන්සේ ද හුනස්නෙන් නැගී සිටැ පාසිවුරු උරෙහි ලා තෙරුන් වහන්සේ නැවත නැවත වැඳිසේක් "ස්වාමීනි, ඉදින් මම මාගේ කටයුතු කරන්නට පොහොසත් වීම් නම්, ඉතා යහපත. නො එසේ වී නම් මේ මාගේ අනාදූක්ම ය"යි වදාළසෙයෙක. ඔවුන් වහන්සේ ද "යව, ඇවැත්නි, මහාණිසසභූතීනි තොප බඳු වූ වීර්‍යවත් වූ කුල පුත්‍රයන්හට ධ්‍යානය වත් විදර්ශනාව වත් මාර්ගය වත් ඵලය වත් දුර්ලභ නො වේ"යි වදාළසෙයෙක. ඔවුන් වහන්සේ තෙරුන් වහන්සේගේ බස් අසා ඔබට ආදර දක්වා එයින් නික්මැ එන වේලෙහි ම සලකුණු කරණ ලද සැගවී තුබූ දෙමටගසක් මූලට වැදූ පලක් බැඳ වැඩැ හිඳැ අසුබකමටහන් පාදක කොටැ විදර්ශනාවට පවත් ගෙණැ රහත්බැව්හි පිහිටා අලුයම්වේලෙහි පාළිවචනය උගන්නට ආචාර්යයන් වහන්සේ සමීපයට ම වැඩිසෙයෙක.

මෙසේ උපන්නා වූ කාමච්ඡන්දය තමන් වහන්සේගේ ඤාණ බලයෙන් දුරු කොට එයට සුදුසු වූ කමටහන් ලදින් භාවනා කොටැ රහත් වූ ඔවුන් වහන්සේ ආදි කොට සුපිළිපන් වූ මහා සඞ්ඝයා වහන්සේ සරණ යෙමියි සඟසරණ යා යුතු.

# 15 මහාසීවතෙර වත.

තව ද, **මහාසිව** නම් තෙරුන් වහන්සේ සොතෙක් **මහගම තිස්සමහවෙහෙර** වසනසෙයෙක් තෙවළා අර්ථවශයෙන් ද පාළිවශයෙන් ද අටළොස්මහගණයක් උගන්වනසේක. ඒ තෙරුන් වහන්සේගේ අවවාදයෙහි සිටැ තිස්දහසක් භික්ෂූන් වහන්සේ රහත් වූසේක. ඔවුන් වහන්සේ අතුරෙන් එක් කෙනෙකුන් වහන්සේ තමන්වහන්සේ ලද්දා වූ ධර්මය අරභයා උපන්නා වූ ප්‍රීති හා සොම්නස් ඇතිසෙයෙක් "මෙ වැනි අමාමහනිවන්සුවය අපගේ ආචාර්යයන් වහන්සේට ඇත් දෝ හෝ"යි සලකනසෙයෙක් තෙරුන් වහන්සේ රහත් නො වූ බව දැනැ "මෙ වැනි උපායකින් තෙරුන් වහන්සේට කලකිරීම් උපදවමි"යි සිතා තමන් වහන්සේ වසන තැනින් තෙරුන් වහන්සේ සමීපයට ගොස් වැඳැ වතාවත් දක්වා වැඩ හුන්සේක.

ඉක්බිති තෙරුන් වහන්සේ "ඇවැත්නි, කුමක් පිණිස අවු දූ?"යි විචාළසෙයෙක. ඔවුන් වහන්සේ ද "ස්වාමීනි, ඉදින් මට අවකාශයක් ලැබේ නම්, එක්ධර්මපදයක් උගන්නට ආමි"යි කීසෙයෙක. තෙරුන් වහන්සේ ද "ඇවැත්නි, බොහෝ දෙන උගන්නාහ. එහෙයින් තොපට අවසරයක් නැතැ"යි වදාළසෙයෙක. භික්ෂූන් වහන්සේ සියලු රෑදහවල් අවකාශයක් නො ලබනසේක් "ස්වාමීනි, මෙසේ අවකාශයක් නැති කල නුඹවහන්සේ කරා එන මරුට කෙසේ අවසරයක් ලැබේ දූ?"යි විචාළසෙයෙක. එකල්හි තෙරුන් වහන්සේ "මොහු මා සමීපයෙන් කිසිවක් උගන්නට ආවාහු නො වෙති. මට ම කලකිරීම් උපදවනු පිණිස ආ වහන්හ"යි සිතා වදාළසෙයෙක. ඔවුන් වහන්සේ ද "ස්වාමීනි, භික්ෂූන් නම් මා බඳු වුවමනා වේදූ?"යි කියා තෙරුන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳැ ඉන්ද්‍රනීලමාණික්‍යයක් සේ නිල් වූ අහසට නැඟී තමන් වහන්සේ වසන තැනට ම එළඹිසෙයෙක.

තෙරුන් වහන්සේ ඔවුන් වහන්සේ වැඩි වෙලෙහි පටන් කොට උපන්නා වූ මහකලකිරීම් ඇතිසේක් දහවල් දවස් ද ගණ හදුරවා පිරිවහවා පාසිවුරු අත පෙවෙන තැන්හි තබා උදෑසන පාළිවචන ඉගෙණ බස්නා වූ භික්ෂූන් වහන්සේ හා සමග පාසිවුරු ඇරැ ගෙණැ බැසැ තෙළෙස්ධුතාඞ්ගයන් පුරා සමාදන් වූසේක. ගම් කෙළවර ගලෙක්හි විහාරයට ගොසින් ඒ පිළිදූගැ එහි ඇඳපුටු තබා "නො රහත් වැ මාගේ පිට හැදෙක නො තබමි"යි දැඩි කොට ඉටා ගෙණැ සක්මනට බටසෙයෙක. "අද රහත් වෙමි. අද රහත්,

වෙමි"යි උත්සාහ කරන්නවුන්ට පවාරණය ආසන්න වී ය. එකල්හි ඔවුන් වහන්සේ "පුහුදුන්බව හැර විශුද්ධිපවාරණයෙන් පවරමි"යි සිතා වීර්‍ය කොට ඉතා විඩා වූසේක. ඒ පැවරුමට මාර්ගයක් වත් ඵලයක් වත් උපදවා ගන්නට නො පොහොසත් වූසෙයෙක. "පවන් ගන්නා ලද විදර්ශනා ඇති ම බඳෙක් පොවා රහත් බව නො ලබයි ඒ ඉතා උගහට දෙයක් වනැ"යි සිතා එම ලෙස ම සිටීම් සක්මන් කිරීම් යන මෙහි ම තත්පර වැ තිස්අවුරුද්දක් පමණ මහණධම් පුරා මහාපවාරණ දවස් ආකාශමධ්‍යයෙහි සිටියා වූ පිරුණුසඳ බලා "කිම් දේ හෝ? සඳමඬල පිරිසිදු දේ හෝ? නොහොත් මාගේ සීලය පිරිසිදු දේ හෝ?"යි පරීක්ෂා කරණසේක් "සඳමඬලෙහි සසලකුණ පෙණෙයි. මාගේ සීලයෙහි වූකලි උපසම්පන්න වූ දවස් පටන් අද දක්වා කැලලෙක් නැතැ"යි බලා උපන්නා වූ ප්‍රීති හා සොම්නස් ඇති සෙයෙක් මුහු කළා වූ ඥාන ඇති බැවින් උපන්නා වූ ප්‍රීතිය ඔබා සිවුපිළිසිඹියාපත් රහත් වූසෙයෙක.

මෙසේ සඳමඬලට පොවා අධික කොට ශතගුණයෙන් සහස්‍රගුණයෙන් තමන් වහන්සේගේ සීලය පිරිසිදු කොට රක්ෂා කළ, බුදුන් වහන්සේ වදාළ ප්‍රතිපත්ති වූ පරිද්දෙන් පූරණ මහාසිව නම් තෙරුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමියි සඞ්ඝසරණ යා යුතු.

---

## 16. මහාතිස්සතෙර වත

තව ද මහාතිස්ස නම් තෙරුන් වහන්සේ වස් නො වැසූ කල්හි පටන් අෂ්ටසමාපත්තිලාභි සෙයෙක. තමන් වහන්සේ සමාපත්තීන් ඔබනලද ක්ලේශයන් නැවත නූපදනා මෙන් සැටවස් වැඩූ කල්හි දූ තමන් වහන්සේ පුදුන්බව නො දන්නාසේයෙක. එක්‍රමයෙහි එක් දවසක් මාගම්හි තිස්සමහාවෙහෙරැ භික්ෂුසඞ්ඝයා වහන්සේ තලඟුරු වැසි වූ ධම්මදින්න නම් තෙරුන් වහන්සේට "ස්වාමීනි මෙහට වැඩැ බණ වදාරණසේක්වා"යි කියා හසුන් යැවූසේක. තෙරුන් වහන්සේ 'යහපතැ' යි ඉවසා, "මා සමීපයෙහි වැඩි මහලු වහන්සේ කෙනෙකුන්ද නැත. මහා තිස්ස නම් තෙරුන් වහන්සේ වනාහි මට ආචාර්‍ය සෙයෙක. ඔවුන් වහන්සේ සඞ්ඝස්ථවිර කොට යෙමි" යි භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණ ලද සෙයෙක් තෙරුන් වහන්සේගේ විහාරයට ගොස් දිවාස්ථානයෙහි සිටි තෙරුන්ට වත් දක්වා එකත්පසෙක හුන්සේක. තෙරහු "කිම, ධම්මදින්නය, බොහෝ කලෙකින් ආයෙහි දූ?" (යි ඇසූහ) "එසේ ය වහන්ස,

තිස්සමහවෙහෙරින් භික්ෂුසඞ්ඝයා මට හස්නක් එවූහ. මම හුද කලා වැ එහි නො යමි. නුඹවහන්සේ කැටි වැ යනු කැමැත්තෙහු මෙහි ආමි" යි සිහි කට යුතු කථා කියමින් කල් යවා "වහන්ස, නුඹ විසින් මේ ලොවුතුරුදහම් කවර දවසෙක ලැබී ද?" යි විචාළහ. 'සැට්වසෙක් වී ය" යි කීහ. "වහන්ස, සමවත්හුව වළඳවී ද?" යි විචාළහ. "එසේ ය, ඇවැත්නි". "වහන්ස, එක් පොකුණක් මැවිය හැකි ද?" "ඇවැත්නි, මෙය නො බර ය" යි ඉදිරියෙහි පොකුණක් මැවූහ. "වහන්ස, මෙහි එක් පියුම්පඳුරක් මවනසේක්ව" යි කියන ලදු ව හෙද මැවූහ. "මෙහි දුන් මහනෙලුම්මලක් දක්වනසේක්ව" යි කීහ. තෙරණුවෝ එද දක්වූසේයෙක. "මෙහි සොළොස්හැවිරිදි පමණ ස්ත්‍රීරූපයක් දක්වන්නැ" යි කියන ලද්දේ එද මවා දක්වූහ. "මේ රුව සුභ සේ මෙනෙහි කරන්නැ" යි කීහ. තෙරහු තමා මැවූ ගෑණුරුව බලන්නෝ ලොභ ඉපැදවූහ. එවිට තෙමේ පුදුන්බව දැනැ "සත්පුරුෂය, මට පිහිට වෙව" යි අතැවැසියා වෙතැ උක්කුටුකයෙන් හුන්සේයෙක.

"වහන්ස, මේ සඳහා ම ආමි" යි සැහැල්ලු අසුබ කමටහනක් කියා තෙරුන්ගේ විවේකය සඳහා පිටතට නික්මුනු සෙයෙක් සංස්කාරයන් මෙනෙහි කොට ඔහු දිවාස්ථානයෙන් නික්මෙන් ම සිවුපිළිසිඹියාපත් රහත්බවට පැමිණිසේයෙක. ඉක්බිති ඔවුන් වහන්සේ සඟතෙර කොට ධම්මදින්න තෙරුණුවෝ තිස්සමහා විහාරයට ගොස් බණ දෙශනා කොට වදාළසේයෙක.

මෙසේ තමා ම මැවූ ගෑණුරුව ශුභවශයෙන් මෙනෙහි කිරීමෙන් පුදුන් බව දැනැ නැවැත අනුන් අවවාදයෙහි පිහිටා එය අශුභවශයෙන් මෙනෙහි කොට රහත්බව පසක් කළ මහාතිස්ස තෙරුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමියි සඟසරණ යා යුතු.

---

## 17. දෙමළ දෙරවුපල් වත.

තව ද, මධුඅඹගණ නම් ගමැ එක් දෙමළදෙරවුගොව්වෙක් උදසන ම බිලී ඇරැ ගෙණැ ගොස් මස් මරා තුන්කොටසක් කොට එක් කොටසකින් සාල් ගණියි. එක් කොටසකින් දී ගණියි. එක් කොටසක් පිසයි. මෙම ලෙසින් ම පණස් හවුරුද්දක් මුළුල්ලෙහි සතුන් මරා ජීවත් වෙයි. හෙතෙම කල්යාමකින් මහලු වැ ගිලන් වැ හොත් තැනින් නැගී නො සිටිය හෙන අවස්ථාවට පැමිණියේ ය.

**එසමයෙහි ගිරිවිහාරවාසී වූ චූල්ලපිණ්ඩපාතික නම්** තෙරුන්වහන්සේ "ම බඳු එකක්හු බලා සිටිය දී මෙතෙම නාමක් නසීව'යි සිතා වදරා යුහු වැ ගොස් ඔහුගේ ගෙදොර වැඩ සිටි සේක. ඉක්බිති ඔහුගේ අඹු "ස්වාමීනි, තෙරුන් වහන්සේ වැඩි සෙයෙකැ" යි තමාගේ ස්වාමිහට කීවා ය. හෙ ද "මම පණස්අවුරුද්දක් මුළුල්ලෙහි තෙරුන් වහන්සේ සමීපයට නො ගියවිරිමි. මාගේ කවර ගුණයක් සඳහා තෙරුන් වහන්සේ මා කරා වැඩි සේක් ද? ගොස් ඔවුන් වහන්සේ විචාරව" යි කී ය. ඔහු අඹු ද තෙරුන් වහන්සේ සමීපයට ගොස් "ස්වාමීනි, වැඩ සිටි සෙයෙක් නු?" යි කිව. තෙරුන් වහන්සේ "උපාසකයාට අවසථා කිම් දැ?" යි විචාළසෙයෙක. හෝ ද "ස්වාමීනි, ඉතා ගිලන්නු ය" යි කීවා. ඉක්බිති තෙරුන් වහන්සේ ඇතුළුගෙට වැද ඔහුට සිහි එළවා "සිල් ගන්ව" යි වදාළසේක. උපාසකයා ද "යහපත ස්වාමීනි, දෙවා වදාළ මැනැවැ" යි කී ය. තෙරුන් වහන්සේ ආදි කොට තිසරණ දී පන්සිල් දෙන්නට පටන් ගත්සේක. එකෙණෙහි ම දිව කැඩී වැටින.

ඉක්බිති තෙරුන් වහන්සේ ද "මෙතෙක් පමණැ"යි කියා වැඩි සෙයෙක. හෙ ද මියැ ගොස් සවුමාරජයෙහි ඉපැද එවිගස්හි "කවර කුසලක් කොට ඡේ හෝ මා මෙ වැනි සැපත් ලද්දේ ය?" යි බලන්නේ තෙරුන් වහන්සේ නිසා ලද බව දැනැ දෙව්ලොවින් අවුත් තෙරුන් වහන්සේ වැදැ එකත් පස් වැ සිටියේ. තෙරුන් වහන්සේ විසින් "තෝ කවරෙක් දැ?" යි විචාරණ ලද්දේ "ස්වාමීනි, මම "දෙමළදෙරටුගොවු වෙමි" යි කී ය. තෙරුන් වහන්සේ "කොයි උපන් දැ?" විචාළසේක. හේ ද "ස්වාමීනි, සවුමහරජයෙහි උපන්මි, ඉදින් ස්වාමිදරුවෝ පන්සිල් මට දෙවා වදාළසෙයෙක් වී නම්, මත්තෙහි දෙව්ලොවැ උපන්නම් වීමි'යි කී ය. තෙරුන් වහන්සේ ද "ඇපි කුමක් කරමෝ ද? තෙපි සිල් ගන්නට නො පොහොසත් වූව" යි වදාළසේක. ඉක්බිති දිව්‍යපුත්‍රතෙමේ තෙරුන් වහන්සේගේ ශ්‍රීපාද වැදැ දෙව්ලොවට ගියේ ය.

මෙසේ පණස්හවුරුද්දක් මුළුල්ලෙහි සතුන් මරා ජීවත් වූ මෙවැනි පව්ටහු පොවා "ම. බඳු එකක්හු ඇති වැ නිරයත බව සුදුසු නො වේ" යි සිතා වදරා තමන් වහන්සේගේ ඥානබලයෙන් ඕහට දෙව්සැපත් දෙවා වදාළ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමියි **සඟසරණ** යා යුතු

# 18. ඝාතකාල වත.

තව ද, රජගහ නුවර ඝාතකාල නම් එකෙක් රාජනියොගයෙන් පණස්අවුරුද්දක් මුළුල්ලෙහි සොරුන් මරා එක ම කටයුත්තෙහි යෙදී වෙසෙයි. ඉක්බිති අමාත්‍යයෝ "ස්වාමීනි, ඝාතකාලයා දැන් ඉතා මහලු ව ගියේ. සොරුන් මරන්නට නො පොහොසත. ඔහු ඒ තනතුරෙන් පහ කොට වදාළ මැනැවැ"යි කියා රජ්ජුරුවන් හිවිස්වා, අනිකක්හු ඒ තනතුරෙහි පිහිටවූහ.

ඝාතකාල යම් තාක් සොරුන් මරණ කටයුත්තෙහි යෙදී විසී ද, ඒතාක් නො හිරුණු කඩක්වත් යහපත් බතක් වත් ඇඟ ඉලීම් තැමක් වත් නො ලත්විරී ය. ඝාතකාලතෙමේ සොරුන් මැරීමෙන් නැවැත්තේ 'බොහෝ කලක් මා විසින් කිලිටු වෙසින් ම ඇවිදිනා ලද. කිරිබතක් මට පිසව' යි කියා තමාගේ අඹුවට නියොග කොට උලනු නානු ආදි වූ උපකරණ ගෙන්වා ගෙණ නාන තොටට ගොස් ඉස් සෝධා නහා සුදුපිළී හැඳැ සුවඳ ගසා සුවඳමල් පැලැඳැ ගෙණැ ගෙට එන අතරමගැ සැරියුත්මහතෙරුන වහන්සේ දැකැ "කිලිටි වූ කර්මාන්තයෙන් පහවීමි. ආර්‍ය්‍යයන් වහන්සේ දිටිමි"යි සතුටු සිත් ඇත්තේ තෙරුන් වහන්සේ ගෙට වඩා ගෙණැ ගොස් අළුත් ගිතෙල් හා සකුරෙන් පිසන ලද කිරිබත් වැළඳැවී ය. තෙරුන් වහන්සේ ද ඔහට අනුමෙවෙනිබණ වදාළසේක. ඉක්බිති ඝාතකාලයා අනුමෙවෙනිබණ අසා අනුලොමක්ෂාන්ති ලදින් තෙරුන් වහන්සේ හා කැටි වැ ගොස් නැවැත්තේ, අතරමගැ අළුත වැදූ දෙනෙක විසින් මැඩැ මරණ ලද්දේ ගොස් තව්තිසාභවනයෙහි උපන.

ඉක්බිති භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, චොරඝාතකයා අද ම කිලිටි කර්මාන්තයෙන් පහ වි ය. අද ම මෙළේ ය. කොහි උපන් දෝහෝ?" යි කියා සර්වඥයන් වහන්සේ අතින් විචාළසේක. සර්වඥයන් වහන්සේ ද "මහණෙනි, තව්තිසාභවනයෙහි උපනැ" යි වදාළසේක. භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, චොරඝාතක බොහෝ කලක් සොරුන් මරමරා ඇවිද්දේ. තුඹවහන්සේ මෙසේ වදාළසේක. වැලි පාපකර්මයෙහි විපාක නැද්දැයි"? යි විචාළසේක. සර්වඥයන් වහන්සේ ද "මහණෙනි, එසේ නො කියවු. ධර්මසෙනෙවි සැරියුත්මහතෙරුන් වහන්සේ වැනි ආර්‍ය්‍යකෙනෙකුන් ලදින් ඔවුන්ට ආහාර දී අනුමෙවෙනිබණ අසා අනුලොමක්ෂාන්ති ලදින් චොරඝාතකයා තව්තිසාභවනයෙහි උපන්නේ වේ දැ" යි වදාළසේක.

මෙසේ පණස්හවුරුද්දක් මුළුල්ලෙහි පවිතම කොට දුශචරිතයෙහි ම යෙදී සිටි මෙවැනි පවිටා ද පවා තමින් වහන්සේව අසරක් දීපු පමණෙකින් දෙව්ලොව්හි 'අනන්තා'පරිමාණ දෙව්සැපත් දෙවා වදාළ සැරියුත්තෙරුන් වහන්සේගේ පරම්පරායෙන් ආවා වූ භික්ෂුසඞ්ඝයා වහන්සේ සරණ යෙමි සි සඟසරණ යා යුතු.

---

## 19 මැදිබෑතෙරුන්වත.

තවද, මැදිබෑ තෙරුන් වහන්සේ මහාක්ෂීණා'ශ්‍රව සේක. ඒ තෙරුන් වහන්සේගේ පාසිවුරු සතරඅඟක් අගනේ ය. ඔවුන් වහන්සේ ධර්මාශෝක රජ්ජුරුවන්ගේ විහාරශ පූජා කරණ දවස් සඞ්ඝස්ථවිර වූසේක.

ඉක්බිති මිනිස්සු ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ඉතා ම රූක්ෂ බව දැකැ "ස්වාමීනි, මඳ ඇසිල්ලක් පිටතැ වැඩැ සිටිය මැනැවැ" යි කිය. තෙරුන් වහන්සේ ද 'මබඳු ක්ෂීණා'ශ්‍රවයකු රජ්ජුරුමන්ට සසිනුග නො කරතොත් අනික් කවුරු කෙරෙත් දැ?" යි මඳුරු පෑපිව්ලෙයහි ගැලී ගොස් 'සඞ්ඝස්ථවිරයන් වහන්සේට ය' යි කාගා ගත් බත්පිඩ පිළිගෙණ ම නැගිසේක.

මෙසේ තමන් වහන්සේ ක්ෂීණා'ශ්‍රමබව කිසිවක්හට පහළ නො කොට අපිජ්ඣතොජ්ගුණ මත්‍යතප්‍රාපත කළ මොවුන් වහන්සේ ආදි කොට සුපිළිපන් මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 20 මෙහානික වත.

තව ද, සීතුල්පව්වෙහි (එක්) මවුන් දරු වූ තෙරුන් වහන්සේ (දෙනමක්) විසූ සේසේක. දෙදෙනා වහන්සේ අතුරෙන් බාල වහන්සේ තමන් වහන්සේට උපස්ථාන කරණ උපාසකයක්හු විසින් දෙන ලද උක්දණ්ඩක් හැර. ගෙණැ බෑනන් වහන්සේ සමීපයට ගොස් "ස්වාමීනී, වළඳා වදාළ මැනැවැ" යි කීසේක. එවේලෙහි තෙරුන් වහන්සේ ද බතක් මළඳා මූව සෝධන්නට වැඩැ හුන් සේක් "ඇවැත්නි, නො කැමැත්තෙමි" යි වදාළ සේක. නැවත භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, එකාශනිකයෙක් දැ?" යි

පිළිවෑලුයේය. ඉක්බිති තෙරුන් වහන්සේ "ඇවැත්නි, උක්දණ්ඩ මෙරත් ගෙනෙම" යි වදාරා පන්සියවුරුද්දක් මුළුල්ලෙහි තමන් වහන්සේ රක්නා කළ ඒකාසනිකධුතාංගගුණය සඟවා උක්දණ්ඩ අනුභව කොට නැවත ධුතාංගය සමාදන් වූයේය.

මෙසේ පන්සියවුරුද්දක් මුළුල්ලෙහි එකතැන්හි වැස ද තමන් වහන්සේගේ ගුණය මලනුවන් වහන්සේට පෙවා නො සඟවා අපිස්සතොස්ගුණයෙහි මස්තකප්‍රාප්ත කළා වූ මොවුන් වහන්සේ ආදිකොට ඇති සුපිළිපන් සඟරුවන් සරණ යෙමියි සඟසරණ යා යුතු.

---

## 21 අනුරුත්තෙර වත

තව ද, සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ "අනුරුද්ධස්ථවිරයෝ පාචීනවංසමිගදායෙහි හිඳැ මහාපුරුෂවිතර්කයක් සිතන්නාහු ය" යි දැන වදාරා අහසින් වැඩැ ඔවුන් වහන්සේ ඉදිරියෙහි බැස සාධුකාර දී වදාළසේක. මෙසේ තමන් වහන්සේගේ ගුණමහිමයෙන් තිලෝගුරු සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ලවා සාධුකාර දෙවා වදාළ මහාපුරුෂවිතර්කයෙහි මස්තකප්‍රාප්ත වූ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් මහාසංඝයා වහන්සේ සරණ යෙමියි සඟසරණ යා යුතු.

---

## 22 සෝණතෙර වත.

තව ද, කුටිකණ්ණසෝණ නම් තෙරුන් වහන්සේ සමිඳුන් වහන්සේ හා එක ගඳකිළියෙහි ලැගැ අලුයම්වේලෙහි බුදුන් වහන්සේගේ කත් පොවා තමන් වහන්සේ කරු හයා ගන්නා පරිච්ඡෙදෙන් අෂ්ටවර්ගයන් කිසි හානියකට නො පමුණුවා අති මධුර කොට බණ කිවා සමිඳුන් වහන්සේ ලවා සාධුකාර දෙවා වදාළසේක.

මෙසේ තිලෝගුරු සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ලවා පවා සාධුකාර දෙවා වදාළ මේ කුටිකණ්ණසෝණ නම් තෙරුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසංඝයා වහන්සේ සරණ යෙමියි සඟසරණ යා යුතු.

# 23 දබ්බ තෙර වත.

තව ද, කාශ්‍යපසම්බුදුන් වහන්සේගේ ශාසනය පිරිහෙන සමයෙහි භික්ෂූන් වහන්සේ සත්නමක් එක්සිත් වැ සෙසු වහන්සේ මරුන්දූ බුදුසස්නෙහි අනාදර කරන්නා දුටු "මෙහි සිදෑ කුමක් කරමෝ ද? එහෙත්පස්හි සිද මහණදම් පුරා සසර දුක් අනත කරමිග" සි නිණෙක් බැඳැ උස් වූ ගල් මුදුනකට නැගී "තමන්ගේ සිත්හි බල දන්නාහු නිණ හෙළන්මයි. ජීවිතයෙහි ආලයක් ඇත්තාහු මේ නිණින් බසින්මයි. පසු වැ නො තැවෙත්ව" යි කියා හැම්දෙනා වහන්සේ එක් සිත් වැ නිණ හෙළා "ඇවැත්නි, නො පමා වවු ය"යි ඔවුනොවුන්ට අවවාද දී තමන් වහන්සේ සිත් ඇලෙන ඒ ඒ තැන්හි වැඩැ සිදෑ මහණදම් පුරන්නට පටන් ගත්සේක.

ඔවුන් වහන්සේ අතුරෙන් එක් තෙර කෙනෙකුන් වහන්සේ පස්වන දවස් රහත් වැ "මාගේ කටයුතු නිමියේ ය. මම මෙතැන්හි සිදෑ කුමක් කෙරෙම්දැ?" යි සිතා වදරා සෘඩියෙන් උතුරුකුරු දිවින් පිඬු සිගා ගෙණැ ඇරැ "ඇවැත්නි, මේ ආහාර වළඳවු. සිගා ආහාර දීම් මා පිළිබඳ ය. තෙපි හැම දෙන තොප තොපගේ කට යුතු කරව්" යි වදාළසේක. සෙසු භික්ෂූන් වහන්සේ ද "මහත්ස, ඇපි නිණ හෙළන්නමෝ 'අප අතුරෙන් යම් කෙනෙක් ලොවුතුරා දහම් පසක් කළාහු නම්, ඔහු සිගා අහර ගෙණෙන්වයි, උන් ගෙණා බත් කෙත්තෝ නා මහණදම් පුරති'යි කියා නිණ හෙළුමෝ ද?" යි වදාළසේක. තෙරුන් වහන්සේ ද "එසේ කතිකාවක් නො කළමහ" යි වදාළසේක. භික්ෂූන් වහන්සේ තුඹවහන්සේ පෙරැ කළ කුසල්මුල් ඇති බැවින් ලොවුතුරාදහම් පසක් කළසේක. ඇපිත් පොහොසත් වූමෝ නම්, සසර දුක් එතෙර කරමහ. තුඹවහන්සේ මැඩිය මැනැවැ" යි කීසේක.

තෙරුන් වහන්සේ ද වහන්සේ වරුන්දූ ගිවිස්වා ගත නො හී එහු තැනෙක්හි සිදෑ ආහාර වළඳ වැඩිසේක. අනික් තෙර කෙනෙකුන් වහන්සේ සත්වන දවස් අනාගාමි වැ එහින් පිරිනිවත් පා සුද්ධාවාසබ්‍රහ්මලොකයෙහි උපන්සේක. අනික් පස් දෙනා වහන්සේ ද මියැ එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍යලොකයෙහි මහාසම්පත් අනුභව කොට ඇවිද්ද ඒ ඒ කුලෙහි උපන්සේක.

ඔවුන් අතුරෙන් දබ්බ ස්ථවිරයෝ මල්ල නම් රටැ අනුපිය නම් නගරයෙහි මල්ල රජ්ජුරුවන්ගේ ගෙහි පිළිසිඳැ ගත්තාහ. ඔවුන්ගේ මෑනියෝ ද වදන සමයෙහි මළහ. මියැ ගිය ශරීරය

අමු සොහොනට ගෙණ ගොස් දරසෑයට නගා ගිනි දුන්හ. වහ්නි වේගයෙන් තනතල ද උදර පටලය ද දෙකක් වැ පැළී ගියේ. බඩ හොත් පුතනුවෝ තමන්ගේ කුශලබලයෙන් මත්තට පැන නැගී එක් හිතණ පඳුරෙක්හි හුනහ.

එහි හුන් දරුවා ඇරැ ගෙණ මිත්තනියන්ට පාවා දුන්හ. මිත්තනියෝ ද ඔවුන්ට නම තබන්නාහු හිතණපඳුරෙහි හී ලද්ද වූ ජීවිත ඇති හෙයින් දබ්බ ය යි නම් තැබූහ. ඒ දබ්බකුමාරයන් සත්හැවිරිදි කාලයෙහි සර්වඥයන් වහන්සේ භික්ෂුසඞ්ඝයා වහන්සේ පිරිවරා මල්ල නම් රට හැසිරෙණ සෙයෙක් අනුපිය නම් ගමට පැමිණැ අනුපිය නම් අඹවෙනෙහි වැඩැ වසනසේක.

ඉක්බිති දබ්බකුමාරයෝ සර්වඥයන් වහන්සේ දැකැ දුටු සමින් ම පැහැදැ මහණ වනු කැමැති වැ "මම ලොවුතුරාබුදුන් වහන්සේ සමීපයෙහි මහණ වෙමි" කියා මිත්තනියන් විචාළහ. මිත්තනියෝ ද දබ්බකුමාරයන් කැඳවා ගෙණ, සර්වඥයන් වහන්සේ සමීපයට එළඹැ "ස්වාමීනි, මේ කුමාරයන් මහණ කොට වදාළ මැනැවැ" යි කීවුය. සර්වඥයන් වහන්සේ ද එක් භික්ෂු කෙනෙකුන් වහන්සේට "තෙල කුමාරයා පැවිදි කරව"යි වදාළසේක. ඔවුන් වහන්සේ ද සර්වඥයන් වහන්සේගේ නියොගයෙන් පැවිදි කරණ සේක් තචපඤ්චක කම්සථානය වදාළසේක. දබ්බ කුමාරයෝ ද පෙරැ කළ කුසල්මුල් ඇති බැවින් ආදි කෙසෙක් කැපිය කැපූ කෙණෙහි සෝවාන් වූවාහ. දෙවන කෙසෙක්කැපිය කපන කල්හි අනාගාමී වූහ. සියලු කෙසෙක්කැපීම ද රහත් වීම ද පසු පළමු නො වැ එකවිට ම වි ය.

මෙසේ තමන් වහන්සේගේ අනුභාවබලයෙන් ඒ සා මහත් ගිනි රැසින් පොවා කිසි උපද්‍රවයකට නොපැමිණියා වූ ආදි කැපූ කෙසෙක් වැටිය හා සමග ලොවුතුරුදහම් පසක් කළා වූ මොවුන් වහන්සේ ආදි කොට සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙම්හි සඞ්ඝසරණ යා යුතු.

---

## 24. ගඞ්ගාතීරිය තෙර වත.

තව ද, පදුමුත්තර නම් සර්වඥයන් වහන්සේගේ සමයෙහි එක් කුලපුත්‍රයෙක් තමයුතු දන්නා වයසට පැමිණැ බුදුසස්නෙහි ප්‍රසන්න වැ භික්ෂුසඞ්ඝයා වහන්සේට පැන් දන් දින. ඉක්බිති ඒ කුලපුත්‍රයා සඞ්ඝයා වහන්සේට පැන් දුන් කුසලින් දෙව්ලොවෙහි ඉපැදැ නැවත ද බොහෝ කුසල් කොට දිව්‍යමනුෂ්‍ය ලොකයෙහි මහාසම්පත් අනුභව කොට ඇවිදිනේ අපගේ සර්වඥයන් වහන්සේ

ගමෙහි සැවැත්නුවර එක්තරා ගෘහපතියෙකුට පුත් ව උපන. ඔහට දත්තය යි නියා නම් තැබූහ. ඒ දත්තතෙරෝ වයසට පැමිණ ගිහි ගෙයි වසන්නාහු "පබ්බජ්ජාව නම් නො වැද්ද හැකි දෙයෙකැ"යි දැන *එහි කලකිරී පැවිදි වූහ. පැවිදි ව රූපප්‍රතිපත්ති පූරණයේක් පංසුකූලසිවුරක් හා මලවුන්ට කටයුතු ක්‍රියා කරන්නට ගෙණ මුඩියක් වැනි වූ මැටි පාත්‍රයක් ගෙණ ගඞ්ගාතීරයෙහි තල් කිබුලු ආරණකින් පැලක් ඉදි කොට එහි විසූයේය. එහෙයින් ම ගඞ්ගාතීරිය නම් වූයේය.

ඔවුන් වහන්සේ "රහත් ව මුත් කිසිවකු හා මුමෙන් නො බණිමි"යි දැඩි කොට ඉවා ගෙණ පළමු හවුරුද්ද කිසිවක් හා මුමෙන් නො බැණ විසූයේය. දෙවන හවුරුදු පිඩු සිගා වඩනා ගමෙහි එක් ගැණියක් "මොවුන් වහන්සේ ගොළුමෙක් දෝ හෝ?"යි විමසනු පිණිස පාත්‍රයෙහි කිරි ඇවිසිනි. තෙරුන් වහන්සේගේ හස්තවිකාර දැක කිරි වත් කළා ම ය. ඔවුන්වහන්සේ "බූසති යෙනි, එතක් ඇතැ"යි වදාළසේය. තුන්වන අවුරුදු මතායි, විශ්‍රීය වඩා රහත් වූ ඒ ගඞ්ගාතීරිය තෙරුන්වහන්සේ ඇදි කොට ඇති සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමියි සඞ්ඝසරණ යා යුතු.

---

## 25. ධම්මදින්නා වත

තවද, තලබාගරමාසී වූ ධම්මදින්න නම් සිවුපිළිසිඹියා පත් රහතුන් වහන්සේ නොතකුත් දෑ බොහෝ භික්ෂූන් වහන්සේට අවවාද දෙනසේක. ධම්මදින්න තෙරුන් වහන්සේ එක් දවසක් තමන් වහන්සේ දවල් මැඩ සිටිනා තැන හිඳිනාසේක් "අපගේ ඇචාර්‍ය වූ මහානාගතෙරුන් වහන්සේගේ මහණදම් මුදුන් පත් වී දෝ හෝ?"යි පරීක්‍ෂා කරණසේක් ඔවුන් වහන්සේ පුදුන් බව දැන "මා ඔබ සමීපයට නො ගිය හොත් පුහුදුන්ව ම මියන සේකැ"යි දැන සෘද්ධියෙන් අහසින් ගොස් දහවල් සිටිනා තැන්හි වැඩ සිටිනා මහානාගතෙරුන් වහන්සේ සමීපයෙහි බැස ඔවුන් වහන්සේ වැඳ වතාවත් දක්වා එකත්පස්හි වැඩ හුන් ඉක්බිති මහානාගතෙරුන් වහන්සේ "හැයි ඇවැත් ධම්මදින්නයෙනි, නො කල්හි අවු දැ?"යි වදාළසේක. ධම්මදන්නතෙරුන් වහන්සේ "ස්වාමීනි, පැනයක් විචාරන්නට ආමි"යි කීසේක.

---

* 'යො සරාවාසං වසෙතො අගමනීයට්ඨාන භාවං අජානිත්වා
වීතික්කමං කත්වා පුන අගමනීයට්ඨාන භාවං ඤත්වා

යන පාඨයෙහි වැරදි පරිවර්තනයෙකි.

ඉක්බිති මහානාගතෙරුන් වහන්සේ "ඇවැත්නි, විචාරව, දන්නමෝ නම් කියන්නමෝ වේ දෝ"යි වදාළසේක. ධම්මදින්න තෙරුන් වහන්සේ පැන දහසක් විචාළසේක. මහානාගතෙරුන් වහන්සේ විචාළ විචාළ පැන පැකිළීමක් නැති වැ විසඳා වදාළසේක.

ඉක්බිති ධම්මදින්නතෙරුන් වහන්සේ "ස්වාමීනි, නුඹවහන්සේගේ ඥානය ඉතා තීක්ෂණය, කවර කලෙක්හි නුඹ වහන්සේ විසින් මේ ධර්මය දන්නා ලද දෝ?"යි විචාළ කල්හි මහානාගතෙරුන් වහන්සේ "මෙයට සැටහැවිරිදි කල්හි ය"යි වදාළසේක. ධම්මදින්න තෙරුන් වහන්සේ "ස්වාමීනි, සමාධිහුරුවක් වළඳන සේක් දෝ"යි විචාළ සේක. මහානාගතෙරුන් වහන්සේ "ඇවැත්නි, ඒ බැරි දෙයෙක් නො වේ"යි වදාළසේක. ධම්මදින්නතෙරුන් වහන්සේ "ස්වාමීනි, එබැවින් එක් ඇතකු මවා වදාළ මැනවැ"යි වදාළසේක. මහානාග තෙරුන් වහන්සේ සමාධියෙන් ධවල වූ ඇතකු මවා වදාළසේක. ධම්මදින්නතෙරුන් වහන්සේ "ස්වාමීනි, දැන් මේ ඇතු සිටුවන ලද කන් ඇති වැ දික් කරණලද නගුටු ඇති වැ හොඬ මුවෙහි තබා ගෙණැ භයානක වූ කුඤ්චනාද කෙරෙමින් නුඹ වහන්සේ ඉදිරියට එන පරිද්දෙන් මවා වදාළ මැනවැ"යි කීසේක. මහානාග තෙරුන් වහන්සේ ද එලෙසින් ඇතු ඉදිරියට එන පරිද්දෙන් මවා හුහු වැ එන්නා වූ ඇතුගේ භයානක වූ ආකාර දැකැ නැගී සිටැ පලා යන්නට වන්සේක

ඉක්බිති මහාක්ෂීණාශ්‍රවධම්මදින්නතෙරුන් වහන්සේ අත දික් කොට මහානාගතෙරුන් වහන්සේගේ සිවුරුකොන ගෙණැ "වහන්ස, ක්ෂීණාශ්‍රව කෙනකුන්ට භයෙක් නම් ඇද්දෝ?"යි විචාළ සේක. මහානාගතෙරුන් වහන්සේ එකල්හි පුහුදුන් බව දැනැ "ඇවැත්නි, ධම්මදින්නයෙනි, මට වහල්වව"යි කියා ඔවුන් වහන් සේගේ පා මුල්හි උක්කුටුකයෙන් හුන්සේක. ධම්මදින්න නම් තෙරුන් වහන්සේ "ස්වාමීනි, මම නුඹ වහන්සේට වහල්වන පිණිස ම ආමි. කිසිවක් නො සිතා වදාළ මැනවැ"යි කියා කමටහන් දුන්සේක. මහානාගතෙරුන් වහන්සේ කමටහන් ගෙණැ සක්මනට බැසැ තුන්වන පියවරෙහි ම රහත් වූසේක.

මෙසේ පුහුදුන් වැ සිටැ ද තමන් වහන්සේගේ සිත්හි කෙලෙස් පමණක් නො නගවා පිරිසිදු කොට ශීලය රක්නා කොට පසු වැ සත්පුරුෂයන්ගේ අනුශාසනා දීමෙන් තමන් වහන්සේ පුහුදුන්බව දැනැ සුදුසු කමටහන් ලදින් භාවනා වඩා

තුන්වන පියවරෙහි ම රහත් වූ ඒ මහානාගතෙරුන් වහන්සේ ඇඳි කොට ඇති සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමි"යි සඟසරණ යා යුතු.

---

## 26 ඵුස්සදෙව වත

තවද, කළඳර* වැසි ඵුස්සදෙව නම් තෙරුන් වහන්සේ දාගැබ්මළුව හැමඳ සිවුර එක්පසෙකි බහාලා අතුරණලද නීල මල්රැසක් වැනි වූ සම ව පතළා වූ වැලි ඇති දාගැබ්මළුව බලා බුද්ධාලම්බනප්‍රීති උපදවා සිටියේය. එකෙණෙහි මාරතෙම පජීත සමීපයෙහි උපන් කළුවඳුරක්හු හැටියෙන් දාගැබ් මළුයෙහි ගොම් විසුරුවා ගෙණැ ගියේ ය. තෙරුන් වහන්සේ චිත්තෛකාග්‍ර තාවක් නො ලදින් රහත් වන්නට නො පොහොසත් වූයේත් නැවත මළුව හැමැඳ වැඩා සිටියේය. මීරැ දෙවන දවස් මාලු ගොනෙකු හැටියෙන් එසේ ම ගොම් ලා ගෙණැ ගියේ ය තෙරුන් වහන්සේ ද එ දවසත් රහත් වන්නට නො පොහොසත් වූයේය. තුන්වන දවස් ද (මර තෙමේ) පයකොර එකක්හුගේ හැටියෙන් පය කිම් ගා ගෙණැ ගියේ ය. තෙරුන් වහන්සේ "මෙ වැනි පිළිකුල් පුරුෂයෙක් ගාත්පසින් යොදනක් පමණ නැත නැත. "මෙ මාරයා (වනැ"යි සිතා "තෝ මාරයා) දැ"යි විචාරා වදාළසේය.

ඉක්බිති මාරතෙම "දැන් වුකලි වඤ්චාවක් නො කොට හැක්කැ"යි සිතා "මම මාරයෙමි"යි කී ය. තෙරුන් වහන්සේ "සර්වඥයන් වහන්සේ දුටුවීරැ දැ?"යි විචාළසේය. "එසේ ය, වහන්ස, දිටිමි"යි කී ය. තෙරුන් වහන්සේ "මාරයා නම් මහානුභාව ඇත්තේ ය. එබැවින් සර්වඥයන් වහන්සේ වැනි රූපයක් මවා"යි වදාළසේය. 'වහන්ස, එවැනි රූපයක් මවන්ට නො පිළිවන. එසේකුදු වුවත් එවැනි ගටහනක් මවමි"යි කියා තමාගේ හැටිය හැරැ සර්වඥයන් වහන්සේගේ රූපය හා සම වූ ආත්මභාවයෙන් සිටියේ.

ඉක්බිති තෙරුන් වහන්සේ මරහු බලා "මෙ සරාගසදෝස සමෝහ එකෙක් පවා මෙසේ සොබී. රාගාදී කිසි දෝෂයක් නැති සර්වඥයන් වහන්සේ කෙසේ සොබනාසේක් දෝ හෝ"යි සිතා වදාරා බුද්ධාලම්බනප්‍රීතිය මෙහෙහි කොට විදශීනා වඩා රහත් වූසේක.

---

* කාලකන්ද - සද්ධර්මරත්නාකරය.

මෙසේ තමන් වහන්සේ සම්පයට ආ මරහු පවා වඤ්චාවෙන් බුදුවෙස් ගත්වා බුද්ධාලම්බනප්‍රීතිය නො හැරැ විදර්ශනා වඩා රහත් වූ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුප්‍රතිපන්න වූ මහා සඞ්ඝයා වහන්සේ සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 27 අන්‍යතර ස්ථවිර වත

තව ද, එක් කුලපුත්‍ර කෙනෙක් බුදුසස්නෙහි පැවිදිව, වත්පිළි වෙත් පුරන්නාහු පස්වස් කල්හි පවරා භික්‍ෂු භික්‍ෂුණී මාතෘකාවගය පුහුණු කොට, තමා කම්මට්ඨාන ඉගෙණැ සිතට අනුකූල වූ කමටහන් ගෙණැ වලට වැද සර්වඥයන් වහන්සේ විසින් වීර්‍ය වඩන්නා වූ භික්‍ෂුහට සැතපෙන්නට ය යි අනුදන්නා ලද මධ්‍යමයාමය පැමිණි කල්හි දු පමා බැවිහි භයින් නො සැතපී හැද තගා දහවල් නිරාහාර වැ කමටහන් ම මෙනෙහි කරණසේක.

ඉක්බිති මුන් වහන්සේ බඩ පහරිණා ශස්ත්‍රක නම් රුජාවෙකින් කමටහන් මෙනෙහි කෙරෙමින් ම මළසේක. මෙසේ ඔවුන් වහන්සේ සත්මින්හි ම කාලක්‍රියා කොට රහත් වන්නට සුදුසු මුහු කල කුසලක් නැති බැවින් ආශ්‍රවක්‍ෂයට නො පැමිණැ ම (මියා) තවුතිසාභවනයෙහි මහාවිමන් දොරැ නිද පුබුද්දක්හු මෙන් උපන් සේක එකෙණෙහි ම ඔවුන්ට දෙව්ලොවිහි නැඟූ රත්තොරණක් සේ තුන්ගවුවක් පමණ ශරීරය පැණී ගියේ

ඉක්බිති ඇතුළුවිමන්හි දහසක් පමණ දෙවුදූහු විමන් දොරැ පැණී ගියහ. දිව්‍යස්ත්‍රීහු ද "විමානයට ස්වාමි වූ දිව්‍යපුත්‍රයා ආ ය. ඔහු අල්වමිහ" යි කියා බෙර ගසන්නට ගී කියන්නට වන්හ. දෙව්පුත් ද තව දක්වා මළබව නො දන්නේ "මම මහණෙමි ය" යන සිතින් ම දිව්‍යස්ත්‍රීන් බලා විහාරසම්පයට ආවා වූ මාගම්හ දුකැ ලජ්ජා වූ පාංසුකූලිකභික්‍ෂුවක්හු මෙන් මන්තෙහි තුඹු දූහුල එකත්පස කොට දසරූව වසා ගෙණැ කර නමා සිටියේ ය.

දෙවිදූ ද ඔවුන්ගේ කායවිකාරයෙන් ම "ශ්‍රමණදිව්‍යපුත්‍ර යෙකැ" යි දැනැ "දිව්‍යපුත්‍රයෙනි, "මේ දෙව්ලොව ය. මහණ ධම් පුරන්නට අවසරයෙක් නො වෙයි. සම්පත් විඳින්ට අවසර ය" යි කීහ. තව ද, දිව්‍යපුත්‍ර එ ම ලෙසින් සිටියේ දෙවිදූ ද "තව දක්මා මොහු මළබව නො දනිති" යි දිව්‍යබෙර ගැසූහ. එකල්හි ද කර නො නගා එ ම සෙයින් සිටියේ.

ඉක්බිති දෙව්දූ ඔවුන්ගේ සියලු ශරීරාවයව පෙණෙන මහා කැඩපතක් සෑදූ. දිව්‍යපුත්‍රතෙම තමාගේ ඡායාව දැක මළබව දැන "මා විසින් මෙවැනි සම්පතක් පතා මහණදම් නො පුරණ ලදැ. උතුම් වූ රහත්බව පතා පුරණ ලදැ"යි සිතා සම්පත්තියෙහි කලකිරී "මේ දෙව්ලොවෙහි සැපත් නම් ලබන්නට පිළිවන. "බුදුන් උපදීම් නම් ඉතා නොලැබෙ"යි සිතා විමානයට නො වැද අඛණ්ඩසීලයෙන් දිව්‍ය ස්ත්‍රීන් පිරිවරා සපීළෙයන් වහන්සේ සමීපයට ගොස් ශ්‍රීපාදය වැඳ එකත් පස් ව සිටියේ ය. මෙසේ තිරසාර වූ රුදමල් කමවනන් මෙනෙහි කොට සිය දෙව්ලොවහි උපැද තමන් වහන්සේගේ ශරීරාවයව කැඩපතින් දක්නා තුරා "මම මහණෙම ම ය"යි සිතා පිරිසුදු කොට සීලය රක්‍ෂා කළ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහසඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 28. බමුණු වත

තව ද, පාටලිපුත්‍ර නම් නුවර බමුණෝ දෙදෙනෙක් කාලවල්ලි නම් මණ්ඩපයෙහි වසන්නා වූ මහානාගතෙරුන් වහන්සේගේ ගුණකථා අසා "අප ඔවුන් වහන්සේ අවශ්‍යයෙන් දුටමැනැවැ"යි සිතා දෙදෙන ම නික්මුනාහ. එකෙක් අතරමඟ ම මළේ. අනිකා මුහුදුකොලට පැමිණැ නැව් නැඟී මාවතුතොට බැස නුවරට අවුත් කාලවල්ලි නම් මණ්ඩපය කොහිදැ?"යි විචාරා "රුහුණ ය" යනු අසා අනුක්‍රමයෙන් තෙරුන් වහන්සේ වසන තැනට පැමිණැ සුලුගම් නුවර එක ගෙයෙක්හි ලැග්ගේ.

බ්‍රාහ්මණ උදෑසන ම තෙරුන් වහන්සේට අහර සපයා තෙරුන් වහන්සේ වසන තැන් විචාරා ගොස් නාගතෙරුන් වහන්සේ දැක සිටි තැන්හි ම සිට වැඳ නැවත ඔවුන් වහන්සේ සමීපයට එළඹ ගොප්ඵය දැඩි කොට අල්ලා ගෙණැ "ස්වාමීනි, නුඹවහන්සේ ඉතා උත්තමයෙක. නුඹවහන්සේගේ ගුණ වූකලි මහාසාගරය මතුමත්තෙහි සියලු දඹදිව්තලෙහි පැතිරී ගියේ. මම ද පාටලීපුත්‍ර නම් නුවර හුන්නෙම්, නුඹ වහන්සේගේ ගුණ කථාව අසා ආමි"යි කියා තෙරුන් වහන්සේට ආහාර පිළිගන්වා තමන්ට තුන්සිවුරු සපයා තෙරුන් වහන්සේ සමීපයෙහි පැවිදි වී ය. ඔවුන් වහන්සේ මහානාගතෙරුන් වහන්සේගේ අවවාදයෙහි සිටැ කීප දවසකින් විදර්ශනා වඩා රහත් වූ සේක.

මෙසේ රුහුණෑ කාලවල්ලිමණ්ඩපයෙහි වැසෑ ද තමන් වහන්සේගේ ගුණසුවඳ මහාසාගරය ඉක්මෑ සියලු දඹදිව තෙලෙහි පතුරුවා පිරිසුදු කොට සිල් රක්‍ෂා කළ මේ මහානාග තෙරුන් වහන්සේ හා ඔවුන් වහන්සේගේ අවවාදයෙහි සිටෑ භාවනා වඩා රහත් වූ වහන්සේ හා මොවුන් දෙදෙනාවහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසඞ්ඝයාවහන්සේ සරණ යෙමි යි සඞ්ඝසරණ යා යුතු.

---

## 29. කුදුතිස් තෙර වත

තව ද සැදැහැතිස් රජ්ජුරුවෝ "ස්වාමිනි, මා වැන්දෑ යුතු එක් ආශියක් වහන්සේ කෙනෙකුන්දෑ වදාළ මැනැවැ"යි භික්‍ෂූන් වහන්සේ විචාළහ. වහන්සේ වරුන්දෑ ද "මහරජ, මහළු වැසි වූ මහාබුජ්ජතිස්ස නම් තෙරුන් වහන්සේ වැන්දෑ යුතු ය"යි වදාළ සේක.

එක්බිති රජ්ජුරුවෝ මහපෙරහරින් පන්සොදහක් පමණ මිග ගෙවා තෙරුන් වහන්සේ සමීපයට ගියාහ. තෙරුන් වහන්සේ "ඇවැත්නි, මේ කොයි අරගලයක් දැ?"යි භික්‍ෂූන් වහන්සේ විචාළසේක. වහන්සේ වරුන්දෑ ද "ස්වාමිනි, රජ්ජුරුවෝ නුඹ වහන්සේ දක්නට එන්නෝ ය"යි වදාළසේක. බුජ්ජතිස්ස නම් තෙරුන් වහන්සේ ද "දැන් මා මාලු වෑ ගියෑ කල්හි රජගෙයි කර්මාන්තයෙන් සැනෙනු කිම්දෑ?"යි සිතා වදුරා දවහල් සිදිනා හැන්ති වැඩෑ සිද බිමෑ සිරි අඳනට වන්සේක. රජ්ජුරුවෝ "බුජ්ජතිස්ස තෙරුන් වහන්සේ කොයි දැ"යි විචාරා දහවල් වැඩෑ සිටිනා සැතැ ය"යි අසා එතැනට ගොස් තෙරන් වහන්සේ බිමෑ සිරි ඇඳෑ ඇඳෑ වැඩෑ හුන්නා දැක "ක්‍ෂීණාශ්‍රවයන්ගේ නම් සත්කාරයක් නැත. මොවුන් වහන්සේ ක්‍ෂීණාශ්‍රව නො වන සේකැ"යි නො වැඳෑ ම නික්මුනාහ.

එක්බිති භික්‍ෂුසඞ්ඝයා වහන්සේ "ස්වාමිනි, මෙවැනි සැදැහැ ඇති රජ්ජුරුකෙනෙකුන් සැ වර සෙයකින් කළකිරවූසේක් දැ?"යි විචාළයෙහ. බුජ්ජතිස්සතෙරුන් වහන්සේ "ඇවැත්නි, රජ්ජුරු වන්ට ප්‍රසාද එළවීම් නොපව බැරි නො වේය"යි වදුරා පසු වෑ නිරුපධිශෙෂනිර්වාණධාතුවෙන් පිරිනිවන් පාසාසේක්. "ඇවත්නි, මාගේ කුටාගාරයේ අනික් පලගකුත් පණවව"යි භික්‍ෂුසඞ්ඝයා වහන්සේට වදාළසේක.

තෙරුන් වහන්සේ වදාළ පරිද්දෙන් අහස් පලඟක් පැණවූ කල්හි බුජ්ජතිස්සතෙරුන් වහන්සේ "මේ කූටාගාරය අහස් තැනෙක්හි නො පිහිටා රජ්ජුරුවන් දුටුවිට ම බිමැ පිහිටාවා"යි කියා අධිෂ්ඨාන කොට පිරිනිවන් පා වදාළසේක.

ඉක්බිති කූටාගාරය පස්සොදුන් මග ගෙවා අහස්හි ම ගියේ. පස්සොදුන් මගැ දද උසුලන්නව පොහොසත් වාසයෝ දද උසුලූහ. පතාකා උසුලන්නව පොහොසත් වාසයෝ පතාකා උසුලූහ. ඒ සා මග වනකොල ලැහැප්මුළුල්ල කූටාගාරය තුබූ දිසාමට නැමී ගියේ.

ඉක්බිති මහත්සේ වහන්ද "තෙරුන් වහන්සේ පිරිනිවී සේක. කූටාගාරය අහසින් ම එබ යෙ"යි කියා හැඳගැතිත් රජ්ජුරුවන්ට පණක් යැවූසේක. රජ්ජුරුවෝ නො හැඳුහුහ. කූටාගාරය අහසින් ම ගොස් ථූපාරාමය දකුණත්පස් කොට ගෙණැ ගල්දුහැබ් පිහිටි තැන්හි සිටියේ. දුහබ් ද හලව්ව හැ එක් වැ අහසට පැන නැගී කූටාගාරය මත්තෙහි පිහිටියේ ය. රැස්වූ මහාජනයා සාධුකාර දහස්ගණින් පැවැත්වූහ.

එකෙණෙහි ඔගාවංශ නම් තෙරුන් වහන්සේ ලෝවා මහාපායේ එක් කන්කුලෙක්හි වැඩැ හිඳැ භික්ෂූන් වහන්සේට විනයකර්ම කරණසෙයෙක් ඒ මිහත් කොලාහලය අසා "මේ කුමක අරගලයෙක්ද?"යි විචාළ සේක. භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, මිහුණු වැසි බුජ්ජතිස්ස තෙරුන් වහන්සේ පිරිනිවන් පෑසේක. කූටාගාරය පස්සොදුන් මග ගෙවා අහසින් ම ආ ය. එතැන්හි මේ සාධුකාර දෙන හඬය"යි කීසේක.

ඔගාවංශ නම් තෙරුන් වහන්සේ "ඇමැත්නී, පින්වතුණ් නිසා මේ මැනී පූජාවක් ලබම්හ"යි කියා අතැමැස්සන් සමා කරවා අහසින් අවුත් කූටාගාරයට වැද දෙමින පලඟ වැද හෙව නිරුපධිශෙෂනිර්වාණධාතුයෙන් පිරිනිවන් පෑසේක.

ඉක්බිති රජ්ජුරුවෝ ද නොයෙක් සුවඳමල්සුවඳසුනු ආදී වූ පූජාඋපකරණ ඇරැ ගෙණැ ගොස් අහස බමබමා සිටි කූටාගාරය දැකැ මහසොම්නසින් පිණා ගියාහු කූටාගාරයට පූජා කළාහ. එකෙණෙහි කූටාගාරය අහසින් බැසැ පොළොව පිහිටියේ. රජ්ජුරුවෝ මහ පෙරහරින් ආදහනකෘත්‍යය කරවා ධාතූන් වහන්සේ ගෙණැ මහ දාගබක් බැඳැවූහ.

මෙසේ තමන් වහන්සේ අධිෂ්ඨානබලයෙන් පිරිනිවන් පෑ කල්හි පොවා පස්සොදුන් මග මූළුල්ලෙහි ඒ සා මහවල කූටාගාරය

දිසාවට නමා එක හෙලා මහාජනයා මුදුනෙහි දෙහොත් තබවා මහ පෙළහර දක්වා වදාළ, හැල් වපුරණ හැල්කෙතක් සේ මහාජනයා වපුරණ කුසල් නැමැති බිජුවට මහාඵල මහානිසංස කරන්නා වූ සරුකෙතක් බඳු වූ, බුදුසස්නෙහි නඟා ලූ අසහායධවජයක් බඳු වූ මහා ක්ෂීණාශ්‍රව වූ, මේ බුජ්ජනීස්සතෙරුන් වහන්සේ හා මහාවංශ නම් තෙරුන් වහන්සේ හා දෙදෙනා වහන්සේ ඇදි කොට සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙම් යි සඟසරණ යා යුතු.

---

## 30. ලදරු භික්ෂු වත.

තව ද, මහගම තිස්සමහාවෙහෙර වසන ලදරු එක් භික්ෂූන් වහන්සේ කෙනෙක් "දීඝවාපියෙහි මහාජාතකභාණක නම් තෙරුන් වහන්සේ ගාථා දහසකින් හෙබි මහාවෙස්සන්තර ජාතකය වදාරණසේකැ" යි අසා තිස්සමහාවෙහෙරින් නික්මැ එක දවසින් නවයොදුන් මග ගෙවා වැඩිසේක. ලදරු භික්ෂූන් වහන්සේ දුරුකතර ගෙවා අවුත් ම විඩා වැ බණ ඉඳුරා ඇසිය නො හී තෙරුන් වහන්සේ බණ වදාරා වඩනා වේලෙහි "මා ආ ගමන් සිස් වැ ගියේ ය" යි කියකියා හඬහඬා සිටිසේක.

එක් මිනිසෙක් ඔවුන් වහන්සේගේ බස් අසා ගොසින් "ස්වාමීනි, නුඹ වහන්සේගේ බණ අසම්" යි කියා එක් ලදරු භික්ෂූන් වහන්සේ කෙනෙක් තිස්මහාවෙහෙර සිටැ අවුත් ගමන් විඩා බැවින් බණ ඉඳුරා ඇසිය නො හී 'මා ආ ගමන් සිස් වැ ගියේ ය' යි කියකියා හඬහඬා සිටිසේකැ" යි කියා තෙරුන් වහන්සේට දැන්වී ය. තෙරුන් වහන්සේ "යව. සෙට බණ කියනබව කියා ඔවුන් සන්හිඳුවව" යි වදාළසේක. හෙ ද එපවත් භික්ෂූන් වහන්සේට සැලකෙළේ. ඔවුන් වහන්සේ නැවැත දෙවන දවස තෙරුන් වහන්සේ වදාරණ බණ අසා සෝවාන් වූසේක.

මෙසේ සඞ්ඝයෙහි කළ අදහසින් ම නවයොදුන් මග ගෙවා අවුත් තෙරුන් වහන්සේ සම්පයෙන් බණ අසා අමාමහනිවන් දුටු මුන් වහන්සේ ඇදි කොට සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙම් යි සඟසරණ යා යුතු.

# 31. සභිය තෙර වත*

තව ද, කාශ්‍යපසම්බුදුන් වහන්සේ පිරිනිවීසමයෙහි ඔවුන් වහන්සේගේ ධාතු ගෙණ රන්දාගබක් බැඳිකල කුලපුත්‍රයෝ තුන් දෙනෙක් (සම්මුඛ) ශ්‍රාවකයන් වහන්සේගේ සමීපයෙහි පැවිදි වැ තමන් වහන්සේගේ චරිතයට අනුකූල වූ කමටහන් ගෙණ පසල් දනව්වට ගොස් වල්විහාරයෙක වැසැ මහණදම් පුරණසේක. අතුරතුරෙහි දාගැබ්වහන්සේ වඳිනු පිණිස ද බණ අසනු පිණිස ද නුවරට වඩනාසේක.

මෙසේ තුන්දෙනා වහන්සේ නො පමා වැ වසනසේක් කිසි ගුණවිශෙෂයක් උපදවා ගත නො හුනහ. ඉක්බිති තුන්දෙනා වහන්සේ "ඈපි පිඬු සිගා ඇවිදිනා බැවින් ජීවිතයෙහි ආලය ඇත්තම්හ. ජීවිතයෙහි ආලය ඇත්තවුන් විසින් නම් ලොවුතුරු දහම් පසක් කරන්නට නො පිළිවන. පුහුදුන් වැ මියැ යාම ඉතා දුක. එහෙයින් ඈපි හිණක් බැඳැ ගල් මුඳුනට නැගී කායජීවිත දෙක්හි ආලයක් නැති වැ මහණදම් පුරම්හ" යි කියා හිණක් බැඳැ ගල්මුඳුනට නැගී හිණ හෙළූසේක.

ඉක්බිති ඔවුන් වහන්සේ අතුරෙන් මහතෙරුන් වහන්සේ මුහු කළ කුසල් ඇති හෙයින් එදවස ම සිවුපිළිසිඹියා පත් රහත් වැ සෘද්ධියෙන් හිමාලයට ගොස් අනොතත්තවිලින් මුව සෝධා උතුරුකුරුදිවයිනින් පිඬු සිගා අහර වළඳා නැවත පිඬු සිගා පාත්‍රය පුරා ගෙණ අනොතත්ත විලින් පැන් හා නාලිය දැහැටිදඬු හා ඇර ගෙණ දෙදෙනා වහන්සේ සමීපයට අවුත් "ඇවැත්නි, මාගේ ආනුභාව බලවු. මේ උතුරුකුරු දිවින් ගෙණා ආහාර ය. මේ හිමාලයෙන් ගෙණා පැන් හා දැහැටි දඬු ය. මේ ආහාර වළඳා මහණ දම් පුරව්. මම මෙ ම ලෙසින් තොපට උපස්ථාන කෙරෙමි" යි වදාළසේක. දෙදෙනා වහන්සේ තෙරුන් වහන්සේගේ බස් අසා "ස්වාමීනි, තුඹ වහන්සේගේ කට යුතු නිමියේ ය. තුඹ වහන්සේ හා කැටි වැ බිණීම් පමණකුදු අපට ප්‍රපඤ්ච ය. සිය් වැ කල් නො ගෙවමු. මෙතැන් පටන් නැවැත අප සමීපයට නො වැඩිය මැනැවැ" යි වදාළසේක. තෙරුන් වහන්සේ ද කිසි පරිද්දෙකිනුදු දෙදෙනා වහන්සේ ගිවිස්වා ගන්නට නො පොහොසත් වැ වැඩිසේක.

---

* මේ කථාව සුත්තනිපාතඨකථාවෙහි සභිය සුත්‍ර අටුවාව බලා ලියූවකි. සෙසු පොත්හි එන මේ කථාව හා මෙහි සමහර තැන් නො ගැළපේ. අම්බාවතුම්රගේ අටවැනි පරිච්ඡේදය ද සසඳනු.

ඉක්බිති දෙදෙනා වහන්සේ අතුරෙන් එක් කෙනෙකුන් වහන්සේ දෙතුන්දවසක් ඇමැමෙන් පඤ්චාංගික අෂ්ටසමාපත්ති උපදවා අනාගාමී වූසේක. ඔවුන් වහන්සේ ද උතුරුකුරුදිවින් අහර හා හිමාලයෙන් පැන් හා දැහැටිදඬු හා ගෙණැ ඇරැ "මේ අහර වැළඳුව මැනැවැ" යි කී කල්හි අනික් වහන්සේ ද ඒ ආරාධනා නො ඉවසා "නුඹ වහන්සේ වැඩිය මැනැවැ" යි කියා ඒ වහන්සේ නගා යවා වීර්‍ය්‍යය වඩනාසේක් ගල් මුදුනට නැගි දවසින් සත්වන දවස කිසි ගුණවිශෙෂයකට නො පැමිණැ මියැ දෙව්ලොවැ ඉපැද අපමණ දිව්‍යසැපත් වළඳා එයින් චුත වැ එක්තරා පරිබ්‍රාජිකා කෙනෙකුන් බඩැ පිළිසිඳැ ගත්සේකැ. ඔහු ක්‍රමයෙන් වැඩී කට යුතු දන්නා වයසට පැමිණැ සභිය නම් පරිබ්‍රාජක වැ නොයෙක් ශාස්ත්‍ර ගෙවා දැනැ මහාවාදී වැ, විව ද කරුණු කැමැති වැ දඹදිව තෙලෙහි ඇවිදිනාහු තමන් හා සුදුසු එක ද වාදියකු නො දැකැ, නුවරැ දෙරැ පන්සලක් කරවා වසන්නාහ.

ඉක්බිති මොවුන් හා සබඳ වූ සුද්ධාවාස බ්‍රහ්මතෙම සමාපත්තියෙන් නැගී ඒ යහළුවා සි කරන්නේ "දඹදිවැ ඉපැද, සභියයන් වහන්සේ ලොවැ පහළ වූ බවත් නො දැනැ, හිදී. මොහු බුදුසස්නෙහි මහණ කරවුව මැනැවැ" යි සිතා අවුත් මහණ කරවා ගියේ ය. ඉක්බිති ඔවුන් වහන්සේ ද මුහු කළ කුසල් ඇති බැවින් පැවිදි වූ කෙණෙහි ම විදර්ශනා වඩා රහත් වූසේක. මෙසේ කායජීවිතයෙහි ඇලුම් පියා මෙ වැනි සහයක් කොට රූක්ෂප්‍රතිපත්තිය මස්තක ප්‍රාප්ත කොට අමාමහනිවන් දුටු මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 32. මහාතිස්ස තෙර වත.

තව ද, දිව්‍යකන්‍යාවක සෙයින් ඉතා මනහර වූ එක්තරා කුල දුවක් සැදී පැහැදී උදෑසන ම තමාගේ ස්වාමිහු හා ඩබර කොට නුවරින් නික්මැ නෑයන් බලා යන්නී අතරමග චෙතිය නම් පර්වතයෙහි සිටැ නුවර සිඟා වඩනා මහාතිස්ස තෙරුන් වහන්සේ දැකැ ඔවුන් වහන්සේ කෙරෙහි පිළිබඳ වූ සිත් ඇත්තී මහත් කොට සිනා සීපුව. තෙරුන් වහන්සේ ද "මේ කිමෙක් දැ?" යි බලා වදුරණ සේක් ඇගේ දත්ඇටෙහි අශුභසංඥා ලදින් එතැන්හි සිටැ ම රහත් වූසේක.

ඉක්බිති මේ කුලදූමගේ ස්වාමි ද මග ගොස් යන්නේ වඩනා තෙරුන් වහන්සේ දැක "ස්වාමීනි, ගැණියක දුටුසේක් දැ?" යි විචාළේ. තෙරුන් වහන්සේ "ගැණියක, පිරිමියෙකැයි නො දනුම්හ. එතෙකුදු වුවත් මේ මගවන ඇටසැකිල්ලෙක් යෙමින් සිටියේ ය" යි වදාළ සේක. මෙසේ තමන් වහන්සේ ඉදිරියෙහි සිනා පහළ කළ ගෑනැණියගේ දත් බලා 'ඇටෙක' යන සංඥා ලදින් එකෙණෙහි ම විදර්ශනා වඩා රහත් වූ මොවුන් වහන්සේ ආදි කොට සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමි යි සඟ සරණ යා යුතු.

---

## 33 සක්පල් තෙර වත.

තව ද, චක්ඛුපාල නම් තෙරුන් වහන්සේ මස් එළඹෙන දවස භික්ෂුසඞ්ඝයා වහන්සේ කැඳවා "ඇවැත්නි, මේ තුන්මසැ කී ඉරියව්වෙකින් දවස් යවවු දැ?" යි විචාළසේක. භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, සතරඉරියව්වෙකින් දවස් යවම්හ" යි වදාළසේක. "ඇවැත්නි, මේ තොපට නිදීම් සුදුසු දෙයෙක් දැ? තො පමා වුව මනා වේ දැ? ඇපි ජීවත් වන්නා වූ සමිඳෙයන් වහන්සේ සමීපයෙන් කම්ටහන් ගෙණැ ආම්හ. බුදුහු නම් වළොවා ඇති එකක්හු විසින් ආරාධනය කට හැක්කාහු නො වෙති. පමා නැතැත්තහුට සතරඅපාය තමාගේ ම ගෙය වන්නේ ය. එහෙයින් "ඇවැත්නි, තො පමා වවු" යි වදාළසේක. භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, නුඹ වහන්සේ කී ඉරියව්වකින් දවස් යවනසේක් දැ?" යි විචාළසේක. තෙරුන් වහන්සේ "ඇවැත්නි, තුන් ඉරියව්වෙන් දවස් යවම්. පිට දික් කොට නො පිළම්" යි වදාළසේක.

මෙසේ වහන්සේ වරැත්දූව අවමාද දී නො නිදා අනවරත යෙන් විශ්‍රී වඩන්නා වූ ඔවුන් වහන්සේගේ ඇසැ මසක් ඇවෑමෙන් රූජාවෙක් ඇති වි ය. සිදුරු ඇති කළෙයින් පැන් දහර මෙන් ඇසින් දියදහර වැගෙන්නට වන. ඔවුන් වහන්සේ රෑ මුළුල්ලෙහි මහණබම් පුරා අරුණු නැගෙන වේලෙහි ගබඩාවට වැද වැඩැ හිඳිනාසේක. සිඟා වඩනා වේලෙහි වහන්සේ වරැත්දූ තෙරුන් වහන්සේ සමීපයට ගොස් "ස්වාමීනි, සිඟා වඩනා වේලා ය" යි කල් දන්වනසේක. තෙරුන් වහන්සේ "එසේ නම්, ඇවැත්නි, සිවුරු ගන්ව" යි වදාරා වඩනාසේක.

භික්ෂූන් වහන්සේ තෙරුන් වහන්සේගේ ඇසින් දිය වැගෙන්නා දැකැ "ස්වාමීනි, මේ කිමෙක් දැ?"යි විචාළසේක. තෙරුන් වහන්සේ "ඇවැත්නි, ඇස රුජාවෙක් පහරණේ ය"යි වදාළසේක. ඉක්බිති වහන්සේ මරුත්ද "ස්වාමීනි; එක් වෙදෙක් විසින් පවරණ ලද්දෙමු. ඔහුට කියමෝ දැ?"යි විචාළසේක. "ඇවැත්නි, යහපතැ"යි වදාළසේක. භික්ෂූන් වහන්සේ වෙදුට එපවත් හැළකළසේක.

ඉක්බිති වෙද (තෙමේ) තෙරුන් වහන්සේට තෙලක් පිසැ එවී ය. තෙරුන් වහන්සේ නාසයෙහි තෙල් වැඩැ හිඳැ ම වත් කොට ඇතුළු ගමට සිගා වැඩිසේක. වෙද සිගා වැඩි තෙරුන් වහන්සේ දැකැ "ස්වාමීනි, දුන් තව ඇසැ රුජාම ඇද්දැ?"යි විචාළේ. "එසේ ය, උපාසකයෙනි"යි වදාළසේක. ඉක්බිති වෙද "ස්වාමීනි, මම තෙලක් පිසැ යැවීමි නාසයේ වත්කෙළේ ඇද්දැ?"යි විචාළේ. තෙරුන් වහන්සේ "උපාසකය, නාසයෙහි වත් කළම ය"යි වදාළසේක. වෙද "ස්වාමීනි, දුන් කෙබඳු දැ?"යි විචාළේ. තෙරුන් වහන්සේ "උපාසකය, රෙදේ ම ය"යි වදාළසේක. ඉක්බිති වෙද "මා විසින් එක වරින් ම රුජාව සන්සිඳෙන්ට සුදුසු තෙල පිස යවන ලද. රුජාව නො සන්සිඳුනේ කුමක් දෝ හෝ?"යි සිතා "ස්වාමීනි, නුඹ වහන්සේ නාසයෙහි තෙල් වැඩැ හිඳැ වත්කළසේක් දැ? නොහොත් වැඩැ හෙවැ වත්කළසේක් දැ?"යි විචාළේ. තෙරුන් වහන්සේ මුවෙන් නො බිණූසේක. තෙරුන් වහන්සේ නැවත නැවත විචාරණ ලදසේත් නො වදාළසේක් ම ය. ඉක්බිති වෙද "ස්වාමීනි, වැඩිය මැනවැ"යි කියා තෙරුන් වහන්සේ හා (යවා) විහාරයට ගොස් තෙරුන් වහන්සේ වසන තැන් බලන්නේ සක්මන් කරණ තැන් හා හිඳිනා තැන් මතු දැකැ වැඩැ හොත්නා තැන් නො දැකැ නැවත "ස්වාමීනි, නාසයෙහි තෙල වැඩැ හිඳ වත්කළසේක් දැ? නොහොත් වැඩැ හෙවැ වත් කළසේක් දැ?"යි විචාළේ.

තෙරුන් වහන්සේ මුවෙන් නො බිණූසේක. ඉක්බිති වෙද "ස්වාමීනි, එසේ නො කොට වදාළ මැනව. මහණධම් නම් ශරීරය යැපෙන කල්හි කරන්නට පිළිවන. වැඩැ හෙවැ නස්‍ය කොට, වදාළ මැනැවැ"යි කියා නැවත නැවත ආරාධනා කෙළේ. තෙරුන් වහන්සේ "උපාසකයෙනි, යව. මන්ත්‍රණය කොට පියා තව යුතු දන්නමෝ වේ දැ"යි වදාළසේක. තෙරුන් වහන්සේට එහි මන්ත්‍රණය කරන්නට සුදුසු නෑදෑ කෙනෙක් නො ද ඇත. එතෙකුදු වුවත් කරජකායය හා මන්ත්‍රණය කරණසේක් "ඇවැත්නි, පාලිතය, කිය. තෝ තාගේ ඇස බලයි දැ? නොහොත් බුදුසස්න

බලයි ද? කොලුමිරක් නැති සසරවට ඇය් නැති කල් ගණන් නැත. නොපෙනෙන දහස් සුවහස්ගණන් සම්බුදුවරයෝ ඉක්මී ගියහ. ඔවුන් අතුරෙන් එක ද සම්බුදු කෙනෙකුන් කෙරෙහි නුපුරුද්දෙහි දුන් මේ අතැවස් තුන්මසැ ගෝනා දූෂෙන පිට නො පාර වමිනී සිතින් දුබ් කොටැ ඉටහලද. එහෙයින් තාගේ ඇස නැසී යෙව යි; බිඳී යෙමයි; ලොවුතුරා බුදුන් නියොගය නො ඉක්මමි"යි වදුරා මෙසේ තමන් වහන්සේගේ භූතකායයට ම අවවාද දී වැඩැ හිඳැ ම. නාසයෙහි තෙල් මත් කොට ගමට පිඩු සිගා වැඩියේය.

ඉක්බිති වෙද තෙරුන් වහන්සේ දැකැ "ස්වාමීනි, නාසයෙහි තෙල් වත් කළසේක් ද?"යි විචාළේ. තෙරුන් වහන්සේ "එසේ ය උපාසකය, තෙල් වත්කළමැ"යි වදාළසේක. වෙද "ස්වාමීනි, රුජා කෙබඳු ද?"යි විචාළේ. තෙරුන් වහන්සේ "ඇස රෙදේමැ"යි වදාළසේක. වෙද "ස්වාමීනි, වැඩැ හිඳැ නස්‍ය කළසේක් ද? වැඩැ හෙවැ නස්‍ය කළසේක් ද?"යි විචාළේ. තෙරුන් වහන්සේ මුවෙන් නො බිණූසේක. නැවත නැවත විචාරණ ලදසේක් ද කිසිවක් නො වදාළසේක. ඉක්බිති වෙද "ස්වාමීනි, නුඹ වහන්සේ සැපයක් නො කරණසේක. අද පටන් 'අසුවල් වෙදු විසින් මට තෙලක් එවන ලදැ'යි නො වදාළ මැනැව. නැවත මම ද 'නුඹ වහන්සේට තෙලක් පිසැ ගැවීමි'' යි කියමක්හට නො කියමි'' යි කී ය. ඉක්බිති තෙරුන් වහන්සේ විහාරයට ගොස් "මහණ, තෝ වෙදහු විසින් හරණ ලද්දෙහි ය. ඉරියව්ව නහමින් හරව'' යි කියා තමන් වහන්සේට අවවාද දී මහණදම් පිරූසේක. ඉක්බිති මධ්‍යමයාමය ඉකුත් වූ කල්හි තෙරුන් වහන්සේගේ ඇස ද සියලු කෙලෙස්හු ද පසු පෙරටු නො වැ එකවිට ම බිඳුනාහ

මෙසේ කායජීවිතයෙහි ඇලුම් පියා සම්බුදුයන් වහන්සේ වදාළ ප්‍රතිපත්තියට කිසි විරුද්ධයක් නො කොට රූඪප්‍රතිපත්තියෙහි මස්තකප්‍රාප්ත වැ අමාමහනිවන් දුටු චක්ඛුපාල මහතෙරුන් වහන්සේ ආදි කොට සුපිළිපන් වූ මහාසංඝයා වහන්සේ සරණ යෙමි යි සඞ්ඝසරණ යා යුතු.

---

## 34. මලියදෙව තෙර වත.

තව ද, තාම්‍රපර්ණිද්වීපයෙහි මලියදෙව නම් තෙරුන් වහන්සේ සිතුල්පව්වට වැඩියේක. එසමයෙහි සිතුල්පව්විහාරයෙහි සැටවසට වැඩියක් වය ඇති මහතෙරුන් වහන්සේ මහපොකුණෙහි තුරවන නම් තොටට පැන් සනහන පිණිස බටසේක.

ඉක්බිති මලියදේව නම් තෙරුන් වහන්සේ මහතෙරුන් වහන්සේ සමීපයට ගොස් "ස්වාමීනි, තගවම් දැ?" යි විචාළසේක. මහතෙරුන් වහන්සේ ද පිළිසඳර කථා කිරීමෙන් ම "මූ මලියදේව නම් තෙරහු ය" යි දැන, "ඇවැත්නි, තෙපි දෙව නම්හු දැ?" යි විචාළසේක. ඔවුන් වහන්සේ ද "එසේ ය. ස්වාමීනි, දෙව නම්මි" යි කීසේක. මහතෙරුන් වහන්සේ "ඇවැත්නි, සැටඅවුරුද්දක් මාගේ ශරීරයෙහි කිසිවක්හුගේ අත නො පහළ. වැළි තෙපි මං අද නාවා පියව" යි වදුරා වැඩ හුන්සේක. ඉක්බිති මලියදේව තෙරුන් වහන්සේ අත් පා උළා මහතෙරුන් වහන්සේ නාවා වදාළසේක. මහතෙරුන් වහන්සේ "ඇවැත්නි, අපට බණක් දෙසන්නට පිළිවන් දැ?" යි වදාළසේක. මලියදේව තෙරුන් වහන්සේ "ස්වාමීනි, යහපතැ" යි පිළිගත්සේක. හිරගල ගෙන වේලෙහි බණ අසන්නට හඬ ගැහුහ.

ඉක්බිති සැටවසට මැඩියක් වස් ඇති මහතෙරුන් වහන්සේ සැටදෙනෙක් වැඩිසෙයෙන. මලියදේව නම් තෙරුන් වහන්සේ ඡඡකක නම් සූත්‍රදේශනාව කොට වදාළසේක. සූත්‍රය දෙසා අන්තයෙහි මහතෙරුන් වහන්සේ වරුන්ද සැටෙක් රහත් වූසේක. පසු ව උන් වහන්සේ මහාවිහාරයට ගොස් එ ම සූත්‍රය දෙසා වදාළසේක, එහි ද සැටක් පමණ තෙරුන් වහන්සේ වරුන්ද රහත් වූසේක. පසළොස්වක් ලද පොහෝදවස් පායෙහි මතුමාලෙහි හිඳ බණ වදාළසේක. එහි ද සැටක් පමණ තෙරුන් වහන්සේ වරුන්ද රහත් වූසේක. මෙසේ මලියදේව නම් තෙරුන් වහන්සේ මේ ඡඡක්ක සූත්‍රය දෙසා වදාළ කල්හි සැටක් සැටක් පමණ වහන්සේ වරුන්ද රහත් වූසේක. මෙසේ මලියදේව නම් තෙරුන් වහන්සේ දෙසූ බණ අසා එකෙණෙහි ම රහත් වූ මේ වහන්සේ වරුන්ද ආදි කොට ඇති සුපිළිපන් වූ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 35. මහානිස්සභූති තෙර වත

තව ද, මණ්ඩලාරාමවිහාරයෙහි වසන මහානිස්සභූති නම් තෙරුන් වහන්සේ ගමට පිඬු සිඟා වන්සේක් ගැණු අරමුණක් දැක එහි පිළිබඳ සිත් ඇති වූසේක. ඉක්බිති ඔවුන් වහන්සේ විදර්ශනායෙන් කෙලෙසුන් ඔබා නැවැත විහාරයට වැඩිසේක. ඔවුන් වහන්සේට ස්වප්නයෙහි ද ඒ ගැණුඅරමුණ වැටහෙයි.

ඉක්බිති ඔවුන් වහන්සේ "මේ කෙලෙස්හු වැඩී මා අපායෙහි හෙළන්නාහු ය" යි කළුකිරි විහාරයෙන් නික්ම, මහාසඞ්ඝරක්ඛිත නම් තෙරුන් වහන්සේ වෙතට පැමිණ, ඔවුන් වහන්සේගෙන් කමටහන් ගෙණ, එක්තරා ලැගැබකට වැද පංසුකූලචීවරය අතුට වැඩැ හිඳ, අනාගාමිමාර්ගයෙන් පඤ්චකාමයෙහි ඇලුම් සිඳ, හුනස්නෙන් නැගී ආචාර්යයන් වහන්සේ වැද, දෙවන දවස පාළි වචනය උගන්නට වැඩිසේක. මෙසේ තමන් වහන්සේගේ සිත හටගත්තා වූ කෙලෙසුන්ට නිග්‍රහ කොට සුදුසු කමටහන් ලදින් භාවනා කොට විදර්ශනා වඩා ලොවුතුරුදහම් පසක් කළ මේ මහාතිස්සභූති නම් තෙරුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 36. දීඝභාණක අභය තෙර වත.

තව ද, දීඝභාණකඅභය මහතෙරුන් වහන්සේ චතුර්විධ ප්‍රත්‍යයසන්තොෂභාවනාවෙහි ඇලුනු බැවින් මහාආර්යවංශප්‍රතිපත්ති වදාරණසේක. බොහෝ දෙන ගඳදුම්මල් ගත් අත් ඇති වැ මහාසත්කාර කරන්නාහ.

ඉක්බිති එක් තෙරකෙනකුන් වහන්සේ ඒ ලාභසත්කාරය ඉවසන්ට නො පොහොසත්වූ සේක් "දීඝභාණකඅභය මහතෙරහු මහාආර්යවංශප්‍රතිපත්තිය දෙසමියි කියා සියලු රෑ කොලාහල කෙරෙති" යනාදීන් ඔවුන් වහන්සේට නින්දා කරණසේක. එක් දවසක් දෙදෙනා වහන්සේ තමන්දෙගේ විහාරයට වඩනා සේක් ගව්වක් පමණ මග තැටි වැ වැඩිසේක.. ඒ තෙරුන්වහන්සේ ද මග මුළුල්ලෙහි දීඝභාණකඅභය තෙරුන් වහන්සේට නින්දා ම කළසේක.

ඉක්බිති දෙදෙනා වහන්සේගේ විහාරයට මග මෙන් වි ය. දීඝභාණකඅභයමහතෙරුන් වහන්සේ එතැන්හි සිට, තෙරුන් වහන්සේ වැද "ස්වාමීනි, මේ නුඹ වහන්සේ මඟ දැ"යි විචාළසේක. ඔවුන් වහන්සේ කී බස නො ඇසූ කෙනෙකුන්ද මෙන් වැඩිසේක. දීඝභාණකඅභය මහතෙරුන් වහන්සේ ද විහාරයට ගොස් පතුල් සෝධා මැඩ හුන්සේක. ඉක්බිති එක් අතැමැසි භික්ෂු කෙනෙකුන් වහන්සේ ද සමීපයෙහි සිට "ස්වාමීනි, ගව්වක් පමණ මග මුළුල්ලෙහි නුඹ වහන්සේට නින්දා කළ තෙරුන් වහන්සේට කිසිවක් නො මිදළසේක් දැ?"යි විචාළසේක.

දීඝභාණක අභය මහතෙරුන් වහන්සේ "ඇවැත්නි, මට ක්‍ෂාන්තිය බැරි බව මුත් සෙස්සන්ට බැරි නො වෙයි. කම්ටහන නැති වැ එක පියවරක් තබන කල් ද නොදත්මි" සි වදාළසේක.

මෙසේ තමන් වහන්සේගේ සම්පයෙහි සිටි හිඳ කරන්නන්ට පමා කිසිවක් නො වදරා ක්‍ෂාන්තිය ම මනානුප්‍රාප්ත කොට පිරිසුදු සීලය රක්නා කල මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසංඝයා වහන්සේ සරණ යෙමි සි සංඝසරණ යා යුතු.

## 37. පධානිය තෙර වත

තව ද, සිතුල්පව්වෙහි පධානිය නම් තෙරුන් වහන්සේ රාත්‍රිය මුළුල්ලෙහි ගමනා කොට වැඩ සිටිසේක. ඉක්බිති ඔවුන් වහන්සේට බඩ රුජාවෙක් පහළ. තෙරුන් වහන්සේ රුජාව ඉවසන්නට නො පොහොසත් වැ ඇත් මැණ බලා පෙරළෙන්ට වන්සේක. ඉක්බිති සිඟා වළඳන එක් තෙර කෙනෙකුන් වහන්සේ "ඇවැත්නි, භික්‍ෂූහු නම් ඉවසන්නාහු මෙද් ද!" සි වදාළසේක.

පධානිය තෙරුන් වහන්සේ "යහපත, ස්වාමිනි" සි වදරා ඒ සා මහත් වේදනාව ඉවසා නිශ්චල වැ වැඩ හොත්සේක. රුජාව පැහැර නාභිය පටන් ලය දක්වා පැළී ය. ඉක්බිති තෙරුන් වහන්සේ ඒ සා මහත් වේදනාව ඉවසා විදර්ශනා වඩා ඒ ක්‍ෂණයෙහි ම අනාගාමී වැ පිරිනිවන් පෑසේක. මෙසේ රුජාවෙන් බඩ පැළී ගිය කල්හි සියලඟ පුරා පවත්නා වේදනා ඉවසා තමන් වහන්සේගේ පිරිසුදු සීලය මුල් කොට ගෙණැ විදර්ශනා වඩා එකෙණෙහි ම අනාගාමී වැ පිරිනිවන් පෑ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ සඟුරුවන් සරණ යෙමි සි සංඝසරණ යා යුතු.

## 38. සුවිසි දහස් තෙරුන් වත

තව ද, සිතුල්පව්වෙහි දොළොස් දහසක් භික්‍ෂූන් වහන්සේ වසනසේක. එසේ ම තිස්සමහාවෙහෙර ද දොළොස් දහසක් භික්‍ෂූන් වහන්සේ වසනසේක. බැමිණිතියාසායෙහි විහාර දෙක්හි තුන්අවුරුද්දක් රැස් කොට තුබූ වී එක රැයකින් මහමීයෝ කා නොකා රැස් කළහ.

ඉක්බිති සිතුල්පව්වෙහි භික්ෂූන් වහන්සේ "තිස්සමහාවෙහෙරට ගොස් එහි අහර වළඳා වඩිමු"යි කියා විහාරයෙන් නික්මුනුසේක. තිස්සමහාවෙහෙරෙහි භික්ෂූන් වහන්සේ ද "සිතුල්පව්වට ගොස් එහි අහර වළඳා වඩිමු"යි නික්මුනුසේක.

දෙදිසාවෙන් ආ භික්ෂූන් වහන්සේ ගම්භීරකන්දර නම් නදිතොටැ රැස් වැ ඔවුනොවුන් විචාරා විහාර දෙක්හි ම දන් වැට නැති බව දැන "දැන් ඔබ කොයි කුමක් කරමෝ දැ?"යි කියා සුම්සිදගසක් භික්ෂූන් වහන්සේ ගම්භීරකන්දරවනයට වැද ඒ ඒ තැන්හි වැඩ හිඳ විදර්ශනා වඩා ලොවුතුරා දහම් පසක් කොට නිරුපධිශෙෂනිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑසේක. පසු වැ සාය ගිය කල භික්ෂූන් වහන්සේ ශරීරය හැදමා ගෙණ ධාතූන් වහන්සේ රැස් කොට දාගැබ් බැඳ වූසේක. මෙසේ මහාවලට වැද ඒ ඒ තැන්හි වැඩ හිඳ විදර්ශනා වඩා ලොවුතුරා දහම් පසක් කොට නිරුපධිශෙෂනිර්වාණධාතුයෙන් පිරිනිවන් පෑවාවූ මෙ වහන්සේ වරුන්දෑ ආදි කොට ඇති සුපිළිපන් වූ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ නං පුජා.

---

## 39. තිස් දෙනෙකුන්ගේ වත

තවද, තිස්දෙනකුන් වහන්සේ කැලණියෙහි මහදාගැබ් වහන්සේ වැඳ මල්මගින් ගොස් මහමගට බස්නාසේක් අතර මගැ දී ගිය සේනෙක්හි කම්මාන්ත කොට දරමිටියක් හිස තබා ගෙණ එන්නා වූ එක් උපාසකයෙක්හු දුටුසේක. ඔහු ඇඟ ද හිණකඩ ද දූල්ලෙන් ම රැදිත. බලන්නවුන්ට දූලි කණ්ඩුවක් සේ වැටහෙයි. උපාසක ද මල්මගින් අවුත් භික්ෂූන් වහන්සේ ඉදිරියෙහි සිටියේ ය. ඉක්බිති සාමණේරයන් වහන්සේ වරුන්දෑ ඔවුනොවුන් දෑ බලා "ඇමැත්නි, තොපගේ පියානෝ ය, තොපගේ මයිලනුවෝ ය" යනාදීන් කියා ඔවුනොවුන් වහන්සේට සිනාසී "උපාසකයෙනි, තොපි කිනම්මු දැ?"යි කියා විචාළසේක.

හෙ ද තමාගේ නම් විචාරණ ලද්දේ කලකිරී දරමිටිය හෙළා හිණකඩ ඉදුරා හැද මහතෙරුන් වහන්සේ වැඳ "ස්වාමීනි, වැඩ සිටිය මැනවැ"යි කී ය. තෙරුන් වහන්සේ වරුන්දෑ ද වැඩ සිටිසේක. සාමණේරයන් වහන්සේ අවුත් තෙරුන් වහන්සේ මැදයේ ද වෙහෙසන්නට පටන් ගත්සේක.

ඉක්බිති උපාසකයෝ ද "ස්වාමීනි, මා බලා වෙහෙසනසේක. 'මෙපමණකින් ශාසනයෙහි කටයුතු නිමවා මුදුන් පත් වැ සිටියම්හ'යි කියා සලකනසේක. මම ද පෙර තුඹ වහන්සේ වරුන්ද ගේ ම මහණ වීමි. තුඹ වහන්සේ සිත්හි එකගබවෙක් පොවා නැත. මම වූකලී මෙබුදු සස්නෙහි මහර්ධි ඇත්තෙමි මහානුභාව ඇත්තෙමි අහස පොළෝ කොට පියමි. පොළොව අහස් කොට පියමි. දුරු තැන් ලං කොට පියමි, ලං තැන් දුරු කොට පියමි. ලක්ෂයක් පමණ සක්වළ ද ඇසිල්ලකින් මාගේ දිව ඇසින් බලන්නට පොහොසත්මි. දැන් මා අත් බැලුම මැනැව. වඳුරන්ගේ අත් වැන්න. මම මෙ වැනි අතින් මෙහි සිදෑ හිරුසඳු දෙදෙනා පිරිමැද්දෙමි. මම පදපල්ලව හිරුමඬුලු සඳමඬුලු පා පිස්නා කිසි කොට හුන්නෙමි. මාගේ මෙ වැනි මහර්ධි හා මහානුභාව ද මාගේ ම පමාදයෙන් නැසී ගියේ. තුඹවහන්සේ වරුන්ද පමා නො වුව මැනව. පමා වීමෙන් මෙ ම දුකට පැමිණෙති. නො පමා වන්නාහු ම ජාතිදුක් ව්‍යාධිදුක් මරණදුක් අන්ත කරන්නාහු ය. එහෙයින් තුඹ වහන්සේ වරුන්ද මා ම අරමුණු කොට නො පමා වැ විසුව මැනැවැ"යි අවවාද දුන්න. තිස්දෙනා වහන්සේ ද උපාසක යන්ගේ බස් අසා සිවු ම මහකලකිරීමට පැමිණැ විදශීනා වඩා එකෙණෙහි ම රහත් වූහ.

මෙසේ අතර මග මැඩැ උපාසකයන්ගේ අවවාද අසා සසර කලකිරී විදශීනා වඩා එකෙණෙහි රහත් වූ මෙ භික්ෂූන් තිස්දෙනා ඇදි කොට ඇති සුපිළිපන්වූ සඟුරුවන් සරණ යෙමියි සඟසරණ යා යුතු.

## 40 එක්තරාතෙර වත

තව ද, එක් මහතෙර කෙනෙකුන් වහන්සේ බලවත් රෝගය කින් මඩනා ලදු වැ තමන් වහන්සේගේ අතින් අහර වළඳන්නට නො පොහොසත් වැ තමන් වහන්සේගේ කිස මුවාපස වැති ඇත් මැය් බලා පෙරළි පෙරළි වැඩැ හෝනාසේක. එක් ලදරු භික්ෂු කෙනෙකුන් ද රෝගී වැ වැඩැ හොත් ඒ මහතෙරුන් වහන්සේ දුකැ කලකිරී "ජීවත් වීමින් ඉතා දුක් තියා ය" යි වදාළසේක.

ඉක්බිති මහතෙරුන් වහන්සේ "ඇවැත්නි, දැන් මම මියා දිවසැපත් ලැබෙමි යි. මෙහි මට සැකයෙක් නැත. මෙ ශීලය සිදෑ පියා ලද සම්පත්තිය නම් සිබ පස්විනා* ලද ගිහිගෙහි සම්පත්තියක්

* මෙය 'පස්නා'-යි යන්න වරදවා ලිව්මෙන් වූ අශුද්ධවචනය ය. මෙ අශුද්ධවචනය සිඛවලඳවිනිස, ක්ෂුද්‍රසික්ෂා සන්න ආදියෙහි ද පෙනේ. 'පස්නා' යන්න තෙරුන් සිඛවණ්ණෙහි 4 වන පිටුවෙහි තිබේ.

මැත්ත. එහෙයින් සීලයෙන් යුක්ත වැ මියෙමි" යි කියා එසේ ම වැඩ හෙවැ එම රෝගය ම මුල් කොට විදර්ශනා වඩා රහත් වූසේක. මෙසේ මරණමඤ්චකයෙහි වැඩ හෙවැ තමන් වහන්සේගේ කිස මුවාපස වැනි බලවත් රෝගයෙන් පීඩනා ලදු වැ මහදුක් ගෙණැ ද සීලය රක්ෂා කොට විදර්ශනා වඩා රහත් වූ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 41 මහාපුස්සතෙර වත

තව ද, ඇළිඤක වාසී වූ මහාපුස්ස තෙරුන් වහන්සේ එකුන් විසිහවුරුද්දක් ගතපච්චාගතිකවත් පුරා විසූසේක. එහෙයින් ගොලෙසුන් ඔබා කම්ටහන් මෙනෙහි කොට වඩනාසේක. අතරමග තොයෙක් කර්මාන්ත කරණ මිනිස්සු නැවත නැවත පස්සට අවුත් වැඩ සිටැ කමටහන් මෙනෙහි කොට වඩනා තෙරුන් වහන්සේ දැකැ "කිම ද? මුනා මංමුළා කියා ද හෝ? නොහොත් කිසිවක් සඳහන් නැති වැ තබා පිය යන එන කියා ද හෝ?" යි කියන් නාහ. මහතෙරුන් වහන්සේ ද කියන බස්හි ආදරයක් නො කොට ම කම්ටහන් මෙනෙහි කොට වඩනාසේක. මෙසේ ඔවුන් වහන්සේ රැදහවල් නො පමා වැ ගතපච්චාගතිකවත් පුරා විසි හවුරුද්දක් ඇතුලෙහි ම රහත්බවට පැමිණිසේක.

ඔවුන් වහන්සේ රහත් වූ දවස සක්මන් කෙළවර වසන දෙවිදු තමා ඇඟිල්ලෙන් පහන් දල්වා සිටියා ය. සතරවරම් මහ රජ්ජුරුවෝ ය ශක්‍ර දෙවරාජ ය මහාබ්‍රහ්මයා ය යනාදී මහානුභාව ඇති දෙවියෝ ද අත්පා මෙහෙ කොට ගියහ.

මෙසේ තමන් වහන්සේගේ සීලගන්ධයෙන් දෙවතාවන් පොවා ගුන් නැතැ නින්ද නො දී තමන් වහන්සේ තරා දිවවූ ගතපච්චාගතවත්හි ම යතනප්‍රාප්ත වැ විසිහවුරුද්දක් ඇතුළෙහි ම ලොවුතුරා දහම් පසක් කළ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 42 අන්‍යතර ස්ථවිර වත

තව ද, එක් තෙරකෙනෙකුන් වහන්සේ දිවාස්ථානයෙහි හිඳ අතැවැස්සන් සමග ඛණ්ඩනයක් වහා අන දික් කොට නැවත පෙර

පරිද්දෙන් ම තබා වදාළසේක. ඉක්බිති අතැවැසි භික්ෂූන් වහන්සේ "ස්වාමිනී, අත දික් කොට හැකිළවූයේ කවර හෙයකින් දැ?" යි විචාළහ.

මහතෙරුන් වහන්සේ "ඇවැත්නි, මම යම් කලෙක පටන් කොට කමටහන් මෙනෙහි කෙළෙම් නම්, එතැන් පටන් කමටහනින් තොර වැ මා අතපය දික් කොටවත් වක් කොටවත් නො ලූ විරිමි. දැන් වූ කලී තොප හා බැණ බැණ හුන් මා විසින් කමටහනින් තොර වැ අත දික් කරණ ලද. එහෙයින් නැවත තිබූ තන්හි තබා අත හැකිළවීමි" යි වදාළසේක.

මෙසේ කමටහනින් තොර වැ අතපය පවා දික් කොට ද වක් කොට ද නො පියා බුදුන් වදාළ පරිද්දෙන් කමටහන් මස්තකප්‍රාප්ත කොට මහණධම් පිරූ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 43. මහානාග වත.

තව ද කාලමණ්ඩප වාසී වූ මහානාගතෙරුන් වහන්සේ "ආදි කොට සම්බුදුයන් වහන්සේගේ මහාවීර්‍යයට පූජා කෙරෙමි" යි කියා සත්හවුරුද්දක් සිටීමෙන් හා සක්මන් කිරීමෙන් දවස් යැවූසේක. නැවත සොළොස්හවුරුද්දක් ගතපච්චාගතිකවත් පුරා විදර්ශනා වඩා රහත් වූසේක.

මෙසේ ගතපච්චාගතිකවත්හි මුදුන් පත් වැ විදර්ශනා වඩා අමාමහනිවන් දුටු මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

---

## 44. පංසුකූලික තෙර වත.

තවද, පංසුකූලික තෙරකෙනෙකුන් වහන්සේ "සිතුල්පව්වෙහි දගබ් වහන්සේ වඳිමි" යි අවුත් දගබ් වහන්සේ වැඳ ඉක්බිති "මාගේ සිවුරු දිරා ගියේ ය. බොහෝ දෙනා වහන්සේ වසන තැන්හි සිවුරක් ලබමි" යි සිතා මහාවිහාරයට අවුත් සඞ්ඝස්ථවිර යන් වහන්සේ දැක, ඔවුන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳ වසන තැන් විචාරා එහි රැයෙක්හි ලැගියහ.

පංසුකූලික තෙරුන් වහන්සේ දෙවන දවස් සිවුර හැර ගෙණ සඞ්ඝස්ථවිරයන් වහන්සේ සමීපයට අවුත් ඔවුන් වහන්සේ වැඳැ සමු ගෙණැ වඩනාසේක් මහබෝමළුයෙහි දොරටුවෙහි සිට "පිණැත්තවුන් වසන තැන්හි යහපත් සිවුරක් ලැබේ"යි සිතා වදුරු නැවත "මාගේ සිත පිරිසිදු නො වේ"යි සලකා එයින් වැළැකැ සතර වන දවස් ද තෙරුන් වහන්සේ සමීපයට වැඩිසේක. සඞ්ඝස්ථවිරයන් වහන්සේ ද "මේ භික්ෂූන් වහන්සේගේ අදහස් පිරිසිදු නො වේ ය"යි සලකා සිවුරු ඇර ගෙණැ පංසුකූලික තෙරුන් වහන්සේ හා කැටි වැ පැණ විචාරා ගමට වැඩිසේක.

ඉක්බිති පංසුකූලික භික්ෂූන් වහන්සේ අසුචියෙන් රැඳී ගිය තිලමැස්සන් විසින් ගැවසී ගත්තා වූ කසළ ගොඩ තුබූ එක් කඩක් දුකැ දෙහොත් මුදුනෙහි තබා ගෙණැ වැඩැ සිටිසේක. ඉක්බිති තෙරුන් වහන්සේ "ඇවැත්නි, කසළ ගොඩට කුමක් පිණිස වඳු දූ?"යි විචාළසේක. පංසුකූලික තෙරුන් වහන්සේ "ස්වාමීනි, මාගේ පිය වූ ලොවුතුරා බුදුරජානන් වහන්සේ විසින් පූර්ණා නම් දාසිය පෙරෙවැ දමාපු කඩ තිඹක් පමණ පණුවන් සලා අමුසොහොනෙන් ගත්තා ලද එහෙයින් එ වැනි අවිනාත්‍ය වූ ගුණ ඇති ස්වාමිදරුවන් නො වැඳැ අනික් කාට වඳිම් දූ?"යි කීසේක.

මහතෙරුන් වහන්සේ ද ඔවුන් වහන්සේගේ බස් අසා "ඉතා පිරිසිදු ය පංසුකූලික තෙරුන් වහන්සේගේ අදහස ය" යි සිතා වදාළසේක. පංසුකූලික තෙරුන් වහන්සේ ද එතැන්හි ම වැඩැ සිටැ විදර්ශනා වඩා තුන්මඟ තුන්ඵලයට පැමිණැ කසළගොඩැ තුබූ කඩ ගෙණැ සිවුරු කොට පාචීනඛණ්ඩරාජියට ගොස් භාවනා වඩා රහත් වූසේක.

මෙසේ සඞ්ඝයන් වහන්සේ කෙරෙහි කළ භක්තියෙන් හා පක්ෂපාතයෙන් කසළ ගොඩැ තුබූ කඩරෙද්ද පවා වැඳැ ඇර ගෙණැ විදර්ශනා වඩා රහත් වූ පංසුකූලික තෙරුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසඞ්ඝයා වහන්සේ සරණ යෙම් යි සඟසරණ යා යුතු.

---

## 45. මහානාග ථෙර වත.

තව ද, මහානාගතෙරුන් වහන්සේ මවූ උපාසිකාවන්ගේ ගමට ගොස් සෙසු භික්ෂූන් වහන්සේ සමග පිඬු සිඟා වත්සේක. උපාසිකාවෝ ද වහන්සේ වරුන්ද කැඳ වළඳවා

ආසනශාලායෙහි වඩා හිඳවූහ. මෑණි හුත් වහන්සේ වරුත්ද අනුපෙරත් මහානාගතෙරුන් වහන්සේ නිරෝධසමාපත්තියට සම වැද වැඩ හුන්සේක.

එකල්හි ආසනශාලායෙහි ගිනි ගෙණ දිලියෙන්නට පටන් ගත. සෙසු වහන්සේ වරුන්ද තමන් වහන්සේ හිදිනා ද ගෙණ වැඩිසේක. මහානාගතෙරුන් වහන්සේ වූ කලි හොප නගා ලූ රත්පිළිමයක් සේ බබලබබලා වැඩ හුන්සේක. ඉක්බිති ගිනිරැස තණ හා හුණ්දඬු ආදිය දමා තෙරුන් වහන්සේ සිහාරවා සිවැ ගත.

ගම්මැස්සෝ ඇතුළෙහි වැඩ හුන් තෙරුන් වහන්සේ දැක මහාකලකිරීමට පැමිණ පැන් ගෙණ ඇර ගිනි නිවා හළු පහ කොට පිරිබඩ ගෙණ සුවඳමල් පුද මහතොමනසින් පිණා වැද වැද සිටියාහ. මහානාගතෙරුන් වහන්සේ ද ආදි කොට නියම කළ කල්හි නැවත නැගී සිට, වැද වැද මහ සොම්නසින් පිණපිණා සිහාරා සිටි මහජනයා දැක "මම ප්‍රකට වීමි"යි සිතා ආකාසයට පැන නැගී ප්‍රියඞ්ගුවිපයට වැඩිසේක.

මෙසේ තමන් වහන්සේ ලද ගුණවිශෙෂය කිසි කෙනෙකුන්ට නො හඟවා අපිච්ඡතොප්ගුණ ම මියතනප්‍රාප්ත කළ මෙ මහානාගතෙරුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහ සඟුරුවන් සරණ යෙමි යි සඟසරණ යා යුතු.

## 46. රාධ තෙර වත.

තව ද කාශ්‍යප සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ පිරිනිවි කල්හි රාධ නම් එක් කුලපුත්‍රයෙකෙනෙක් ගිහිගෙන් නික්මැ ශ්‍රාවකයන් සමීපයෙහි පැවිදි වූහ. ඔවුන් වහන්සේ "ස්වාමීනි, ශාසනයෙහි ධුර කෙතෙක් ද"යි ශ්‍රාවකයන් වහන්සේ විචාරා ශ්‍රාවකයන් වහන්සේ විසින් "ඇවැත්නි, බුද්ධශාසනයෙහි ග්‍රන්ථධුර ය, විදර්ශනා ධුර ය යන මේ ධුර දෙකින් පිටත් අනික් ධුරයෙක් නැතැ"යි වදාළසේක. ඔහු ද ශ්‍රාවකයන් වහන්සේගේ බස් අසා "විදර්ශනාධුර පුරමි"යි සිතා වදරා ආචාර්‍යොපාධ්‍යායයන් සමීපයෙහි පසුවස් වැස රහත්මග දක්වා කමටහන් ගෙණ වලව වැද වීර්‍ය වඩා රහත් වූ සේක.

මෙසේ සපිඬයන් වහන්සේ වදාළ පරිද්දෙන් විදර්ශනා ධුරයෙහි මියතනප්‍රාප්ත වැ භාවනා වඩා රහත් වූ මොවුන් වහන්සේ ආදි කොට ඇති සුපිළිපන් වූ මහාසංඝයා වහන්සේ සරණ යෙමි යි සඟ සරණ යා යුතු.

සි ඩි ර සතු.

# සඟසරණ ගැටපදවිවරණය

## නමවූ මුනිසරණ

සඟසරණ යෙමි--සඟුන් සරණ කොට ගෙවත් ගැමි දූකට පිහිට වන්නහු කොට සලකමි. 'සරණ' යනු පිහිට යි. දුක් දුරු කොට සැප අත් කර ගැණීමට යමෙක් හෝ යමක් උපකාරී වේ නම් ඒ 'පිහිට' යි. ආර්‍යමහාසඞ්ඝරත්නය උතුම් පිහිට කොට සව ගුහු සරණ යැයැත්තෝ සතර අපායාදීන්හි ඉපදීමෙන් ලබන දුක් ගැහැටින් හා ජාතිජරාමරණාදි සාංසාරිකදුඃඛයන්ගෙන් ද මිදේ. ලෞකිකොත්තරසුඛය ද අත්පත් කර ගණී. 'යෙමි' යනු පාළි 'ගච්ඡාමි' යන්නෙහි සිංහල පරිවර්තනය යි. 'ගච්ඡාමි' යන්නෙහි 'අවබෝධ කරමි; සලකමි' යන අර්‍ථය ද තිබේ. ඒ අර්‍ථයෙහි 'යෙමි' යන්න අසික් නැගෙන නො පෙණේ. සඟගුණ වැණුම-ආර්‍යමහාසඞ්ඝරත්නයෙහි ගුණවර්ණනාව; ආර්‍යමහාසඞ්ඝරත්නය නම් මාර්ගඵල ලාභී උත්තමයෝ ය.

### 1.

සිංහතෙල්—සිංහමිනින් ලබාගන්නා තෙල්; සිංහතෙල් රන් බඳුනක මිස වෙන භාජනයක නො රඳනැයි කියති. බන්-බන් කරණ ලද; 'බඳ-බන්ධනෙ' ධාතුවෙන් සිද්ධ කෘදන්ත පදයි. 'බඳ' ධාතුවෙහි බඳි-බඳිති, බඳී, බඳු, බන් යනාදි වශයෙන් වර්තමාන, අතීත ආඛ්‍යාතරූප ලැබේ. කනකභාජන-රන්බඳුන්; සඞ්ඝසිංහ රාජයාගේ-සඞ්ඝයා වහන්සේ නමැති ශ්‍රේෂ්ඨසිංහයාගේ; මෙහි 'රාජ'ශබ්දය ශ්‍රේෂ්ඨාර්ථයෙහි ය. සද්ධම්-නවලෝකෝත්තර දහම හා පර්‍යාප්තිධර්මය; සෝවාන් ආදි මාර්ග සතර හා එහි ඵල සතර ද නිවණ ද යන නවය නවලෝකෝත්තර දහම ය. පර්‍යාප්ති ධර්මය නම් ත්‍රිපිටකධර්මය යි. ධරණ-දරීම කරණ; දරන. සඟුරුවන්-සඞ්ඝරත්නය; මහාර්ඝ ද අසමාන ද දුර්ලභ ද වන්නේ රත්න යි.

### 2–3–4.

නිධාන—ආරක්‍ෂා කොට තැබූ ධනය; ධනසපයන්-ධනය රක්‍ෂා නාගයන්; වදල-දෙසනා කරණ ලද; වදර=වැදෑරුමෙහි ධාතුවෙන් සිද්ධ කෘදන්ත පදයකි. නියැලී-ඇලී; යෙදී; තත්පර ව; 'නියැලී' යි වුවොත් 'වෙහෙසී' යි අර්‍ථ කිය හැකි ය. බැජී-අපහසු

වූ; පිරිමනා-පොෂණය කොට; රැකබලා ගෙණ. රැකෙන-ජීවිකාව කරණ; ඇත්තොළුවන්-ඇත් එබෙරුන්; පිළිවෙත්-ප්‍රතිපත්ති; වැමෙන්නාවූ-පවතින්නාවූ; ගුරුළුබියෙන්-ගරුඩ භීතියෙන්; ගුරුළු නමැති පක්ෂීන්ගෙන් වන බියෙන්; ගල් ගැල පියා හොත්-ගල් ගිල ශයනය කළ; ගැලපියා' යනු 'ගැලැ' යන පූර්වක්‍රියාව පෙරටු කොට ඇති 'පිය' ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියාවකි. ගුරුළුබියෙන් නගින් ගල් ගිල හොත් පිරිදි පණ්ඩර නාගජාතකයෙන් දත්තේ ය. සසරබියෙන්-සංසාරයෙහි ඉපදීමෙන් වන බියෙන්; 'සසර' යනු ස්කන්ධධාතුආයතනයන්ගේ නො සිඳී පැවැත්ම යි හෙවත් උත්පත්තිපරම්පරාව යි. මහත් දහම් පිළිවෙත් සිලු-මහාධර්මප්‍රතිපදාව වැළඳූ; මහාධර්මප්‍රතිපදාවෙහි නියැලුනු.

## 5.

රසතෘෂ්ණාව—විසීමේ රසය පිළිබඳ ආශාව; මතු-පමණක්; විරග-වියෝගය; මෙත් වීම; නො හී-නො හැකි ම; හඹුවන්-නායකීවත්; හුන්තැනැ-වාසය කළ ස්ථානයෙහි; කොළු-(වී ඇදිය දමන) ඇටු; අමුරන-හිරණ්‍ය, බඩු නො කැඳූ රත්රන්; ඇති දෙයක් ඇත-පෙණෙන්ට තිබෙන දෙයක් තිබෙතොත්; භික්ෂුවකට තිබෙන එක ම දෙය නම් චීවරාදී පිරිකර කීපය පමණකි. තුන් සිවුරු-දෙපටසිවුර, තනිපටසිවුර, අඳනය යන සිවුරු තුණ; රැඳුනු-නැවතුනු; පැවතුනු; අපෙක්ෂාවක්-බලාපොරොත්තුවක්.

ගොදුරුබිමින්-ආහාර සොයා හැසිරෙණ භූමියෙන්; පොවා-පවා; වුවත්; නිපාතපදයකි. නැඟී-පිටත් ව; 'නැඟී' යනු 'නග-නැගුමෙහි' ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියා යි. තෘෂ්ණාවක් නබා-ආශාවක් ඇති කර ගෙණ; සිගා ම-පිඬු පිණිස හැසිර ම; ලාදු-දුඹු; ලත් දෙයක් ම-ලැබූ අහරක් ම; මල්කුසුම්වනමස්තකයෙහි-මල් පිපුනු වන මතුයෙහි; 'මල් කුසුම්' යනු සමානාර්ථ යි. මෙහි 'මල්, කුසුම්' යන දෙසදින් එකක් අධික ය. පවන-මාතය, සුළඟ; මෙ වල හැර-මේ විතය අත් හැර; කොයම-කවර පෙදෙසකට

ප්‍රාප්ත-පැමිණි; ලැබුනු. ගොචරයක්-ගොදුරක්; අරමුණක්; මෙහි 'ගො' ශබ්දයෙන් චක්ෂු, ශොත ආදි ඉන්ද්‍රියයෝ ගැණෙති. ඔවුන් හැසිරෙණ රූපශබ්දාදි අරමුණු 'ගොචර' යන්නෙන් ගැණේ. ඉන්ද්‍රියයන් සේ-ඇස, කණ, නාසය, දිව, කය යන ඉඳුරන් මෙන්; බස්-වචන; චක්ෂුර්විඥානය-ඇසට රූපාලම්බනයක් හමු වූ

කෙමෙණකි ඇති මහ විතානය; ඉන්ද්‍රගෝපය. ආයුෂ පමණක්-ආයුෂ ඇති තෙක්; 'ආයුෂ' යනු යමක් පවත්නා කාලය යි. චක්‍රවර්ත්‍යාදි විත්‍යාගත ආයුෂ ඉතාමත් සුළු කාලයකි. නිරුද්ධ වන්නා සේ-නැති වන්නාක් මෙන්; සිගා වන් ද-පිඬු පිණිස මැදුරකට-ගියත්; මුත්-මිස, හැර; වන්-පැමිණි; වද-පිවිසුම්හි ධාතුවෙන් සිද්ධ කෘදන්තයෙකි. ඒ නැත-එබඳු විහාරයක් නැතහොත්, කිස් කිමණි-අභ්‍යවකාශයෙහි, එළිමහන් බිමෙහි; මුතුදැල්-මුක්තාජාල, මුතු අමුණා කළ දැල්; රන්කම්-රණින් කළ කර්මාන්ත; සිරීයහන් ගබ්ඩාගෙයි- (රජකුමේකුගේ) ශ්‍රී ශයනය තිබෙන කාමරයෙහි; විසුද්ධ-පිරිසිදු; විසිතුරු-විචිත්‍ර, අලංකාර; තරුවැලෙහෙන්-තාරකාපංක්තියෙන්; අහස්වියන්-ආකාශ නමැති වියන්; අභ්‍යවකාශයෙහි-එළිමහන් බිමෙහි; යෙහෙන්-සුවයෙන්; 'යහ + එන්' යන දෙක එක් වීමෙන් යෙහෙන් යන්න සිද්ධ යි. 'යහ' යනු ප්‍රකෘති යි. 'එන්' යනු විභක්ති ප්‍රත්‍යය යි.

වලකම-වනයකම; රෑහෑණියත්-කෝපයත්, තරහත්; කාන්තාරයෙහි-දිය ඈදි ද්‍රව්‍ය ගෙණ දුකින් යා යුතු මගෙහි; කෙලෙංබා-ඇලුම් කරවා; කනුව-කනු පිණිස; නුවණැතියා-ඥානවන්තයා; වණිම්හි-පැමිණියෙම්හි; වද-පිවිසුම්හි ධාතුවෙන් සිද්ධ අතීත කාලික උත්තම පුරුෂ ආඛ්‍යාත යි. බඳනා-ඇල්ලීම; යක්රූ-යක්ෂරූප; සක්විති වත-චක්‍රවර්ති රජකු වත; අප කළයේ-අප විසින් අත්හලේ; පෙරලා-නැවත; කල-කරණ ලද; ආඥාසම්පන්න-අණින් යුත්, කිසි සේ අණ කරණ; මෙහෙවර-මැඩ පිණිස; අවසි ලියුණු-නාල සීමාව නියම නොව ලියූවෝ; අතර මංහි-මාර්ගාන්තරයෙහි අතරමග; සමෘද්ධ-දියුණු; සැතපෙම්-විඩා සන්සිඳුවම්; 'සතප-සැතපුම්හි' ධාතුවෙන් සිද්ධ උත්තම පුරුෂ ආඛ්‍යාත යි. කමටහන්-කර්මස්ථාන; භාවනාකර්මයට ආධාර වන අරමුණු; දස කසිණ, දස අසුභ දස අනුස්සති, සතර බ්‍රහ්මවිහාර, සතර ආරූප්‍ය, ආහාරපටික්කූලසඤ්ඤා චතුධාතුවවත්ථාන යන සතළිස යි. විස්තර විසුද්ධිමාර්ගය බලා දත යුතු. පිළිවෙත් පුරණුවට-ප්‍රතිපත්ති පිරීම පිණිස.

නිරපේක්ෂ- (නිර් + අපේක්ෂ) බලාපොරොත්තු රහිත; බිජුවටහි-බීජයෙහි; බිත්තරයෙහි. පක්ෂිපෝතකයන්-කුරුළු පැටවුන්; මෙ මම රුස්සමි-මේ දෙයට මම රුචි කරමි; නුරුස්සමි-(නො + රුස්සමි) රුචි නො කරමි; 'රුස්සමි' යනු 'රුස්' දැයින් 'ච' ප්‍රත්‍යය හා ඊට පූර්වරූප ද වීමෙන් සිද්ධ ක්‍රියාපද යි. මුවෙහි-මුඛයෙහි; යැපෙන්නා-ජීවත් වන්නා.

කාඤ්චනගුහායෙහි-රන්ලෙණෙහි; සිංහපොතකයන්-සිංහ පැටවුන්; ඡද්දන්තවිල්තෙර-ඡද්දන්තතඩාගතීරයෙහි; ඡද්දන්ත විල හිමාලය පර්වතයෙහි තිබේ ලු. විස්තර බුත්සරණෙහි 48 වන පිටුවෙහි පෙණේ. බුද්ධශාසන-බුද්ධධර්මය; චිත්‍රකූට පර්වතය-හිමාලයෙහි අනවතප්ත විල අසල තිබේ ලු. සුවර්ණහංස පොතකයන්-රණහංස පැටවුන්; 'පොතක' යනු පැටවුන්ට නමකි. සිඹුල්-ඉඹුල්; ගරුඩපොතකයන්-ගුරුළුපැටවුන්; රත්නාකරයෙහි-රුවන් ආකරයෙහි; මැණික් පතලෙහි. සාගර කුක්ෂියෙහි-මුහුද ඇතුළෙහි; මුක්තාරූවන්-මුතු නමැති රත්නයන්; පරසතුරුකෙහි-දෙව්ලොව්හි වෙතැයි සලකන පාරිජාතක (=හෙළ කොබෝලීල) ගසෙහි; මහමල්කැන්-ලොකු මල්පොකුරු; බුද්ධෝත්පාද-බුදුකෙනෙකුන්ගේ පහළ වීම; වසන්තකාලයට-වසන්තසෘතුවට; බක් - වෙසක් දෙමස වසන්ත සෘතුව යි. සිඟ සිඟා-සිඟමින්; සමානාර්ථ ඇති පූර්වක්‍රියා දෙකක් යෙදුනු කල මිශ්‍ර ක්‍රියාර්ථය ලැබේ. යාචකකමින්-යාචක වෘත්තියෙන්; සිගත්තන් සේ බැගෑකමින්; බැණපියා-(ආක්‍රොශ) කථා කොට; මිඩිය-දුසිය; කුඩුකනද්දෑ-වී කුඩුවලින් කළ කැවුම්; සතරවරමුන්-ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන වරම් රජවරුන්; තමන්ට ස්වාමි වූ-තමන්ගේ හිමියා වූ; ලොකස්වාමි වූ-ලොවට හිමියා වූ; සද්ධර්මස්වාමි-දහමට හිමි; වැළකූ-වළක්වන ලද; දෙතිස්කථාවට-භික්ෂූන් විසින් නො කට යුතු ය යි තහනම් කළ කථා තිස්දෙකට; 1. රාජකථා, 2. චෞරකථා, 3. මහාමාත්‍යකථා; 4. සේනාකථා, 5. භයකථා, 6. යුද්ධකථා, 7 අන්නකථා, 8. පානකථා, 9. වස්ත්‍රකථා; 10. සයනකථා, 11. මාලාකථා, 12. ගන්ධකථා, 13. ඥාතිකථා, 14. යානකථා, 15. ගාමකථා, 16. නිගමකථා, 17. නගරකථා, 18. ජනපදකථා, 19. ඉත්ථිකථා, 20. සූරකථා, 21. විසිඛාකථා, 22. කුම්භට්ඨානකථා, 23. පුබ්බපෙතකථා, 24. නානත්තකථා, 25 ලොකක්ඛායිකාකථා, 26. සමුද්දක්ඛායිකාකථා, 27. ඉතිභවාභවකථා, 28. විනාශවාදකථා, 29. සස්සතදිට්ඨිකථා, 30. උච්ඡේදදිට්ඨිකථා, 31 වෘද්ධිකථා, 32. හානිකථා යනු ඒ දෙතිසයි. කුඩු නො ලා-මුව නො බහා; කට නො යොදා. ස්වර්ගසම්පත්තියක්-දිව්‍යසැපතක්; නිර්වාණසම්පත්තියක්-තෘෂ්ණා ක්ෂය කිරීමෙන් ලබන නිවන් සැපතක්; සාධා-සිද්ධ කොට; දුගක්-කරුණක්; බිණ්ණු සේ-කථා කළ පරිදි; සසුන් පිළිවෙත් පුරණ ධෛර්ය ඇති-ශාසනාගත ප්‍රතිපත්ති සම්පූර්ණ කරණ ධීරභාවය (=වීර්යය) ඇති; ධර්මිෂ්ඨ-දැහැමි; ව්‍යර්ථ-හිස්; නිෂ්ප්‍රයොජන. කුඩු නො පොපියවයි-මුව නො සොල්වයි; දිවි පියාත්-ජීවිතය හැර දමා නමුත්; බෙලිකුස්සි-

මුතු බෙල්ලන්ගේ බඩෙහි; මුතු බෙල්ලන්ගේ බඩට වැටුනු දිය බිඳු මුතු බවට හැරෙතැයි පුරාතනයෝ සලකති. සසින්ගේ දළ මුල තිබෙන දිය ඊට ඉතා දුරු ය. කිසිවිටක මුතු බවට නො හැරේ. **නැත**-නැතහොත්; **බණක් දහමක්**-ධර්මයක් යනු අර්ථයි. විකල්ප වචනශ්ලිෂ්ටතාව සඳහා යි. **බණන**-කියන; **මුවෙන්**-මුඛයෙන්; **අබම්කථාවක්**-නො දැහැමි කීමක්; **තුඩට**-මුවට; **දුරින් දුරු ය**-අතිශයින් දුරු ය.

**තුඩෑ තුඩෑ**-මුඛයක් පාසා; **වැකු**-තැවරූ; හැම මුඛයකින් ම කී. **විරෝධයක්**-විරුද්ධකමක්; **දණ්ඩනයක්**-දඬුවමක්; **ගිනිගෙන් සසරෙහි**-ගින්නෙන් ඇවිළී පවත්නා සංසාරයෙහි; සසර රාග දොෂාදි එකොළොස් ගින්නකින් ඇවිළීගෙණ පවතී. **සසර බඳ මල කෙලෙන**-සසරෙහි බැඳුනු කෙලෙස් නමැති මලපුඩු දුරු කරණ; **දවගැති**-ධාවක දාස; දුවන මෙහෙකරු. **බලත්**-බලන කල්හි; **සිතත්**-සිතන කල්හි; **යකඩු**-යකඩින් කළ කටු; **අමෘත පරිෂෙකයක්**-අමා ඉසීමක්; **ග්‍රන්ථධුර**-ග්‍රන්ථයන්හි යෙදීම; බුද්ධවචනය ඉගෙණීම. **විදර්ශනාධුර**-විදර්ශනා භාවනායෙහි යෙදීම; 'විදර්ශනාව' යනු ප්‍රාණසන්තානයක වූ පඤ්චස්කන්ධය අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් නුවණින් සැලකීම යි. **නො බඳ**-නො බැඳුනු; **භගවතො**-භාග්‍යවතුන්වහන්සේගේ; **සාවකසඞ්ඝො**-ශ්‍රාවකසඞ්ඝතෙම; **සුපටිපන්නො**-මනා පිළිවෙත්හි පිළිපන්නේ ය. **උජුපටිපන්නො**-ඍජු වූ මැදුම්පිළිවෙත්හි පිළිපන්නේ ය; **ඤායපටිපන්නො**-නිවන් පිණිස පිළිපන්නේ ය; **සාමීචිපටිපන්නො**-සසර දුක් බැහැර ලීමට සමීචීන (=සුදුසු) පිළිවෙත්හි පිළිපන්නේ ය; **යදිදං**-යම් මේ; **චත්තාරි පුරිසයුගානි**-සෝවාන් ආදි පුරිස යුග සතරක් වේ ද; **අට්ඨපුරිසපුග්ගලා**-මාර්ගස්ථ ඵලස්ථ වශයෙන් වූ සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන පුරුෂ පුද්ගලයෝ අටදෙනෙක් වෙත් ද; **භගවතො**-භාග්‍යවතුන්වහන්සේගේ; **එස සාවකසඞ්ඝො**-මේ ශ්‍රාවක සඞ්ඝ තෙම; **ආහුනෙය්‍යො**-දුර සිට ගෙණවුත් දිය යුතු ප්‍රත්‍යයට සුදුසු ය; **පාහුනෙය්‍යො**-පාහුන සඞ්ඛ්‍යාත ආගන්තුකදානය පිළිගැණීමට සුදුසු ය; **දක්ඛිණෙය්‍යො**-පරලොව සුව සඳහා දිය යුතු දන් පිළිගැණීමට සුදුසු ය; **අඤ්ජලිකරණීයො**-දෙහොත් මුදුනෙහි තබා කරණු ලබන වැඳීමට සුදුසු ය; **ලොකස්ස**-ලොකයාගේ; **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං**-නිරුත්තර පින්කෙත ය; මෙහි විස්තර විසුද්ධිමාර්ගයෙහි 'සඞ්ඝානුස්සති'යෙන් දත යුතු. **නාලොවෙහි පටන් බඹලොව දක්වා**-නාගලොකයෙහි සිට බ්‍රහ්මලොකය දක්වා; මෙහි 'දක්වා' යනු 'තෙක්' යන අර්ථයෙහි ය. 'දක්වා, තෙක්' නිපාතද්වය ම සීමාවක් හඟවන නිපාතද්වයෙකි. සීමාව ඇතුළු කොට ගත

සුවු තත්හි 'තෙස්' යනු ද, සීමාව බැහැර කළු සුවු තත්හි 'දස්වා' යනු ද යෙදේ. සහනුණ පතළේ බ්‍රහ්මලෝක සීමාවට නො ව බ්‍රහ්මලෝකය ද ඇතුළු කොට ය. මෙහි එය නො සලකා යෙදූ සේ පෙණේ. එක කොලාහල-එක ම ඝොෂාව.

## 6

නොවදනා සේ - නො පැමිණෙන්නාක් මෙන්; වන්සඳු- පිවිසි කල්හි; සෙලින් සෙන - ගලින්-පඹනයෙන්-වැටෙන; පිළිලොම් වූ - ප්‍රතිලෝම ව, ආපසු හරනැවී; අනු පිළිවෙත් - අනුකූලවූ (=සුදුසු) ප්‍රතිපත්ති; ප්‍රතිපක්ෂ - විරුද්ධ; ප්‍රතිපත්තියක්- පිළිපැදීමක්; අසත්‍යයට - අවිරට; හිරු බැස යන තැන අස්තය යි. අවනුවූ - ඇද නැත්තාවූ; තිලෝගුරු - කාම රූප අරූප යන ලෝකත්‍රයයට ආචාර්‍ය වූ; ස්වාඛ්‍යාත ධම් විනය - මනා කොට ප්‍රකාශ කළ ධම්ය හා විනය; සඞ්ගීති කාරක මහ තෙරහු සියලු බුද්ධ වචනය ධම්විනය වශයෙන් දෙකොටසකට බෙදා සඞ්ග්‍රහ කළහ. සූත්‍රපිටකය හා අභිධම්පිටකය ද 'ධම්' යන්නෙන් ගැණේ. භික්ෂු භික්ෂුණීන්ගේ කායවාක් සංයමයට අවශ්‍ය වූ ශික්ෂාපදප්‍රඥප්තිහු විනය කොටසෙහි ඇතුලත් වෙති. කාමසුඛාල්ලිකානුයොගය-පස් කම් සුවෙහි යෙදීම, රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන විෂයධම්යන්හි සිතින් ඇලීම හා කයින් යෙදීම; ආත්මක්ලමථ- ශරීරයට වෙහෙස දීම; මධ්‍යම වූ ප්‍රතිපත්තියෙන් - මැදුම්පිළිවෙතින්; අරිඅට්ගමගින්; සුදු-කති; වක්‍ර නමක්-ඇදබවක්; විඩා ව - වෙහෙසට පැමිණ; සත්කාර-සංග්‍රහ; දෙව්ලෝ හැරුපිණ ද- දෙව්ලොව් අත්හැර ද; මෙහි 'පිණ' යනු ශොභාර්ථයෙහි යෙදුනු පූර්ව ක්‍රියාපදයකි.

මහත්ඵල-මහා විපාක ඇති; මහානිශංස-මහත් අනුසස්ඇති; ඉහලොව-මෙලොව; පරලොව-අන්‍යලොක; මරණින් මතු ලබන ආත්මභාවයෝ 'පරලෝ' නම් වෙත්. නදනා-අදනා; විශ්වාසකර; දෙසොත්-අත්දෙක; වඳනට=වැඳීමට; කුසල් නමැති බිජුවට- පුණ්‍ය කම් සඞ්ඛ්‍යාත බීජයන්; මහ කෙත් බඳු-මහා ක්ෂෙත්‍ර වැනි, මහ කුඹුරු වැනි; සෝවාන් මාර්ගයෙහි-සෝතාපත්ති මාර්ගයෙහි; 'සොත' යනු දියපාරට නමකි. නිර්වාණ නමැති මහාසාගරයට පමුණුවන හෙයින් ආය්‍යීඅෂ්ටාඞ්ගිකමාර්ගය සොතය යි කියනු ලැබේ. සොත නමැති ආය්‍යීඅෂ්ටාඞ්ගිකමාර්ගයට පැමිණීම සොතාපත්ති යයි. යොගාවචරයකුට පළමුවරට උපදනා එම සම්මාදිට්ඨි ආදි අඞ්ගයන්ගෙන් යුක්ත වූ කුසල්සිත සොතාපත්තිමාර්ගචිත්තය නම් වෙයි. සොතාපත්තිමාර්ගචිත්තයෙන් අපායගාමී ශක්තිය සිඳිනු ලැබේ. මාර්ගස්ථ පුද්ගලයකුගේ ඇසුම එක් චිත්තක්ෂණ

යකි. ආයතිමාර්ගචිත්තයට අනතුරුව ම ආයතිඵලය උපදනා හෙයිනි. එබැවින් ආයතිඵලසත්පුද්ගලයන් මිස ආයති මාර්ගස්ථපුද්ගලයන් ලැබිය නො හැකි ය. මෙහි පුද්ගල භේදය දක්වනු පිණිස මාර්ගසත්පුද්ගලයෝ ද දක්වන ලදහ. සෝවාන්ඵලයෙහි-සෝතාපත්තිමග්ග නම් කුසල් සිතෙහි විපාකය වූ සිතෙහි; සකෘදාගාමි මාර්ගයෙහි-සකෘදාගාමි මාර්ගසිතෙහි(සකෘත් + ආගාමි)වරක් කාමභවයට උත්පත්ති වශයෙන් පැමිණෙන හෙයින් 'සකෘදාගාමි' නම් වේ. සෝවාන් මාර්ගයට පැමිණි පුද්ගලයා මාර්ගභාවනා කිරීමෙන් කාම රාග ව්‍යාපාද සංයෝජන ධර්මයන් තුනී කෙරෙයි. එහෙයින් ඔහුට කාමභවයෙහි එක්වරකට වඩා ඉපදීමට ශක්තියක් නැත. හෙතෙම මිය ගොස් අන්භවයක ඉපිද එයින් චුත ව නැවත මෙහි ඉපිද රහත් ව පිරිනිවන් පාන්නේ යි. සකෘදාගාමිඵලයෙහි-සකෘදාගාමිවිපාක සිතෙහි; අනාගාමිමාර්ගයෙහි - අනාගාමිමාර්ග සිතෙහි; (න + ආගාමි) නැවත කාමභවයෙහි උත්පත්ති වශයෙන් නො පැමිණෙන්නේ අනාගාමි නම් වේ. සකෘදාගාමි ආර්යශ්‍රාවකතෙම සව දූරවත් භාවනා කර තම සන්තානයෙහි තුනී ව පවත්නා කාමරාග ව්‍යාපාද යන සංයෝජනධර්මයන් මුල සුන් කෙරෙමින් අනාගාමි මාර්ගඥානය ලබයි. හෙතෙම කාමභවයෙහි උත්පත්තිය ගෙණ දෙන කෙලෙසුන් මූලෝච්ඡින්න කළ හෙයින් එම භවයෙහි අර්හත්මාර්ගඥානය අවබෝධ නො කළ හොත් ශුද්ධාවාස බ්‍රහ්මලෝකයක උත්පත්තිය ලබා එහි දී ම අර්හත්වය සාක්ෂාත් කොට එහි දී ම පිරිනිවන් පාන්නේ ය. අනාගාමිඵලයෙහි -අනාගාමිවිපාකසිතෙහි; රහත්මඟ - අර්හත්මාර්ගඥානය; පූජාවට සුදුසු නිසා හෝ කෙලෙස් අර නැසූ නිසා 'අර්හත්' නම් වේ. එම උත්තමයාගේ මාර්ගඥානය අර්හත්මාර්ගඥානය යි. අනාගාමි ආර්යශ්‍රාවක තෙම ප්‍රත්‍යවේක්ෂාවට අනතුරුව ඉතිරි කෙලෙසුන් ප්‍රහීණ කරණු පිණිස මාර්ගභාවනා කොට රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන උද්ධම්භාගිය සංයෝජන ධර්මයන් ප්‍රහීණ කෙරෙයි. එ කල එම උත්තමයාගේ සන්තානයෙහි භවයෙහි උත්පත්තිය ගෙණ දෙන කෙලෙස් මූලෝච්ඡින්න වූයේ වෙයි. නැවත ඉපදීමක් නැත උන්වහන්සේගේ මරණය නිරුපධිශෙෂනිර්වාණධාතුව ය යි කියනු ලැබේ. සමවායෙහෙක්-එක් විටෙක; දිව්‍යබ්‍රහ්මයන් - දිව බඹහෙතක්; පතමි නමුදු-ප්‍රාර්ථනා කරමි නමුදු; නිරාමිස සුව-ධ්‍යානසැපය; 'ආමිස' යනු පඤ්චකාම වස්තුවට නමකි. එම පඤ්චකාම වස්තූන් නිසා නො වූ සුවය නිරාමිස සුවය යි. එනම් ධ්‍යාන සැපයයි. අමාමහනිවන්-අමෘතමහා නිර්වාණය; නො හිමි ව නමුදු-

නො හැක් වූයෙමි නමුත්; වෙශ- වේශය, ආකාරය; නානාවෙශෙන- පිරිණන; උපන්නානන්තර - උපන්නවුන්ට; පස්වාදශකින් බඩිබෙහි-අවුරුදු පන්දහසකින් මත්තෙහි; බුදුන්-බුදුන්ගේ.

ජාතිභෙදය - ක්‍ෂත්‍රියාදී ජාතිවිශෙෂ; මුතුන්තැන්හි- මුත්තනු වන්ගේ ස්ථානයෙහි; මුත්තාබවෙහි; පියතැන්හි- පිතෘස්ථානයෙහි; පියබවෙහි, සම්බුදුපුතු - බුදුපුත්; බල්බෑ - බාල සහෝදර; මාඇඟි- මහාඝී, ඉතා උතුම්.

හිරිඔතප් - පව් කිරීමෙහි ලජ්ජාව හා භය; දෙ දහමුන් - ධර්ම දෙක; පසිඳුරන් - ඇස, කණ, නාසය, දිව, කය යන පඤ්චෙන්ද්‍රිය යන්; දෙරමුගොච්චන් - දොරටුපාලයන්; සමාධි - ධ්‍යාන සිතෙහි පවත්නා බලවත් එකඟබව, නර්ඝිය - නිඤ්දිත; මහඇඟි- මා ඇඟි; චක්‍ෂුමලයක්-සෙලමෙන්තක්, අසප්‍ර වූවක් මන්-මානය උඩගුකම; ලාභපිණ්ඩ - ලාභයක් ලැබ ගැණූ සඳහා; ආවශ්‍යක - අතිශයින් වුවමනා; ගිය - ගියොත්; දිය පිහිරං - දිය දෙපසට කොට; ඉන්ද්‍රනීලමණිගුහායෙහි - ඉඳුනිල්මිණිලෙණෙක්හි; ජල ශ්‍රෙණියෙහි - දිය ඇතුළෙහි; ඇල්ද - සිහිල් දිනයෙහි; හිරුමඬුළු - සූර්ය මණ්ඩලය; වන්නිකබල් - ගිනි කබල්; මෙය අත්තන්හි 'වග්ගිතිකබල්' යි ද පෙණේ. ගිම්ද - ග්‍රීෂ්මදිනයෙහි; පිඹුමු - (පිට + අවු) ගේත්තු වන ඇත්ද; මහාසෘද්ධි-මහත් වූ ඍද්ධි බලය; සඞ්ගයක් - ඇලීමක්; වනුශක - ඇදයක; සජ්ජනයන්ට - සත්පුරුෂයන්ට; භාණ්ඩාගාරයක - අතෙහිම තබා රැක්ක යුතු වටිනා ධනය වැනියක; අභිමතාර්ථ - අදහස් කළ අර්ථය; කැමැති දෙය; චින්තාමාණික්‍යරත්නයෙක - සිතූ පැතූ දෙය ලබා දෙන මැණිකෙක.

ගාථාවෙහි අර්ථ:—

යො ච - යමෙක් වනාහි; බුද්ධඤ්ච - බුදුන් ද; ධම්මඤ්ච - ධර්මය ද; සඞ්ඝඤ්ච - සඞ්ඝයා ද; සරණං ගතො - සරණ ගියේ (=රත්නත්‍රයය උතුම් පිහිට ය යි දත්තේ) වේ ද; (හෙතෙම) චත්තාරි අරියසච්චානි - දුඃඛ සමුදය නිරොධ මාර්ග යන චතුරාර්‍ය සත්‍යයන්; සම්මප්පඤ්ඤාය සම්‍යක් ප්‍රඥාවෙන්; පස්සති-දක්නේ වෙයි.

දෙසිත - දෙසන ලද; ධම්මරත්නය - දහම් නමැති රුවන; නිර්වාණ ප්‍රතිවෙධය - නිවන් අවබොධ වීම; ලොකාරක්ෂාවට - ලොව රැකීමට; සම කොට - සමාන තබයෙහි යොදා.

**කෙළලක්ෂයක්** - කෝටි සියක් දහසක්; **'ධජග්ගපරිත්තය'** - පිරිත් පොතෙහි 'ධජග්ගසුත්ත' නමින් දක්වේ. **වුව** - වුවහොත්; **ලොමුදහගැන්මෙක්**-රෝමෝද්ගමයෙක්, ලොම් කෙළින් සිටීමෙක්; **තැති** - ත්‍රාසය, බිය.

ගාථාවන්හි අර්ථ:—

**භික්ඛවෝ** - මහණෙනි; **අරඤ්ඤෙ වා**- වනයෙහි හෝ; **රුක්ඛමූලෙ වා** - රුක්මුල්හි හෝ; **සුඤ්ඤාගාරෙ වා** - ජන විවික්ත ස්ථානයක හෝ; **සම්බුද්ධං** - සම්බුදුන්; **අනුස්සරෙථ** - සිහි කරන්නේ ද; (එකල්හි) **තුම්හාකං** - තොපට; **භයං** - බියක්; **නෝ සියා** - නො වන්නේ ය.

**නො චෙ** - ඉදින්; **ලොකජෙට්ඨං** - ලොවට ප්‍රධාන වූ; **නරාසභං** - නරශ්‍රෂ්ඨ වූ; **බුද්ධං** - බුදුන්; **නො සරෙය්‍යාථ** - සිහි නො කරන්නාහු නම්; **අථ** - නැවත; **නිය්‍යානිකං** - සියලු දුක් ඉක්ම වීමට කරුණු වූ; **සුදෙසිතං** - මැනවින් දෙසන ලද; **ධම්මං** - ධර්මය; **සරෙය්‍යාථ** - සිහි කරවු.

**නො චෙ** - ඉදින්; **නිය්‍යානිකං** - නෛර්‍යාණික වූ; **සුදෙසිතං** - මැනවට දෙසන ලද; **ධම්මං** - ධර්මය; **නො සරෙය්‍යාථ** - සිහි නො කරහු නම්; **අථ** - නැවත; **අනුත්තරං** - උතුම් වූ; **පුඤ්ඤක්ඛෙත්තං** - පින් කෙත් වූ; **සඞ්ඝං** - ආර්‍ය්‍ය සඞ්ඝයා; **සරෙය්‍යාථ** - සිහිකරවු.

**භික්ඛවෝ** - මහණෙනි; **එවං** - මෙසේ; **බුද්ධං** - බුදුන් ද; **ධම්මං** - ධර්මය ද; **සඞ්ඝං** - ආර්‍ය්‍ය සඞ්ඝයා ද; **සරන්තානං** - සිහි කරන්නවුන්ට; **භයං වා** - බියක් හෝ; **ඡම්භිතත්තං වා** - තැති ගැන්මක් හෝ; **ලොමහංසො වා** - ලොමුදහගැන්මක් හෝ; **න හෙස්සති** - නො වන්නේ ය.

**ජනපදරෝගය**-ජනපදයෙහි පැතිරී යන සංක්‍රාමණික රෝගය; වසංගත රෝගය; **ප්‍රලය** - විනාශය; **යක්ෂභය** - යකුන්ගෙන් වන බිය; **දුර්භික්ෂභය** - ආහාර නැති බැවින් වන බිය; **ආනුභාව** - තෙජස, අනුන් මැඩ පවත්වන ශක්තිය; **උපද්‍රව** - උවදුරු.

## 7.

**රාජහංසයන්**-රජහසුන්, රතුපාට තුඩ හා පා ඇති හංසයන්; **කේසර පඞ්ක්ති**-මල් කෙසරු සමූහය; **තරු මැල**-තාරකා සමූහය; **කප්රුක්හි**-කල්පවෘක්ෂයෙහි; 'කප්රුක' වනාහි සිතූ පැතූ දෙය

ලබා දෙන දෙව්ලොව ඇතැයි සැලකෙන ගසකි. මල්කැන්-මල්පොකුරු; බෙලිකුසකි-බෙල්ලන්ගේ බඩෙහි; මුතුරුවන්-මුක්තාරත්න; පබළුදළු-කොරල්දළු; රුවන් ආකරයෙහි-රුවන් උපදනා ආකරයෙහි; මිණිරුවන්-මාණික්‍යරත්න; චෙතසි හා-සිතෙහි හටගන්නා ගති; මලයපර්වතයෙහි-මලය දේශයෙහි වූ කන්දෙහි; දැන් 'ඝාට්' නාමයෙන් හැඳින්වෙන්නේ මලය පර්වතය යි. මෙහි බොහෝ සඳුන් වෘක්ෂයෝ වැවෙති. එහෙයින් සඳුන්වලට 'මලයජ' යයි ද කියති. සඳුන්රුකක් යනු 'සඳුන් රුක' යි විය යුතු ය. වෛඩූර්යභූමියෙහි-මේ පිළිබඳ විස්තරය කව්සිළුමිණෙහි 502 වැනි ගීයට කල්පලතාව්‍යාඛ්‍යාවෙහි ලියූ දෙයින් දත හැකි ය. පහළ වූ-නවගන්නා වූ; රත්නාංකුරයන්-රුවන්පැළ; වයිරෝඩිකුරු; මහාජම්බුද්වීපයෙහි - මහදඹදිවෙහි මදයෙහි; ඝනනාංකුර-රත්පැළ; ගන්ධමාදනපර්වතයෙහි - හිමාලය පර්වතයෙහි වූ මෙනම් කඳු මුදුනෙහි; ඡදන්පොව්වන්-ඡද්දන්ත කුලයෙහි 'ඇත්පැටවුන්; ක්ලේශශුද්ධභූමියෙහි - කෙලෙසුන් හා සමත් කරණ සුද බිමෙහි; විද්‍යාශාලාවෙහි-ශාස්ත්‍රශාලාවෙහි; ශික්ෂා කරණ-ඉගෙනීම කරණ; අතැවැස්සන්-ශිෂ්‍යයන්; පැළ පැහැර-ගොයම් පැළයෙන් පැළය වද්ද; ශස්‍යාංකුර වැනි-ගොයම් පැළ වැනි; සැරසුනාවූ-අලංකෘතවූ; විලෙපනයක්-විලෙවුනක්; ඇගේ ගානා සුවඳ ද්‍රව්‍යයක්; සුගන්ධ ප්‍රිය-සුවඳට කැමැති; දුෂ්කර ක්‍රියා-කරන්ට අමාරු කට යුතු; වැරහැර-වීර්යහාර, දැඩි වීර්ය; ඉසිසියේ පවත්නා අදහස්; සකස්-මනහර,යහපත්; ශාක්‍යපුරය-ශාක්‍යයන් හුන් නුවර;මහවත්සි-මහ පාරමී;තෙලෙස්ධුතාංග-කෙලෙස් තැමපා කිරීමට උවමනා වන ගුණ තෙළෙස; පංසුකූලිකාංග, තෙචීවරිකාංග, පිණ්ඩපාතිකාංග, සපදානචාරිකාංග, එකාසනිකාංග, පත්තපිණ්ඩිකාංග, ඛලුපච්ඡාභත්තිකාංග, ආරඤ්ඤිකාංග, රුක්ඛමූලිකාංග, අබ්භොකාසිකාංග, සොසානිකාංග, යථාසන්තිකාංග, නෙසජ්ජිකාංග යනු තෙළෙස් ධුතාංගයෝ යි. බැරි-බැරිරුම්; නිරවද්‍ය-(නිර් + අවද්‍ය) නිර්දෝෂ, නිවැරැදි; පංසුකූල චීවරය - සොහොන් කසළගොඩ ආදියෙහි හිමියන් නිරාලය ව දමන ලද වස්ත්‍ර කැබැලි එකතු කොට මසා ගන්නා ලද චීවරය; පස් ගතුයෙහි කූලයක් (-ගොඩුරක්) මෙන් පැවැති හෙයින් හෝ පස් මෙන් පිළිකුල් හෙයින් පංසුකූලය යි කියනු ලැබේ. භාවනා-සිත වැඩීම; භාවනාව සමථ විදර්ශනා වශයෙන් දෙපරිදි ය. මෙහි විදර්ශනා භාවනාව ගැණේ. තිලකුණු-සංස්කාරයන්හි පවත්නා අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ලක්ෂණ තුන; මෛත්‍රී-මිත්‍රභාවය; 'යහපතක් වේවා' යි සිතීම. සිත් ගලන්නාවූ-සිත් නිමග්න කරන්නාවූ,

කායගතාසතිය - කය අරමුණු කොට පැවැති සිහිය; කයෙහි පවත්නාවූ දෙතිස් කුණපයන් සිහිනුවණින් යුක්ත ම පරිග්‍රහ කරන්නවුන්ට එය අරමුණු කොට සිත දාන්ත වේ. එකඟ බවට ද පත් වේ. මේ කායගතාසති භාවනාවයි. ආනාපාන, ඉරියාපථ, චතුසම්පජඤ්ඤ, පටික්කූලමනසිකාර, ධාතුමනසිකාර, නවසීවථිකා යැයි කායගතාසතිය තුදුස් කොටසකින් යුක්ත ය. ආහාර පටික්කූල සඤ්ඤාව - ආහාරයෙහි පිළිකුල් බව සැලකීම; විස්තර විශුද්ධිමාර්ගයෙන් දතයුතු. සපදානචාරිකාවක් - පෙළිපෙළින් පිඬු සිඟා යෑමක්; මෙහි 'දාන' යන්නෙහි අර්ථය 'කඩ කිරීම' යනු යි. දානයෙන් පහවූයේ අපදානය යි හෙවත් නොකඩ කිරීමයි. නොකඩ කිරීම සමඟ පවත්නේ සපදානය යි. රසතෘෂ්ණාවෙන් ගෙවල් අත් නොහැර පිඬු පිණිස හැසිරීම සපදානචාරිකාව යි. චාරිකාවක් - හැසිරීමක්; වරපෙණය - පැළ ආදිය වැවීම; පණිවා - පාණාතිපාතය, සතුන් මැරීම; මුසවා - මුසාවාදය; බොරු කීම; රාමෙර - සුරා හා පැසවූ මත් වන ද්‍රව්‍ය; ගරවිල් කුණක් - ගැරඬි කුණපයක්; උනා - මුදු, ලිහා; කායවිප්‍රකාරයක් - අත් පා සෙලවීම ආදි කයින් කරණ විකාරයක්; සංසාරවිලාපයක් - සසර වැලපීමක්; අත්තකිලමථානුයෝගය - තමහට දුක් දීමෙහි යෙදීම නමැති තාපසව්‍රතය; වඩාහුම්ගෙහි - මඩ කරණ සිමෙහි; දම්සෙඹියකින් - මත්ලොඹුවකින්; 'මත්ලොඹුව' යනු වඩ කම්ගුත් තන්ගේ හිස තබා සපන කොළොඹුව යි. මල්ගඳවිලෙවුන් - මල් හා ඇඟේ ගාන සුගන්ධද්‍රව්‍යයන්; ස්පර්ශවිෂයක් - පහස් නමැති විෂද්‍රව්‍යයක්; උච්චාසයන මහාසයන - උස් ආසන හා මහැගි අසුන්; අකප්‍යයෙහි - කැප නුවූ ආසනයෙහි;

තෘෂ්ණා වඩනා - තණ්හාව දියුණු වන; අපථ්‍ය - අයොග්‍ය, නුසුදුසු; විකාලභොජන - ඉර හැරුණු පසු වැළඳීම; සමට - යකඩ ගුළි; බුද්ධ දායාදයක් - බුදුරජානන් වහන්සේ විසින් දෙන ලද දාවැද්දක්, ආර්ය්‍යමහාසඞ්ඝරත්නය බුද්ධපුත්‍ර හෙයින් පියසතු ධනය වන නව ලොව්තුරා දහම් බුද්ධදායාදය වෙයි; විනය නිගම යෙන් - භික්ෂූන් උදෙසා පණවන ලද විනය ප්‍රඥප්තීන් අනුව කාරණ විසඳීමෙන්; දෛශනිශමය - වැරැදි තීරණය කිරීම; ධර්මාධි කරණ - ධර්මයෙන් කරණ නඩු විසඳන තැන් - උසාවි; කුසෙහි සොහොයුරන් - එක කුසෙහි උපන්නන්, සහෝදරයන්; මරණ නොබානා - මරණයට බිය නො වන; වික්‍රම - බලය; සතරඔඝ - කාමෞඝ, භවෞඝ, දිෂ්ටෞඝ, අවිද්‍යෞඝ යන ඔඝ සතර, 'ඔඝ' යනු සැඩපහරට නමකි. කාමාදියෙහි බැඳුනවුන් සසරසයුර හෙලනා හෙයින් කාමාදීහු 'ඔඝ' නම් වෙති. 'කාම' යනු වස්තු

කාම හා කෙලශ කාම යි. 'භව' යනු රූපාවචර අරූපාවචර කුශල හා එහි විපාකයෝ යි. 'දිට්ඨාසව' යනු දෙසැට මිථ්‍යාදෘෂ්ටිය යි. 'අවිජ්ජාසව' යනු මෝහය යි. **මහෝඝයකින්** – මහත් ඕඝයකින්; **දෙසැටදෘෂ්ටි** – වැරදි දැකීම් සැට දෙක; ශාශ්වත දෘෂ්ටි 4, එකත්‍යශාශ්වත 4, අන්තානන්තික 4, අමරාවික්ෂෙප 4, අධීත්‍ය සමුත්පන්න 4, සංඥීවාද 16, අසංඥීවාද 8, නෙවසංඥීනාසංඥීවාද 8, උච්ඡෙදවාද 7, දෘෂ්ට ධර්මනිර්වාණවාද 5, යන හැට දෙකයි. විස්තර ධර්මප්‍රදීපිකාවෙන් දතයුතු; **ව්‍යසනසාගරයෙහි** – විපත් සයුරෙහි; **පමුන්ගමකට** – තොටුපලක් ඇති ගමකට; **කුලහිමි** – කුල ස්වාමියා; **සාරාසංඛ්‍යකල්ප ලක්ෂයක්** – අසඞ්ඛ්‍ය සතරක් හා කල්පලක්ෂයක්; කල්ප යනු අති දීර්ඝ කාල පරිච්ඡෙදයකි. විස්තර පූජාවලියෙහි පෙණේ; **පතා** – ප්‍රාර්ථනා කොට; **දිවි පුදා** – ජීවිතය පූජා කොට; **සක්විතිරජ** – මුළු පොළොවෙහි ම ආඥාචක්‍රය පවත්වන්නාවූ රජ; **සක්රුවන් සෙ** – සක්විති රජුන්ට අයත් කැමැති තැනකට යැමට ඉවහල් වන ශ්‍රෙෂ්ඨචක්‍රය මෙන්; **නිමන්ත්‍රණ** – ආරාධනාව; **පැවරූම්** – ආරාධනා; **ගහපතිචීවරය** – ගිහියන් දුන් සිවුර; **පංසුකූලිකයක** – පසුල් සිවුරු දරන්නෝ ය; **අභ්‍යවකාශයෙහි** – එළිමහන් බිමෙහි; **තමන්ට වර්ණනා කරත්** – තමන් පිළිබඳ ව වර්ණනා කරතොත්; **සත්බුමුමහල් බරා සිටි** – තට්ටු හතක් ඇති මහාශාලාව හෝ ප්‍රාසාදය දරා ගෙණ පැවැති; **බිම තලාන් මහවැඹ** – භූමිය තලාද මහකණු; **මහපා** – මහා ප්‍රාසාදය; **වඳුත් නිසිවූ** – වදිතොත් යොග්‍ය වූ; **ධම්නිධාන වූ** – ධර්මයට නිධාන වූ; ධර්මය ආරක්ෂා කොට තුබූ තැනක් වූ; **ශ්‍රොත්‍රීය ගණදුරන් වැනි** – වේදය හදාරණ ගණාචාර්‍ය බ්‍රාහ්මණයන් වැනි; **නිග්‍රාහ්‍යයන්ට** – නිග්‍රහ කට යුත්තන්ට; **නිග්‍රහ** – නින්දා; **බඳ** – බන්ධනය කොට; **ජව** – වේගය; **විජිගීෂු වූ** – දිනන්ට කැමැති වූ; **දුෂ්කෘත දුර්භාෂිත මාත්‍රයක්** – නරක සුළු ක්‍රියාවක් කිරීමෙන් වන දුෂ්කෘතාපත්තිය, නරක වචනයක් කීමෙන් වන දුර්භාෂිතාපත්තිය යන සුළු ඇවැත් පමණවත්, 'බාහවිරූ' යන්න 'බාහ සුළු' යි ශුද්ධ කට යුතු. 'ස්වභාවයෙන් ම බිය වන' යනු අර්ථයි. **අටපිරිකර**– භික්ෂූන් වහන්සේ කෙනෙකුන්ට අවශ්‍ය පිරිකර අට; දෙපට සිවුර, තනිපට සිවුර, අඳනය, පාත්‍රය, පෙරහන, පටිය, කඩකැත්ත, ඉඳිකටුව යන අට; **අපිණ සතොස්** – ආශා නැති වූ හා ලද දෙයකින් සතුටු වන; **ආශ්‍රවයන්** – කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව යන සතර ධර්මයන්; භවාග්‍රය තෙක් ලොව පුරා පවත්නා හෙයින් හා ධර්මවශයෙන් ගොත්‍රභූ සිත තෙක් පවත්නා හෙයින් කාමාදියට ආශ්‍රව යයි කියනු ලැබේ. **උසස් පිනූ** – උස් තැනක් (ඉහළක්) පැන්නා වූ;

**විජම්භනය ගැඹුරු සයුරු** – අභිධම් ක්‍රමය නැමැති ගම්භීර සාගරය; **අනන්තාපරියන්ත** – අන්තයක් නැති, කෙළවරක් නැති; මේ වචන ද්වය ම සමානාර්ථයක් දෙයි. එහෙයින් 'අතිශයාධික' යන අර්ථය ලැබේ.

## 8. සැරියුත් වත

**විවේකයට** – ගණයා කෙරෙන් වෙන් ව එකලා ව විසීම පිණිස; **වලෙක්හි** – වනයෙක්හි; **දුක්ඛවේදනා** – දුක්වූ වෙදනාව; **ආයුෂ්මත්** – ආයු ඇති; **උපස්ථානයට** – උවටැන් කිරීමට; **සංසිඳේ**– සමනයට (=සුව වීමට) පත් වේ. **ඇවැත්ණි**–ආයුෂ්මතුනි; දීර්ඝායුෂ ඇත්තෙනි; මෙය භික්ෂූන් අතර වැඩිහිටියන්ට හා සමානයන්ට ද ගෞරව සඳහා යෙදෙන ඇමතුම් පදයකි **තෙලඟිතෙල්** – එළඟිතෙල්; **ලබන්නමෝ වේ දැයි කිදු ය** – ලබන්නමු වේ ද යි කීයේය. මෙහි 'වේ' යන ක්‍රියාපදයට "නුඹවහන්සේගේ වත් – ලබන්නමෝ" යන වාක්‍යය ම කර්තෘ වශයෙන් යෙදේ. 'දූ' යනු ගෞරවාර්ථයෙහි යෙදෙන ප්‍රත්‍යයෙකි. 'කී දූ' ආදී තන්හි මෙන් 'වහන්දූ' ආදි තන්හි ද එය පෙණේ. **සක්මන් කෙළවර** – සක්මන් මළු අග; **ආයසීයන්ම** – උතුමන් වහන්සේට; **කුලයට** – ගෘහයට; **ගැහැම** – හිරිහැර.

**තොප නො කිව ද** – තොප නොකීව්වත්; **සැපසුණු**– පිළියෙල කළහ; **වන්දූය** – පිවිසියේය; **කිරිපිඩු** – කිරිබත්; **ගමනාකාර** – යන අයුරු; **එළඹුදු ය**- ඉදිරිපත් කළේය,! පිළිගැන්වූයේය **මබඳක්හු** – මා වැන්නකු; **පාත්‍රමුවවිට** – පාත්‍ර ගැටට; **හුනු** – වැටුනු; හෙ- හීමෙහි - ධාතුවෙන් සිද්ධ කෘදන්ත පදයකි; **පනාංළිස් අවුරුද්දක්** – අවුරුදු හතළිස් පහක්; **නො පහළ** – පහර නො දුන්නේ ය; නො හටගත; **කායජීවිතයෙහි** – කයෙහි හා දිවි පැවැත්මෙහි.

## 9. බෑන සඞ්ඝරක්ඛිත වත

**උපාධ්‍යායයන් වහන්සේ**–වරද නිවරද පෙන්වා අවවාද අනුශාසනා කරණ, පුහුණු කරවන තෙරුන් වහන්සේ; **නො පසඩිකා**–ප්‍රත්‍යවෙක්ෂා නො කොට; චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයන් ශරීර ශක්තිය වැඩීම ආදිය පිණිස හෝ අලංකාර පිණිස හෝ නො ව දිවි පැවැත්ම හා පහසු විහරණය ද පිණිස පරිභෝග කරමි යි

නුවණින් සැලකීම ප්‍රත්‍යවේක්ෂා නම් වේ. සංවේගයට-කලකිරීමට; සුපරිශුද්ධ - ඉතා පිරිසිදු; ප්‍රත්‍යසන්නිශ්‍රිතශීලය - ප්‍රත්‍යයන් ඇසුරු කළ ශීලය; චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයන්ගේ ප්‍රයෝජනාදිය සිහිනුවණින් සලකා පරිභෝග කිරීම නමැති ශීලය.

## 10. අම්බඛාදකතිස්ස තෙරවත

මහාභයෙහි - මහාදුර්භික්ෂ සමයෙහි; විඩාවුළුය - වෙහෙසවූයේක; නොවෙලෙහි-විකාලයෙහි; තමා ම හුනු-ඉඳී වැටුනු; බල බලා-බලමින්; පූර්වක්‍රියාව දක්වනවූ මිට මිශ්‍රක්‍රියාවිය ලෑබේ කරූප්-ගොගනු, පුදනු; සාදුකින්-බඩ ගිනිදුකින්; සාගිනෙන්-විපතක්; සමග ණයක්-විරෝධයක්, වැරැද්දක්; දිවි නැලවෙනුදු-ජීවිතක්ෂය කොට මෙතක්, මැරෙතත්; විරෝධයක්-විරුද්ධ කමක්; වැඩහොත්තේක - ශයනය කළේක; 'මැඩ' යනු 'වඩ-මැඩුමෙහි' ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියාපදයකි. මේ ක්‍රියාපදය "හෝ, සිදු සිටු, වස්" යන ධාතුන්ගෙන් පෙරටු වූයේ ගෞරවාර්ථයක් ගෙණ දෙයි 'වඩ' ධාතුව උත්තමයන් පිළිබඳ ගමන්හි ද 'වඩිති' ආදි වශයෙන් යුදු ම ද යෙදේ. විඩාදනය-වෙහෙසට පැමිණියේක; අඹපැන්-අඹ මිරිකාගත් යුෂ; විලිකුන්-ඉදුනු; පිණපත්‍රයෙහි එකොකුක්-පිය පත තැනෙක්; කෑණී-දූක; බැලපත්‍රයෙහි - කුඹියට මැඩ තරණ කොටයෙහි; විදශීකා වඩා-සිලකුණු මෙහෙයි කොට.

## 11. මහාසඞ්ඝරක්ඛිත තෙර වත

ආයු වලදු - ආයුෂ ගෙවා; මරණ මඤ්චකයෙහි - මරණය පිණිස හෝනා ඇඳෙහි; අප හැමදෙනා අත කුසල් පුරා-අප හැමට ම පින් ලබා දී; ආයු කෙළවර-ආයු අවසානයෙහි; දිගින්-දිශාවලින්; පෘථග්ජන වැ-කෙලෙස් සහිත ම; කාලක්‍රියා-කලුරිය කිරීම; පූජා භාණ්ඩ-පූජා පිණිස වූ බඩු; පශ්චාත්තාප-පසු තැවිලි; බල්බවා-ගැන්සි කරවා; 'බල්බ-එල්බුම්හි' ධාතුවෙන් ප්‍රයෝජ්‍යාර්ථයෙහි සිද්ධ පූර්වක්‍රියාපදයකි. කණණයෙහි - ඇඟිල්ලෙහි; අසුර ගසා - මහපටැඟිල්ල හා දබරැඟිල්ල එකට ගසා; හෙවැ-ශයනය කොට; ආශ්චර්‍ය-පුදුම; මරණාන්තය-මරණ කෙළවර.

## 12. අන්‍යතර (=එක්තරා) ස්ථවිර වත

පාළි උගන්නට-ත්‍රිපිටක ධර්මය ඉගෙනීම පිණිස; පවත්-ප්‍රවෘත්ති; තොරතුරු; එමි-එමි හි; 'එ-ඊමෙහි ධාතුවෙන් සිද්ධ ආඛ්‍යාත පද යි. එමි + හි යන තන්හි යකාරලෝපයෙන් හා ඉකාර එක් ව දීර්ඝ වීමෙන්

'එම්' යනු වේ. කොයි-කොහි; යෙනක්නම-විහාරයම ඇමෙයෙම; සෙනකුන්ද-සෙනකුන් වහන්සේ; පසඟ පිහිටුවා-දෙදණ දෙ වැලමිට නළල යන යෝහ පස බිම තබා; කළ මනා වතෙස්-කළ යුතු චාරිත්‍රයක්; වැඩිය මැනවැයි-වඩිතොත් යහපතැයි; ඔවුන් බස්-ඔවුන් ගේ වචන; මුදුනෙන්-මස්තකයෙන්; ඉතා මධුර-අතිශයින් මිහිරි; දෑ-ද්‍රව්‍ය; සකුරු පිඩක්-සකුරු ගුළියක්; සඬක්-වස්ත්‍රයක්; අනුමෝවෙනි බණ-අනුමෝදනා ධර්මය; පින් කම් අවසන්හි දායක යන්ගේ සිත් සතුටු වීම පිණිස කරණු ලබන ධර්මදේශනාව අනු මෙවෙනි බණ නම් වේයි. රුහුණට-රුහුණු රටට; පුරාතනයෙහි ලක්දිව රුහුණු මායා පිහිටියේ කොටස් තුනකට බෙදී රජවරු තිදෙනෙක් පාලනය කළහ. මෙයට "ත්‍රිසිංහලය" යි කියනු ලැබේ. උතුරු දිගින් කළුගඟින් හා මහවැලි ගඟින් ද අනික් තුන් දිගින් මහාසමුද්‍රයෙන් ද සීමා වූ රුහුණු රට ඇතැම් කාලයක්හි ලක්දිව ප්‍රධාන රට ද විය. පසුකල ඉංග්‍රීසින් ත්‍රිසිංහලය කොටස් කර පලාත් නවයකට බෙදා එහි පාලනයට ඒජන්තවරු පත් කරණ ලදහ. පවරණ-පවාරණය කොට; වස් වැස අවසන්හි කටයුතු විනයකර්මය කොට; මෙහි 'පැවරීම' නම් 'කායාදියෙන් තමන්ගෙන් යම්කිසි දොසක් වී තිබේ නම්, කරුණා කර එය කියන්නැ'යි භික්ෂූන්ට ආරාධනා කිරීම යි. වතාවත්-කළයුතු සත්කාර; පිළිය-වස්ත්‍රය; අවුත්-පැමිණ; 'ආගන්තුව' යන්නෙන් හිත් යයි. බෑයන් වහන්සේ-භ්‍රාතෘන් වහන්සේ; එකාවනු-නිතර; හුදකලාව-තනිව; හී-වැටි; අපිස්බැවින්-අල්පේච්ඡභාවයෙන්, ආසා නැති බැවින්; අස්වසා-සනසා; පාත්‍රයෙහි-පාත්‍රය දමන පසුම්බියෙහි; මස්තක ප්‍රාප්ත-මුදුන් පත්; සම්පූර්ණ.

## 13. මිලියදෙව වත.

කෑදහරළුවක්-කෑදහැන්දක්; පුත්‍රස්නේහය-පුතකු කෙරෙහි පවත්නා ආදරය; ඇතුළුගෙහි-ගෙහි ඇතුළෙහි; ප්‍රණීත-මිහිරි; නිබද-නිතර; සුවපත් ව යී-සුවපත් වේවා යි; ඇතුළුවස් තුන්මස්හි-වස් තුන් මස තුළ; අනුග්‍රහ-අනුකම්පා, කරුණාව; වස් පවරණ දවස්-වස් වැස පවාරණ කර්මය කරණ වප් මස පුර පසළොස්වක් දිනයෙහි; සිවුපිළිසිඹියාපත්-අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන සතර පිළිබඳ ඥානයන්ට පැමිණි, ප්‍රත්‍යයෝත්පන්න, නිර්වාණ, භාෂිතාර්ථ, විපාක, ක්‍රියා යන පස් වැදෑරුම් අර්ථයන් පිළිබඳ ඥානය අර්ථ ප්‍රතිසම්භිදාව යි. හේතු, ආර්යමාර්ග, භාෂිත, කුශල, අකුශල යන පඤ්චධර්මයන් පිළිබඳ ඥානය ධර්මප්‍රතිසම්භි

දුව යි. එම අත්ථ ධම්මයන් ප්‍රකාශ කිරීමට උවහල් වන භාෂා ශබ්දානු නිරුක්තිය පිළිබඳ දැනුම නිරුක්තිප්‍රතිසම්භිදාව යි. අත්ථ ධම්ම නිරුක්තීන් වටහා ගන්නා ප්‍රතිභානය ප්‍රතිභාන ප්‍රති සම්භිදා නම් වේ යි. එතෙනෙහි-ඒ ඇසිල්ලෙහි; නාමක් කෙළිය මැනවැ යි-සෙල්ලම් නොකරණු මැනවැයි 'නාමක්' යනු 'නාමක්' යන ප්‍රතිෂේධාර්ථනිපාතයෙන් සිද්ධයි. දනුකුදු නො දනුකුදු-දක්නට නො දක්නට; ගන්ධමාලාදීන්-සුවඳ මල්දම් ආදීන්; ධම් කථික-ධර්මදේශක; පාළිය-පෙළ; ගුහාසනෙන්-වැඩහුන් ආසන යෙන්; ධම්මාසනයේ-දහම් දෙසීම පිණිස පැනවූ අසුනෙහි; විජනි පත-පවත්පත, වටාපත; තුන්පිටකය ම-සූත්‍ර විනය අභිධම් යන පිටකත්‍රය ම; සම්මර්ශනය-කල්පනා කිරීම; අත්ථව්‍යාඛ්‍යාන-අර්ථ යන් ප්‍රකාශ කිරීම; අමාවතුරක්-අමෘතප්‍රවාහයක්; ගලා පැතිරී යන අමෘතයක්; අරුණෝද්ගමෙහි-අරුණ නැගීමෙහි; 'අරුණ' යනු හිරු නැගීමට මත්තෙන් පෙරදිග අහසෙහි පැතිරෙන රක්ත වර්ණ ආලෝකය යි. සෝවාන් පෙලෙහි-සෝවාන් ඵලයෙහි; මඩුනතුරෙහි-මණ්ඩපස්ථානයෙහි.

## 14. තිස්සභූති වත

විනය හදරා-විනය පිටකය ඉගෙණ; පිරිවෙණගේහ-පාඩම් කියනගේහ; වසනාගෙය-වසනගේහ; සොඳුරු අරමුණක්-ස්ත්‍රීරූප යක්; ඔබාගෙන පියවර-බිම එබූ පාදය; කැඳිත්ත-කැඳ සැල්පය; ඇඹිසෑ-බෙදූ; වීතකිය-කල් ගතව; සතර අපායෙහි-නරකය, තිරි සන්යෝනිය, ප්‍රෙතනිකාය, අසුරනිකාය යන සිවුවැදෑරුම් අපා යෙහි; එකත්පස්හි-එක්පාර්ශවයක්හි, දෙස සයකින් දුරු ව සිටීම එකත්පස්හි සිටීමයි. ඉතා ඉදිරියෙහි හිඳීම, ඉතා පිටිපස හිඳීම, ඉතා දුරු ව හිඳීම, ඉතා තුදුරු ව හිඳීම, උස් තැනෙක්හි හිඳීම, උඩු සුළඟෙහි හිඳීම යන මොහු නිසදූදෙස් සය යි. ව්‍යාධියෙන්-රෝගයෙන්; පොහොසත්මි-සමර්ථයෙමි; මා බලා තබා වඳුල මැනවැයි-මා ගැණ සලකා තවතා වඳුලහොත් යහපතැ යි; ගල් වල-පර්වතයෙන් යුක්ත වනයෙහි; පිරිබඩ-පරිභාණ්ඩ, ගොම්මැටි ගෑම ආදී කටයුතු; තගා තබවයි-තැන්පත් කොට තබවයි; රාග චරිතයෝ-රාගය බහුල චරිත (=පැවතුම්) ඇත්තහු; උරෙහි ලා-උර හිසෙහි දමා; අනාදුක්ම-අවසාන දුකිම්; ධ්‍යානය-කාමච්ඡන්දාදිය විෂ්කම්භනය කිරීමෙන් ලබන විශේෂ ශාන්තතාව; දුර්ලභ-ලබන්ට

දුෂ්කර; **ඛබම** - උත්වහන්සේට; **පලක් බැඳ** - අරමිණිය ගොතා ගෙණ; **අසුබ කම්මටහන් පාදක කොට** - උද්ධුමාතකාදිදශවිධ අශුභයන් අත්තිවාරම කොට; **පාළිවචනය** - බුද්ධවචනය; **කාම විතර්කය** - රූපාදිකාමවස්තූන් පිළිබඳ කල්පනාව.

## 15. මහාසීව තෙර වත.

**තෙවළා** - ත්‍රිපිටකධර්මය; **අටළොස් මහගණයක්** - 1. දීඝභාණක, 2. මජ්ඣිමභාණක, 3 සංයුත්තභාණක, 4. අඞ්ගුත්තර භාණක, 5. ඛුද්දකභාණක, 6. පාරාජිකභාණක, 7. පාචිත්තිය භාණක, 8. චූලවග්ගභාණක, 9. මහාවග්ගභාණක, 10. පරිවාර භාණක, 11. ධම්මසඞ්ගණිභාණක, 12. විභඞ්ගභාණක, 13. කථාවත්ථුභාණක, 14. පුග්ගලපඤ්ඤත්තිභාණක, 15. ධාතුකථාභාණක 16. යමකභාණක, 17. පට්ඨානභාණක, 18. ජාතකභාණක යන මොහු අටළොස් මහාගණයෝ යි. **සොම්නස** - සතුට; **අවසරයක්** - අවකාශයක්; 'ආවසන්න' යනු 'ආවන්න' යි ශුද්ධ කට යුතු; 'පැමිණි කෙනෙකු වැන්නැ යි යන අර්ථ යි. **මා බදු වූව මනා වේ ද යි** මා වැනි කෙනෙකු වන්නේ නම් යහපත් වේ දැ යි; **ඉන්ද්‍රනීල මාණික්‍යයක් සේ** - ඉඳුනිල්මිණක් වැනි; **මහකලකිරීම** - මහත් සංවේගය;

**හඳුරවා** - උගන්වා; **පිරිවහවා** - පාඩම් කියවා; 'පිරිවහ-පිරිවැහුම්හි' ධාතුවෙන් ප්‍රයෝජ්‍යාර්ථයෙහි සිද්ධ පූර්වක්‍රියා පදයකි. **අත පොවන තන්හි** - අත පොවන තන්හි, අත දිගු කළ කල ගත හැකි තැනක; **ගලෙක්හි** - පර්වතයෙක්හි; **පිළිදගෑ** - ඇමැදීම් ආදියෙන් සකස් කොට; **තබා** - පසෙක තබා; අස් කර තබා; **ඉමා** - අධිෂ්ඨාන කොට; 'අධිෂ්ඨාන' නම් 'මෙය මෙසේ කෙරෙමි' යි දැඩි කොට සිත පිහිටුවා ගැණීම යි; **පවාරණය ආසන්න විය** - පෙරවස් පැවරුම් දිනය ළං විය; **පුහුදුන් බව** - පෘථග්ජන භාවය, කෙලෙස් සහිත බව; **විසුද්ධිපවරුණෙන්** - විශුද්ධි පවාරණයෙන්; වස් කාලය තුළ දී ම රහත් ව වස් අන්තයෙහි කරණ පවාරණ කර්මයෙන්.

**උගහට** - දුෂ්කර, අමාරු; **තත්පර වූ** - ආසක්ත ව, ඇලී; **මහණදම්** - ශ්‍රමණධර්මය; මහණකම; **මහාපවාරණ දවස්** - පෙරවස් අවසන් කරණ වප් පුරපසළොස්වක් පොහෝ දිනයෙහි; **සසලකුණ** - හාවාගේ සටහන; **උපසම්පන්න වූ** - අධිශීලශික්ෂාවට - උපසම්පදාවට - පැමිණියා වූ; **සොම්නස්** - සිතේ සතුට; **මුණුබලු** - මේරු; **ඔබා** - යට කොට; 'ඔබ- එබුම්හි' ධාතුවෙන් සිද්ධ පෙරකිරිය යි. **සතගුණයෙන්** - සිය ගුණයෙන්; **සහස්‍ර** - දහස්.

## 16. මහාතිස්ස තෙර වත.

**වස් නො වැසූ කල්හි පටන්** – අනුසම්පන්න කාලයෙහි සිට; **අෂ්ට සමාපත්තිලාභී** – ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන, ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන සමාපත්ති අට ලැබූ; 'සමාපත්ති' යනු ධ්‍යානයෙන් සිත එකඟ කොට විසීම යි. **හසුන්** – ලියුම්, පණිවුඩ; **කෙනෙකුන්ද** – කෙනෙකුන් වහන්සේ; **දිවා ස්ථානයෙහි** – දහවල් වසන තැන්හි; **වත් දක්වා** – කළ යුතු වතාවත් කොට; **ලොවුතුරුබම්** – ලෝකෝත්තර ධර්මය; 'ලොවුතුරු බම්' යනු පඤ්චස්කන්ධ නමැති ලෝකයෙන් එතෙර වීමට ඉවහල් වන සෝවාන් ආදි මාර්ග සතර හා ලෝකයෙන් එතෙර වූ සෝවාන් ආදි ඵල සතර ද නිවණ ද යන නවය යි. **විතාළන** – ඇසූහ; 'විතාර – විතැරුම්හි' ධාතුවෙන් සිද්ධ ආඛ්‍යාත යි; **සමවත්සුව** – සමාපත්ති සුවය; ධ්‍යානයෙන් සිත එකඟ කොට විසීමෙන් ලබන නිරාමිස සුවය සමවත් සුවය යි; **නො බර ය යි** – බැරෑරුම් දෙයක් නො වේ ය යි; **දක්වන්නෑ** – දක්වනු මැනැව; **සුභ** – යහපත්; **අතෑවැසියා** – ශිෂ්‍යයා; **උක්කුම්බනයෙන්** – අඩදණින්; **සැහැල්ලු අසුබ කමටහනක්** – දශ අශුභ කර්මස්ථානයන් අතුරෙන් වැඩීමට පහසු කර්මස්ථානයක්; **සංස්කාරයන්** – හෙතු ප්‍රත්‍යය ධර්මයන් නිසා හටගත් රූපාදිධර්මයන්; **නික්මෙත් ම** – නික්මෙන කල්හි ම; **සඟතෙර** – සඞ්ඝස්ථවිර; ප්‍රධාන තෙරුන් වහන්සේ; **අශුභ** – අයහපත්; **පසක් කළ** – ප්‍රත්‍යක්ෂ කළ, අවබොධ කළ.

## 17. දෙමළ දොරටුපල් වත.

**දොරටු පාලයෙක්** – දොරටු පාලකයෙක්; දොරටුවෙහි මුර කරන්නෙක්; **දී** – දැයි, මිදුනු කිරි; **කල් ගාමකින්** – කල් ගත වීමෙන්; **ගිලන් වැ** – රොගී ව; **සොත් තැනින්** – ශයනය කළ ස්ථානයෙන්; **නැගී නො සිටිය ගෙන** – නැගී සිටින්ට නො හැකි; **නාමක් නසිව යි** – නො නසිව යි; 'නාමක්' යනු ප්‍රතිෂෙධාර්ථ නිපාත පදයකි. **සුහු වැ** – වහා; **ගෙදොර** – ගේ ඉදිරි පිට; **වැඩ සිටි කෙසෙක් නු?** – කවර හෙයින් වැඩ සිටියේක් ද? 'නු' යනු ප්‍රශ්නාර්ථ නිපාත යි. **අවසා** – රොගය පිළිබඳ කාලය හෝ තත්වය; **හෝ** – ඕ තොමෝ; **එලවා** – පමුණුවා; ඇතිකර; **මෙතෙක් පමණෑ යි** – මේ තිසරණය ගැණීම ම සෑහේ ය යි; **සවුමාරජයෙහි** – චාතුර්මහාරාජිකදිව්‍ය ලොකයෙහි; **'උපන්නම් වීම්'** – යනු උපන් නෙම් වීම්' යි ගත යුතු; **නිරා** – නරකයට.

## 18. වාතකාල වත.

**රාජනියෝගයෙන්**-රජහුගේ නියමයෙන්; **නො පොහොසත**-අසමර්ථය; **රජ්ජුරුවන් ගිවිස්වා** – රජුට අවබොධ කරවා හෝ පිළිගන්වා; **නො කිරුණු කඩක්** – නො ඉරුණු වස්ත්‍රයක්; **උළනු**-ඇඟ ඉලීමේ උපකරණ; **නානු** – නෑමේ දී ඇඟෙහි ගානා ද්‍රව්‍ය; **සුවඳ ගගා** – සුවඳ තවරා; **අනුලොමඥානති** - සෝවාන් මාර්ග ඥානය පහළ වීමට පෙරටු ව ඇතිවන අනුලොමඥානය; **හෙතුඵල දර්ශනයෙන්** 'සියලු සංස්කාර ප්‍රත්‍යයසමුත්පන්නය' යි උපදනා සම්‍යග් දෘෂ්ටිය; **වැලී** – නැවත; **දුශ්චරිතයෙහි** – වැරදි ක්‍රියාවන්හි.

## 19. මැදිඹු තෙරුන් වත

**මහාක්ෂීණාශ්‍රව** – කාමාදිආශ්‍රවධර්මයන් ක්ෂය කළ මහරහතන් වහන්සේ; **අකණ්** – 'අක' යනු ඉතා සුළු කාසියකි; **රූක්ෂබව** – රළු බව; **මඳ ඇසිල්ලක්** – ස්වල්ප වේලාවක්; **මස්තකප්‍රාප්ත** – මුදුන් පත්.

## 20. වෙහානික වත.

**එක්මවුන් දරු වූ**-එක් මවකගේ පුත්‍ර වූ; **බෑනන් වහන්සේ**-භ්‍රාතෘන් වහන්සේ;-**එකාසනිකයෙක්** - එක් අස්නක හිඳ වළඳීමේ ධුතාංගය රකින කෙනෙක්; **ධුතාංගය** – කෙලෙස් කම්පා කිරීමට ඉවහල් වන අංගය.

## 21. අනුරුත් තෙර වත

**පාචීනවංස මිගදායෙහි**– පාචීනවංස මිගදාය නැමැති වනයෙහි; **මහාපුරුෂවිතක්කයන්** – මහාපුරුෂයන්ගේ කල්පනා, 'මේ නව ලෝකොත්තරධර්මය අල්පෙච්ඡයාට මිස මහෙච්ඡයාට නො ලැබේ, නො සැපයේ ය' යි තැකීම, සන්තුෂ්ටයාට මිස අසන්තුෂ්ටයාට නො සැපයේ–, ප්‍රකෘෂ්ටවිවෙකයෙන් යුක්තයාට මිස විවෙක රහිතයාට නො සැපයේ–, ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තාට මිස කුසීතයාට නො සැපයේ–, එළඹ සිටි සිහි ඇත්තාට මිස මුළා වූ සිහි ඇත්තාට නො සැපයේ, එකඟ සිත් ඇත්තාට මිස විසුරුණු සිත් ඇත්තහුට නො සැපයේ–, ප්‍රාඥයාට මිස දුෂ්ප්‍රාඥයාට නො සැපයේ–, තෘෂ්ණාදීන් තොර වූ නිවණෙහි ඇලුම් ඇත්තහුට මිස නො එසේ වූවහුට නො සැපයේ ය' යි තැකීම යන මොහු මහාපුරුෂවිතක්කයෝ යි **තිලෝගුරු** – කාම රූප අරූප යන තුන් ලොවට ආචාර්‍ය්‍ය වූ.

## 22. සෝණතෙරවත

සඳකිළිගෙහි-බුදුන් වසන විහාරයෙහි; ලැසැ-මාසය කොට; හඬගෙන්නා-ඇදගන්නා; අභිව්‍යඤ්ජනයන්-අභි හා අක්ෂරයන්; පිරිවා-තවපාඩමින් කියා

## 23. දබ්බතෙරවත

එක්සිත් වූ-සමාන සිත් ඇත්තත් ව; අනාදර-නො සැලකිම; එකත්පස්හි-එක් පැත්තක; අයත කරමහ යි-කෙලවර කරමහ යි; හිණක්-ඉණිමගක්; බල දන්නාහු-සත්තිය දත්තෝ; සිත් ඇලෙන- සිතුම් රුචි වන; නිම්සෙය් ය-අමයන් විය. උතුරුකුරුදිවින්-උතුරුකුරුදිවයිනෙන්; "උතුරුකුරු" යනු හිමමෙරට උතුරු පැත්තෙහි වෙතැයි සැලකෙන මහාද්වීපයකි. මා පිළිබඳ ය-මට අයත්ය; හිණ හෙළුමෝ ද යි-ඉණිමග මම හෙළුවෙමු ද යි; කතිකාවක්-මෙය කටයුතු ය යි සම්මත කරගත් ව්‍යවස්ථාවක්; කුසල්මුල්-කුශලයන්ට මුල් වන අලෝභාදීහු; වාසු-පහසු, කරදර නැති; සුද්ධාවාසබ්‍රහ්මලෝකයෙහි-අනාගාමි අභිත් බ්‍රහ්මයන් වසන බඹලොවෙහි; බුද්ධාන්තරයක්-බුදුවරුන් වහන්සේලා දෙනමක් අතර කාලයක්; වන්නවෙහෙසෙන්-ගිනි වෙහෙසෙන්; උදරපටල-ආමාශය වසා පිහිටි සම්වැටිය; නුහන-වැටුනහ; මිත්තණියන්ට-මවගේ මවට; පැරිහරණ-චාරිකාවෙහි හැසිරෙණ; තෙල-අර, ඔය; තවපක්ෂවනනාමසමාසය - 'තව' යන්න පත්වනු කොට ඇති නාමවතක; තෙස ලෝම තව දහන තව' යන නාමවතක;

## 24. ගංගාතීරියතෙරවත

කටයුතු දන්නා මයෙහට-දැනුම්ඇති මහසට; අනුභව-වැළඳීම; ගෘහපති-ගෘහස්වාමියා; පක්ෂවසාම නම නො වැද්ද යැකි දෙයකැයි-පරකම නම නොපැමිණිය (=නොවිඳිය) හැකි දෙයක් ය යි; රූක්ෂප්‍රතිපත්ති-රළු (=පුරන්ට දුෂ්කර) පිළිපැදීම, මළවුන්ට කට යුතු ක්‍රියා කරන්නට-මළවුන් උදෙසා පැන් වත් කිරීමාදි කට යුතු කිරීමට; මුඩියක්-මුඛමක්, කෝප්පය වැනි භාජනයක්; තල්තිබලු තුණකින්-තල්පිති තුණකින්; කිරි ඇවිසිනි - කිරි බෙදත්තී; 'ඇවිසියි'යනු 'ඇවිස්-ඇවිසිමයි' ධාතුවෙන් සිද්ධ ආඛ්‍යාත යි. හනාවිකාර-අතීත කරණ සංඥ; බුනනියති-සහෝදරියති; එතෙක් ඇතැයි-එතෙමක් (වත්කල තරම) ඇත් ය යි.

## 25. ධම්මදින්නවත

පුදුන්-පුහුදුන්, පෘථග්ජන; ඔබ-උන්වහන්සේ; නො කල්හි-අකාලයෙහි; පැනයක්-ප්‍රශ්නයක්; පැකිලීමක්-හැපීමක්, බාධාවක්; විසඳූ-උත්තර දී; තීක්ෂ්ණය-තියුණුය; මෙතුම හැම හැවිරිදි කල්හි ය-මෙසින් හැටඅවුරුද්දකට පුජීයෙහිය; සමාධිජූවශ-ධ්‍යානයෙන් සිත එකඟ කිරීමෙන් ලබන සුවය; සම්බාධයෙන් බවල වූ-මුළු සිරුර ම පුදු වූ; සිඹුවන ලද-සිඹවන ලද; නගන ලද: ගශාධාන-සිය එලමින; කුඩෙවනාද-ඇතුන්ගේ නාදය; සිවුරු කන-සිවුරු කොණ; වහල් වම සි-පිහිට වෙම් යි; ඇන්වන පිශවරෙහි මෙනවන වර පා නැබීමෙහි ම; අතලොඹු-හසතාවලම්බනය; එල්ලී සිටිමට අසව ඉවහල් මන දෙය; පිළිසරණය.

## 26. ඌසසෙදවවත

එක්පස්හි-එක් පැත්තක; පහළා වූ-පැහැදුණා වූ; බුද්ධාලම්බනප්‍රීති-බුදුන් අරමුණු කොට පැමිණි ප්‍රීතිය; මාරතෙම-පරනිර්මිතවශවර්ති දිව්‍යලෝකයෙහි වෙසෙන කුශලයන්ට ප්‍රතිපක්ෂ ව දමරිකම් කරණ දිව්‍යපුත්‍රයෙක්;

චිත්තෛකාග්‍රතාවක්-සිතෙහි එකඟකමක්; සිත එක අරමුණක රැඳීමක්; මාලු-මහලු; වළඳාවක්-රැඳවීමක්; නො කොට 'හැක්කැ' යනු 'නො කළ හැක්කැ' යි ගුඩ කළ යුතු. එවැනි සවහනක්-එවැනි හැඩයක්, ආකාරයක්; ආත්මභාවයෙන්-ශරීරයෙන්; සරාග-රාග සහිත; සදෝෂ-ද්වේෂ සහිත; සමෝහ-මෝහ සහිත; සොබී-ශෝභමාන වෙයි; බුදුවෙස-බුද්ධවේශය; බුදුන්ගේ රූපාකාරය; ගන්වා-ගන්නට සලස්වා.

## 27. අන්‍යතර ස්ථවිරවත

වන්පිළිවෙත්-වත්තපටිවත්ත, කුඩු මහත් වතාවත්; පස්වස් කල්හි-උපසපන් වීමෙන් අවුරුදු පහක් ඇති කල්හි;

භික්ෂුභික්ෂුණී මාතෘකා ද්වය පුහුණු කොට-භික්ෂුප්‍රාතිමෝක්ෂය හා භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය ද පුහුණු කර; කර්මාකර්මවිනිශ්චය; කම් අකම් විනිශ්චය; ව්‍යක්තකම් හා අව්‍යක්ත අධර්මකර්මයන් පිළිබඳ විස්තරය; අනුදන්නා ලද-බුදුන් විසින් නියම කරණ ලද; අනුකූල-යෝග්‍ය, සුදුසු; මධ්‍යමයාමය-රාත්‍රියේ මැද යාමය; රාත්‍රියකට පැය තිසකි. එයින් හතරෙන් පංගුවක් හෙවත් හත් පැ විනාඩි තිහක් එක් යාමයකි. රාත්‍රියෙහි ඇත් යම් සන්නේ මුලින් හා අගින් ද හත් පැ විනාඩි තිහක් පසක් අත්හැරීමෙනි; ප්‍රමාද වූයේ-ප්‍රමාද වීමෙහි; හැඳ නගා-ඇඳ බැහැර

කොට; නිරාහාර වූ-ආහාර නැතිව; පහරිණ-පහර දෙත; සසහ; සත්‍රක නම් රූපාවකින්-බඹ ආයුධයකින් කපන්නාක් මෙන් වේදනා උපදවන ශස්ත්‍රක නමැති වාතරෝගයකින්; ආශ්‍රවක්ෂයට-කාමාදිආශ්‍රවධර්මයන් ක්ෂය කිරීමට; නිද්‍රාප්‍රබුද්ධයකු මෙන්-නිදා සිට පිබිදුනු තැනැත්තෙකු මෙන්; රන්තොරණක්-රණින් කළ තොරණක්; දෙව්දුනු-දිව්‍යාංගනාවෝ; තම්දක්වා-මෙතෙක්; බහතොණ්ඩි-පැමිදදෙණ්ඩි; මාගමක-ස්ත්‍රියක; පාංසුකූලිකභික්ෂු වන්නු මෙන්-පසුල්සිවුර දරණ භික්ෂුනමක් මෙන්; දුහුල-සිනිඳු වස්ත්‍රය; දසරූව-උරහිස; කායවිකාරයෙන්-කයෙහි වෙනස් කමින්; ශුද්ධදිව්‍යපුත්‍රයෙකු සී-මහණ නම් කොට උපන් දෙවියෙකු සී; අවසරය-අවසථාව ය, කාලය ය; දිවබෙර-දිව්‍යභෙරි; දෙවියන්ගේ බෙර; හර නො නගා-බෙල්ල නො උස්ස; ශරීරාවයව-ශරීරයෙහි කොටස්, කැමපතක්-කන්නාඩියක්; ජානුව-දණකැල්ල; තනතුරක්-ස්ථානාන්තරයක්, ධුරයක්; අඛණ්ඩශීලයෙන්-නො කැඩුනු සීලයෙන්;

## 28. බමුණු වත.

අවශ්‍යයෙන්-ඒකාන්තයෙන්; නො වරදවාම; මණ්ඩපයෙහි-මඩුවෙහි; මූදු කොලට-සමුද්‍රතීරයට; මුහුදු වෙරළට; මාවතුතොට-මන්තාරම වෙරළෙහි වූ නැව්තොටකි.

අනුක්‍රමයෙන් - පිළිවෙළින්; අහර සපයා - ආහාර පිළියෙල කොට; ගොප්මය දූඩි කොට - බත් කෙණ්ඩිය තද කොට; උස්-මිටි නොමත; ගුණසුවඳ- ශීලාදිගුණ නමැති සුගන්ධය.

## 29. කුදුතිස් තෙරවත.

මා වැන්ද යුතු-මා විසින් වැඳීමට සුදුසු; ආර්යයන් වහන්සේ-උත්තමයන් වහන්සේ; මාගිල්ලාගි උතුමා; කොසී අරණලයක් ද-කවර පෙදෙසක පවත්නා කෙනාමක් ද; දූන් මා මාළු වූ කිය කල්ණි රජයෙහි කර්මාන්තයෙන් සැලෙහු කිමි ද - මා මහලු ව සිටින මේ කාලයෙහි රජගෙහි කට යුතු මලින් තාපන වත්තේ කවර හෙයින් ද?

ගිරි-ඉරි, රේඛා; හස්තවිකාර - අතින් කරණ විකාර; ප්‍රසාද එළවීම - පැහැදවීම; නිරුපධිශේෂනිර්වාණධාතුවෙන් - උපාධි ශේෂයක් නැති නිවණින්; කුශලාකුශලකර්මානුබද්ධජාතිදුඃඛය නැමති ඇති නොමත යේ කෙලෙසයන් ප්‍රහීණ කළ රහතන් වහන්සේගේ පිරිනිවීම නිරුපධිශේෂනිර්වාණධාතු නම් වෙයි.

කූටාගාරයේ- කුළුගෙයෙහි; එක් කැණිමඬුල්ලක් යොදා සෑදූ මඩ ගෙය කූටාගාර නම් වේ. පලඟක්- පෑඩිකාවක්, ආසනයක්; ධජ- ධවජ, කොඩි; පතාකා- ත්‍රිකෝණාකාර කොඩි; වනකොල ලැහැප්මුළුල්ල- වනය, ගස් හා ශාඛාය, ලැහැබය යන සියල්ල; නො හැදහූහ- විශ්වාස නො කළහ; දකුණත් පස- දකුණත පාශ්වයෙහි; ගල්දාගැබ- ගලින් කළ දාගැබ; තලවච හා එක්වැ- අත්තිවාරමත් සමග එක්වී; කූටාගාරයෙක්හි- කූටාගාරයෙක්හි; විනයකර්ම - විනයෙහි නියම කළ පොහෝ පවුරණු ආදි ක්‍රියා; පූජා උපකරණ- පූජා ද්‍රව්‍ය; බමබමා- භ්‍රමණය වෙමින්; කරකැවෙමින්; මහාසොම්නසින්- මහත් සතුටින්; ආදාහනකාව්‍යය- ආදාහනය පිළිබඳ කවියුක්ත; මහවල-මහවනයෙහි; පෙළහර- ප්‍රාතිහාර්‍ය්‍ය; මනුෂ්‍යබලය ඉක්මවා කරණ ක්‍රියා; අසහායධවජයක් බඳු- එකම කොඩියක් වැනි.

## 30. ලදරු භික්ෂුවක.

දීඝවාපියෙහි- දිඝාමැව; මහාජාතකභාණක- මහාබෝධි සත්වයන්ගේ චරිත කටපාඩමෙන් කියන්නාවූ; දුරුත්තර- යැමට දුෂ්කර දුර මග; ඉඳුරා- සෘජුව, මනා සේ; හිස්වැ- හිස් ම, නිෂ්ඵල ම; සන්හිඳුමව සී- සනසම සී.

## 31. සභිය තෙරවත.

රන්දාගැබක්-රනින් කළ ධාතුගර්භයක්; චෛත්‍යයක්; සම්බුද්ධ ශ්‍රාවක- බුදුරජාණන් වහන්සේගේ හමුවෙහි පැවිදිව ලැබූ ශ්‍රාවක යන් මෙන්නේ; පසල්දනව්වට - ප්‍රත්‍යන්තජනපදයට; පිටිසර පෙදෙසට; වල්විහාරයෙකැ- අරණ්‍යසේනාසනයක; අතර ඛුරෙහි- අතරින් අතරෙහි; ගුණවිශේෂයක් - විශිෂ්ටගුණයක්, මාර්ගඵල ධර්මයක්; කාය ජීවිතදෙක්හි- ශරීරය හා ජීවත් වීම යන දෙකෙහි.

බිණිම පමණකුදු- කථා කිරීම පමණකුත්; ප්‍රපඤ්චය- ප්‍රමාද යි; පඤ්චාභිඥා- අහසින් ගමන් කිරීම ආදි ප්‍රාතිහාර්‍ය කරණ ඉද්ධිවිධඥානය, දුර පැවැති ශබ්දාදිය ශ්‍රවණය කරණ දිබ්බසෝත ඥානය, අනුන්ගේ සිත දැන ගන්නා පරචිත්තවිජානන ඥානය, පෙරජාතීන් සිහි කරණ පුබ්බනිවාසානුස්සති ඥානය, සත්වයන්ගේ චුති ආදිය දක්නා දිබ්බචක්ඛුඥානය යන විශිෂ්ටඥාන පස;

අභිසමාපත්ති – රූපාවචර ධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතර දැයි යන අට; පරිබ්‍රාජිකා කෙනෙකුන් – පිරිවැජියකගේ; සාසනු ගෙමා දූත-සාසනයන් සම්පූර්ණයෙන් ඉගෙණ; මහාවාදී වැ–මහාවාද කරන්නෙක් ව; විවාද-විරුද්ධ කථා; සබඳ-මිත්‍ර; සුද්ධාවාසබ්‍රහ්මනෙම – සුද්ධාවාසබ්‍රහ්මලෝකයෙහි වසන අනාගාමි බ්‍රහ්මයා; සමාපත්තියෙන්– සමවතින්; ධ්‍යානයෙන් සිත එකඟ කර ගෙණ විසීම සමාපත්තිය යි. සි– සිහි; ඇලුම් පියා– ඇලුම හැර; සහයන්– යනු 'සපථනක්'යි ශුද්ධ කළ යුතු. 'සපථය' නම් දම්පිරම යි.

## 32. මහාතිස්ස තෙර වත.

දිව්‍යකන්‍යාවක සෙයින් – දිව්‍යස්ත්‍රියක මෙන්; මනහර – සිත් ඇද ගන්නා, සිත්කලු; හැදීපැහැදී–හැරසී; 'පැහැදී' යනු මෙවන ශ්ලිෂ්ටතාව පිණිස යෙදූවකි. පිළිබඳ වූ සිත් ඇත්තී – බැඳුනු-ඇලුනු සිත් ඇත්තී; සිනාසිපුව – සිනාසුනාහ; අශුභසංඥා – අයහපත්ය යන හැඟීම; කුලදූවගේ–කුලකාන්තාවගේ; මිණගොස්සේ – පාරදීගේ; මඟවන–මඟපාරෙහි; ඇමෙන–ඇවයන් ය.

## 33. සක්පල් තෙර වත.

වස් එළඹෙන දවස්-වස් වසන දිනයෙහි; වණ්ණා – රූපවර්ණ; ආරාධනය-සතුටු කිරීම; ඉරියව්වකින්-පැවැත්මකින්; පිට දින් නොමට නො පියම්-පිට දිග නො හරිමි; ඇඳන මැතිර නො ගණිම්; අනවරතයෙන්-නිතර; ඇසෑ-ඇසෙහි; පැන්දහර-දියපාර; දිය දහර – ජලධාරාව, සඳුළු; වැහෙන්නට – මැඟිරෙන්නට; ගබඩාමට-කාමරයට; සිඟාවඩනා වේලෙහි-පිඬු පිණිස හැසිරෙන කාලයෙහි; කල් – කාලය.

පහරණේ – පහර දෙන්නේ, පෙළන්නේ; පවරණ-පැවරීම; බිහට-බිහුව; තව ඇසෑ රූජාව ඇද්දසි – තවමත් ඇසෙහි පීඩාව පැ: තිදසි; වැඩෑහෙම් – යහපත නොමැ; මිතු – පමණක්; නොහොත් – නැතහොත්; යැපෙන කල්හි – පවත්නා කල්හි; මනාපුණිය කොට-විචාරා; සරජකාය-ශුක්‍රශෝණිත ධාතූන්ගේ සංයෝගයෙන් හටගත් ශරීරය; සසරවට-සංසාර ව්‍යාපාරය; සංසාර චක්‍රය; සුවගස් ගණන් – ලක්ෂගණන්; සුපුරුද්දෙහි – පුරුදු කුඩු යෙහි, නො ගෙවිනා ලදුයෙහි; අතෑ වස්-වස්කාලය ඇතුලතෙ; පිට,

නොපෑරවමි - පිට නො යස්වමි; ඉටනලද-අධිෂ්ඨාන කරණ ලදි; ඝූතකායගට-සතරමහාභූතයන් නිසා හටගත් ශරීරයට; නියෝගය-නියමය; සැපයක් - සත්ප්‍රායයක්; හිතවත් දෙයක්; සුදුසු පිළියමක්; නහමක් හරව-නො හරව, පසු පෙරමු නොමැ-එකවිට;

## 34. මලියදෙව වත.

තාම්‍රපර්ණිද්වීපයෙහි-ලක්දිව; පැන් සතගත්‍ පිණ්ඩ-චතුර කැමට; පිළිසඳර කථා - පරිසන්ථාර කථාව; වෙහෙස සන්සිඳුවන සැපදුක් විචාරීම් ආදි කථාව; මු-මෝහු; නමුමු-(නම් + හු) නමැත්තහු; නමිමි-නමැත්තේ වෙමි; නො පහල-සපශී නො කෙළේ; හිර ගලහෙන වේලෙහි-හිරු බැස යන වේලෙහි, සවස් කාලයෙහි; කඩ ගැහුහ-කාලඝෝෂා කළහ; ආරාධනා කළහ; 'ඡඡක්ක' සූත්‍රය මජ්ඣිමනිකායෙහි සළායතන වර්ගයෙහි පෙණේ. අනනයෙහි-අවසානයෙහි; මතුමාලෙහි-උඩමාලෙහි, උඩතට්ටුවෙහි.

## 35. මහාතිස්සභූති වත

කෙලෙසුන් ඔබා- කෙලශයන් යටපත් කොට; ස්වප්නයෙහි-සිහිනෙහි; ලැහැබකම - වනගොමුවකට; අතුම - අතුරා; අතුර - ඇතිරීමෙහි ධාතුවෙන් සිද්ධ පූර්වක්‍රියා පදයකි.

## 36 දීඝභාණක අභය තෙරවත

චතුර්විධ ප්‍රත්‍යය සන්තොෂභාවනාවෙහි - චීවරාදී සිවුපසය පිළිබඳ යථාලාභ, යථාබල, යථාසාරුප්‍ය වශයෙන් සතුටු වීම වැඩිමෙහි; මහාආර්ය වංශප්‍රතිපත්ති - බුද්ධාදී ආර්යයන්ගේ අන්වය වූ චීවරාදිප්‍රත්‍යයන් ලද පමණින් සතුටු වීමෙ පිළිවෙත වන යථාලාභසන්තොෂය හා භාවනාරාමතාව; ලාභසත්කාරය - ලාභය හා සැලකිල්ල; ගව්වක්- රියන් 11200 ක දුරක්; කැපිවැ- එක්වැ; මට සාමාන්‍ය බැරිබව මුත් සෙසුයන්ට බැරි නො වෙයි - ඉවසීම මට බැරි වුවත් අන්‍යයන්ට බැරි නො වෙයි. ඉවසීම උන්වහන්සේට බැරි වූයේ ඒ ගැණ සිතන්ට ඉඩක් නුවූ හෙයිනි. උන්වහන්සේගේ සිත පුරුදු කමටහන්හි ම බැඳී පැවැත්තේ ය. පියවරක් නගන කල්- පාදය ඔසවන තරම් කාලයක්.

## 37. පධානිය තෙරවත

**පහල**- පහර දුන්නේ ය; හවගත; **ඈත් මෑත්**- ඒ මේ අත; **සිගාවලදන**- පිණ්ඩ චරියාවෙන් වැලඳීම කරණ, පිණ්ඩපාතිකාඞ්ගය රකිත; **නිශ්චල වෑ**- සෙලවුමක් නැති ව; **රුජාව පැහැර**- රුදුව වැද; **නාකිය**- පෙතනිය; **සිගලග**- මුළු සිරුර.

## 38. සූවිසි දහස් තෙරුන් වත

**බැමිණිතියාසායෙහි** - බැමිණිටියා නම් දුර්භික්ෂසමයෙහි; දඹදිව සාගලපුරාධීශ්වර මිලිඳුරජ එක් ස්ත්‍රියක් කෙරෙහි ලොභ කොට ඇගේ ස්වාමිපුරුෂයා වන බමුණා මැරවී ය. මෙයින් ශොක යට පත් බැමිණිය සාප කළා ය. එයින් දොළොස්වසක් වැසි නැති විය එකල පැවැති දුර්භික්ෂය 'බැමිණිටියාසාය' නමින් හඳුන්වති. මේ දුර්භික්ෂය ලක්දිව්හි ද පතළ බව මේ කථාවස්තුව හෙළි කර යි. ලක්දිව 'චොරනාග' රජ්ජසමයෙහි මෙය වී ය යි කියති. **තොමහා**- වී පොතු; **නදීතොටැ**- ගංතෙර; **දන්වැට**- දනවානතිය, දනොපකරණ; **ඔබ ගොජ්** - එහි ගොජ්; **සාය**- දුර්භික්ෂය.

## 39. තිස්දෙනෙකුන්ගේ වත.

**වල්මගින්** - වනමාර්ගයෙන්; කැලෑපාරෙන්; **ජේතෙන්සි**- ජේතන; **ගිණකබ**- ඉහෙහි ඇඳි වස්ත්‍ර; **රැඳින**- රැඳී සිටියේ ය; **මයිලණුවෝ**- මාමා; **කිනම්බු ද**- කිනම්නු ද, කවර නමක් ඇත්ත හු ද; **ඉඹුරා**- යහපත් ලෙස; **මැදයේ**- ඉදිරියේ; **වෙහෙසන්නට**- විගිළු කරන්නට; **මහරඩි**-මහත්වූ සාධිය; **සන්වල**- වනවාටය; සූයසීයාගේ ආලෝකය හෝ ආකර්ෂණය පවත්නා ප්‍රදෙශය; **දිව ඇසින්**- දිව්‍යචක්ෂුසින්; 'දිව්‍යචක්ෂුස' යනු දෙවියන්ගේ ඇස වැනි, ඈත පිහිටි සියුම් දේ පවා දක්ක හැකි, පිත්තශ්ලෙෂ්මාදියෙන් පීඩිත නුවූ ධාතුබලයෙන් නිපන් විශිෂ්ටඥානයකි. මෙය ඇත්තේ අභිඥලාභීන්ට ය. **පිරිමැද්දෙමි**- අත ගැවෙමි; **දෙපල් ලම**- පතුල්දෙකට

## 40. එක්සරා තෙර වත

**කිසමුවාපසවැකි**- මූත්‍රා අගුව් නැවරී; **දුක් නියා ය යි**- දුක්බවනැ යි; **දිවසැපත්**- දිව්‍යසම්පත්තිය; **සිබ්ණේවිකා**- ශික්ෂාව අත්හැර දමා; අධිසීලයෙන් ඉවත් ව.

## 41. මහාඵුසස වත.

**ගතපච්චාගතිකවත්** - යන නැවත පෙරළා එන භික්ෂූන් විසින් පුරණ වත; යන විට යම්තැනක සිට කමටහන මෙනෙහි කරන්ට නො හැකි වුවොත් නැවත ආපසු එතැනට අවුත් කමට හන මෙනෙහි කරමින් යන භික්ෂූහුගේ වත; **ඉතාමංමුළා ගිණ ගෙද ගෝ** -මග ඉතාමත් මුළා වූ අයුරු ද; **සඳහන්** - සිහි; මතක; **දෙවිදු** - දිව්‍යාඞ්ගනාව; **අත් පා මෙහෙවර** - අතින් හා පයින් කරණ වැඩ; 'පයින් කරණ වැඩ' නම් පණිවුඩ පණත් ගෙණ යැම යි.

## 42. අන්‍යතර ස්ථවිර වත

**හැකිල වූයේ** - හැමූයේ; **අතපය දික් කොට වත් වක් කොට වත් නොලූ විරිම්** - අත් හා පා දික් කිරීමක් හෝ හැකිල වීමක් හෝ පෙර නො කෙළෙමි; **බැණ බැණ** - කථා කරමින්;

## 44. පංසුකූලික තෙර වත.

**ලැගිඅග** - නැවතුනහ; **සමු ගෙණැ** - අවසර ගෙණ; **වැලකැ** - නැවතී; **පැන** - ප්‍රශ්න; **පෙරෙවැ දමා පූ කඩ** - පොරොවා දමන ලද වස්ත්‍රය; **තිඹක්** - ද්‍රෝණයක්, ලාස් සතරක්; **අචින්ත්‍ය වූ** - සිතිය නො හැකි වූ; **තුන් මග තුන් පලයට** - සෝවාන් සකෘදාගාමි අනාගාමි යන මාර්ගයින් තුණට හා එහි ඵලයින් තුණට; **භක්තියෙන්** - ආදරයෙන්

## 45. මහානාග තෙර වත

**ආසනශාලායෙහි** - අසුන්හලෙහි, භොජනශාලාවෙහි; **නිරොධසමාපත්තියට** - චිත්ත නිරොධයට පැමිණවීමේ සමවතට; අනාගාමීහු හා රහත්හු ද ඉහාත්මභාවයෙහි නිවන්සුව විඳිනු සඳහා නිරොධ සමාපත්තියට සමවදිති **ගොජ් නගාලූ රන්පිළිම යක් සේ** - ඔප දමූ රණින් කල ප්‍රතිමාවක් මෙන්; **සිසාරා** - වට කොට; **පිරිබඩ ගෙණ** - ගොම මැටි ගැම් ආදිය කොට; **සාදී කොට නිශම කල කල්හි** - නිරොධසමාපත්තියට සමවැදීමට ප්‍රථම 'මෙතරම් කලකින් සමවතින් නැගිටිමි' යි සිතිටුහන් කල කාලයෙහි; **මම ප්‍රකට වීම**- මම ප්‍රසිද්ධ වීම; **ප්‍රියඞ්ගුද්වීපයට**-පුවඟු දිවයිනට

## 46. රාධ තෙර වත.

**ආචාර්යෝපාධ්‍යායයන්** – ධර්මශාස්ත්‍රයන් උගන්වන ආචාර්යයන් වහන්සේගේ හා අවවාද අනුශාසනා දෙන උපාධ්‍යායයන් වහන්සේගේ; **පසුවස් වැස** – පසු වස් විසීම කොට; නිකිනි අව පෑලවි දිනයෙහි එළඹෙන වස පසුවස යි.

**සඟසරණ ගැටපදවිවරණය නිමි.**

පුස්තකාලය